ISSN 1391 - 1031
2018 නොවැම්බර්
24 වෙළුම 07 කලාපය
ආධාරය රු 40/=


# නියමුවා


ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


"සූරාකනු ලබන සහ පීඩිත ජනතාව තමන්ට පැරණි ක්‍රමයට ජීවත්විය නොහැකි බව අවබෝධ කරගැනීම සහ වෙනස් කිරීම ඉල්ලීම විප්ලවයක් සිදුවීම සඳහා ප්‍රමාණවත් නොවේ. විප්ලවයක් සිදුවීම සඳහා සූරාකන්නන්ට පැරණි ක්‍රමයෙන් ජීවත්වීමට සහ පාලනය කිරීමට නොහැකි තත්වයක් ඇතිවීම අත්‍යාවශ්‍යය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**10වැනි වෙළුම,**
**204 පිටුව**

# ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ජනතා බලයක් ගොඩනගමු

**විධායක ජනාධිපතිවරයා විසින් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා අග්‍රාමාත්‍ය ධුරයට පත්කරනු ලැබීමත් පාර්ලිමේන්තුව වාර අවසාන කිරීමක් සිදුකර කල් දැමීමත් හේතුවෙන් රටේ දේශපාලනයේ බරපතළ ගැටලුකාරී තත්වයක් පැන නැගී ඇති අතර අරාජික තත්වයක් නිර්මාණය කිරීමටද හේතු වී තිබේ.**

මෙම පියවර හුදු විධායක ජනාධිපතිවරයාගේ අත්තනෝමතිකභාවය නැවත වරක් රට හමුවේ ප්‍රදර්ශනය කිරීමක් වූවවා පමණක් නොව මෛත්‍රී-රනිල්-මහින්ද යන එකම කඳවුරේ නායකයින් අතර වන බල අරගලය ජනතාව හමුවේ නග්න ලෙස අනාවරණය කර කරවූවකි. මේ වන විට රට තුළ උද්ගත වී තිබෙන දේශපාලන අර්බුදය මෙරට ජරාජීර්ණ දේශපාලන තත්වයේම දිගුවක් වන අතර පොදු ජනතාව මුහුණ දෙමින් සිටින පොදු අර්බුදයේම කොටසකි. කෙසේ වුවද පවත්නා බල පොරය මගින් රටේ පොදු ජනතාව මුහුණ දෙන ගැටලුවලට කිසිදු විසඳුමක් නොලැබෙන බව පැහැදිලිය.

ඇතිවී තිබෙන දේශපාලන අර්බුදයේ ප්‍රධාන ද්විත්ව පාර්ශ්වය බල පොරය වෙනුවෙන් සටන් වදිමින් සිටින අතර රටේ සාමාන්‍ය ජනතාව ඊට සම්බන්ධ කරගැනීමටද ඔවුන් එහි පාර්ශ්වකරුවන් කරගනිමින් එකිනෙකාට එරෙහිව උසිගැන්වීමටද උත්සාහ කරමින් සිටියි. පසුගියදා තෙල් සංස්ථා පරිශ්‍රයේදී අවාසනාවන්ත ලෙස ජීවිත දෙකක් අහිමි වන්නේද මෙම තත්වය තුළය.

රට තුළ වර්ධනය වෙමින් පවතින අර්බුදකාරී දේශපාලන වාතාවරණය කිසිසේත්ම රටටත් රටේ ජනතාවටත් හිතකර නොවන අතර විශේෂයෙන්ම රටට එරෙහි විදේශීය බලවේගයන්ටද ඇති වෙමින් තිබෙන්නා වූ තත්වය අනියමින් වාසි සලසයි.

ඇති වී තිබෙන තත්වය පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ප්‍රකාශ කළේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් රැකදීමටත් බලලෝභී නායකයින් විසින් පාවා දෙන ලද ජනතාවගේ බලාපොරොත්තු ඉටුකිරීමටත් සූදානම් එකම දේශපාලන බලවේගය ජනතා විමුක්ති පෙරමුණ බවය.

මේ වන ඇති වී තිබෙන බල සූදුවට කිසිසේත් සම්බන්ධ නොවන බව අවධාරණය කළ විජිත හේරත් සහෝදරයා, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කෙරෙන ජනතාවාදී පාලනයක්



2018 නොවැම්බර් 01 නුගේගොඩ ආනන්ද සමරකෝන් එළිමහන් රංග පීඨයේදී

## ඉල් මහ මතක

අඳුරෙන් අඳුරටම
පෙම් බැඳ
අඳුර අතරේ
සැඟව යෑමම
ජීවිතය යැයි සිතූ
දන වෙත
ජීවිතය නම් මෙය
නොවේ යැයි
කියාදුන්නේ නුඹය
එදවස


නොනැවතී ඒ
පැතුම අභියස
දස දහස් ගණනින්
පෙරටු කොට
ඒ විසල් ලොව දිසානතියට
අප අවදි කළ
තරුව නුඹමය

මිනිස් යායක
සොඳුරු බිමකට
විශ්වීය මානව බැඳීමක
සැබෑ වන
හීනයක පැතුමක
සම බිමක ඇරඹුමද
නුඹ මය

ඉල් මහේ එන
මතක කඳුලක
දැවට නුඹ පරපුරේ උණුහුම
දහරියෙන් අපි
ගොඩනගන්නම්
නව ලොවක නුඹ
පැතූ අරමුණ


29 වැනි ඉල් මහ විරු සමරුව වෙනුවෙනි...

**05 පුපුරා ගිය දේශපාලන...**



මේ කුමන්ත්‍රණකාරී කල්ලි පසුපස දේශපාලන අන්ධභාවයෙන් යුතුව දුවන, චාරයක් නැති ලුම්පන්...

**07 පුළුල් ජනතා ව්‍යාපාරයක්...**


ජනතා විමුක්ති පෙරමුණ එකතු කරගත හැකි යහපත් පුද්ගලයින් සමඟ වමේ ව්‍යාපාරය සමඟ...

**09 සමාජවාදී රටක...**


සමාජවාදය තුළදී හැමවිටම ජාතික ආදායම සැලසුම් සහගත ලෙස ඉහළ දැමීමට රජය මැදිහත් වෙයි...

**11 ඉතිහාසය...**


තමන් ඉදිරිපිට නිර්මාණය වන ගැටලු සියල්ල විසඳා අවසන් වන දිනයක් ගැන සිතන්න. එදාට සිදුවන්නේ...


| | |
|---|---|
| සංවාදය | 03 |
| තරුණ | 04 |
| ආවර්ජනා | 06 |
| ජාත්‍යන්තර | 08 |
| කාන්තා | 10 |
| කාලීන | 12 |
| වේදිකාව | 13 |
| විශේෂාංග | 14 |


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# ගුරුසේවා සංගමයේ 20වැනි සමුළුව මුළුදෙයි




ලංකා ගුරු සේවා සංගමයේ 20වැනි වාර්ෂික සමුළුව පසුගියදා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් හා අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදක කමිටුවේ සාමාජික සහභාගිත්වයෙන් කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ, සභාපති ධම්මික අලහප්පෙරුම සහෝදරවරු ඇතුළු නිලධාරී මණ්ඩලයද සාමාජිකයෝ විශාල පිරිසක්ද මෙම සමුළුව සඳහා සහභාගි වී සිටියහ. මෙම සමුළුව ආරම්භයේදීම සංගමයේ සාමාජිකයින් විසින් "අධ්‍යාපනය වෙළඳ භාණ්ඩයක් නොවේ, සියලු දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කරනු, ගුරු විදුහල්පති වැටුප් වැඩිකරනු - මාස 30 ක හිඟ වැටුප් ගෙවනු" යන සටන් පාඨ සහිත උද්ඝෝෂණ පාගමනක් මහජන පුස්තකාල ශ්‍රවණාගාරය දක්වා පවත්වන ලදී.

# විදුලි සේවක සමුළුවට විශාල පිරිසක්



වැටුපෙන් බදු අය කිරීම වහා නවතනු! අර්ථ සාධක අරමුදල් කොල්ලය වහා නවතනු! වැඩකරන ජනතා බලයක් උදෙසා විදුලි සේවකයින් පෙළගස්වන ලංකා විදුලි සේවක සංගමයේ වාර්ෂික නියෝජිත මහ සමුළුව පසුගිය ඔක්තෝබර් 19වැනිදා පෙරවරුවේ කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාගේ හා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සමුළුව සඳහා ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රංජන් ජයලාල් සහෝදරයා ඇතුළු සියලු බලාගාර හා වැඩබිම් නියෝජනය කරමින් විදුලි සේවකයෝ විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

# අධ්‍යාපන සමුපකාරය කොල්ලකන්න ඉඩ දෙන්නේ නැහැ



බොරු චෝදනා 8ක් එල්ල කොට උසාවියට කරුණු වසන් කරමින් කුමන්ත්‍රණකාරී ලෙස අධ්‍යාපන සමුපකාරය පාලනය බිඳ දැමීමට කටයුතු කරමින් සිටින බවට ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා චෝදනා කරයි

අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවයේ නියුතු සාමාජිකයෙකු ඇතුළු සාමාජිකයින් 04 දෙනෙකු විසින් තහනම් නියෝගයක් අනුව අධ්‍යාපන සමුපකාරයේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු පසුගිය ඔක්. 12වැනිදා සිට අත්හිටුවා ඇති බවත් මේ හේතුවෙන් දීපව්‍යාප්තව පිහිටා ඇති එහි දිස්ත්‍රික් කාර්යාල 21ක සාමාජිකයින් 195,000කගේ සාමාජික සේවාවන් සම්පූර්ණයෙන් ඇනහිටී ඇති බවත් ඔහු මෙහිදී පැවසීය.

පසුගිය මහින්ද රාජපක්ෂ පාලන කාලයේදී පරිදිම කුමන්ත්‍රණකාරී ලෙස අධ්‍යාපන සමුපකාරයේ බලය අත්තනෝමතික අයුරින් බිඳ දැමීමටත් ඒ මගින් සමුපකාරයේ බිලියන ගණනක් වන සාමාජික මුදල් කොල්ලකෑමටත් උත්සාහයක් පවතින් බවත් ඔහු මෙහිදී පැවසීය. පසුගිය මහින්ද රාජපක්ෂ යුගයේදී ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමතිවරයා විසින් කුමන්ත්‍රණකාරී ලෙස අධ්‍යාපන සමුපකාරය තුළ අතුරු පාලක මණ්ඩලයක් පත්කරගෙන යමින් සාමාජික මුදල් කෝටි 5000ක් අහිමි කර ඇති බවත් එවැනිම තත්වයක් නැවත ඇතිකරලීම වර්තමාන ආණ්ඩුව කටයුතු සූදානම් කරමින් තිබෙන බවද මෙහිදී ඔහු පැවසීය.

මෙම කුමන්ත්‍රණයට එරෙහිව සියලු නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් එමෙන්ම අධ්‍යාපන සමුපකාරයේ 195,000ක් වන සියලු සාමාජිකයින් සමග මෙම කුමන්ත්‍රණයට එරෙහිව විරෝධය පළකරමින් පාරට බැසීමට සූදානම් බවත් මෙහිදී මහින්ද ජයසිංහ සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

# EPF කොල්ලය නවතනු - මංචි සේවකයෝ උද්ඝෝෂණයේ




පෞද්ගලික අංශයේ සේවක වැටුප් වැඩිකරන ලෙසත් ඇජ කොල්ලය නවතන ලෙසත් බලකරමින් අන්තර් සමාගම් සේවක සංගමය මගින් අරඹා ඇති විරෝධතා ව්‍යාපාරයට සමගාමීව පසුගියදා මංචි ආයතනයේ සේවකයෝ කොට්ටාව එම ආයතනය ඉදිරිපිට විරෝධතාවයක නියැළුණහ. ඔක්. 23 දින කොළඹදී පැවැත්වෙන දැවැන්ත විරෝධතාවය වෙනුවෙන් සේවකයින් පෙළගැස්වූ මෙම උද්ඝෝෂණය සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ජානක අධිකාරී සහෝදරයාද සහභාගි විය.

# එතෙරින්...

## සුනිල් හඳුන්නෙත්ති ඉතාලියේ ලාංකිකයන් හමුවෙයි




ජනතා විමුක්ති පෙරමුණ රට පුරා පවත්වන "රට හදන, රට රකින, ජනතාවාදී පාලනයක් උදෙසා" ජන හමු දසදහසට සමගාමීව ජ.වි.පෙ. විදෙස් කමිටු සහ බහුජන සංවිධාන විසින් ලොව පුරා එම තේමාව යටතේ සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කර තිබේ.

ඒ අනුව ඉතාලියේ පැවැත්වෙන එම සම්මන්ත්‍රණ මාලාව ආමන්ත්‍රණය කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී, 'එතෙර අපි' සංවිධානයේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා ඔක්. 21 ඉතාලියේ කතානියා නගරයේදී සහ ඉතාලියේ මෙස්සිනා නගරයේදී සම්මන්ත්‍රණ පවත්වන ලදී.

එම අවස්ථාවට ඉතාලියේ කොමියුනිස්ට් පක්ෂයේ නියෝජිතයින් ඇතුළු විශාල පිරිසක් සහභාගි වී සිටියහ.

## බිමල් රත්නායක ස්විස්ටර්ලන්තයේදී ශ්‍රී ලාංකිකයන් අමතයි




ජනතා විමුක්ති පෙරමුණේ ස්විට්සර්ලන්ත කමිටුව විසින් සංවිධානය කළ දේශපාලන සංවාදයක් ස්විස්සර්ලන්තයේ ආරාව නගරයේදී, එම පක්ෂයේ ජාතික සංවිධායක, පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයාගේ සහභාගිත්වයෙන් ඔක්. 21වැනිදා පැවැත්විණි.

"රට රකින, රට හදන, ජනතාවාදී පාලනයක්" යන තේමාවෙන් ජනතා විමුක්ති පෙරමුණ රට පුරා පවත්වන ජනහමු දස දහසට සමගාමීව ජවිපෙ විදෙස් කමිටු විසින් ඒ ඒ රටවලදී සංවිධානය කරන ජනහමු, සංවාද සහ සම්මන්ත්‍රණවලට සමගාමීව මෙම සංවාදයද පැවැත්විණි.

එහිදී ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන තත්වය පිළිබඳවත් ජනතා විමුක්ති පෙරමුණේ ඉදිරි දේශපාලන ක්‍රියාවලිය පිළිබඳවත් බිමල් රත්නායක සහෝදරයා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී.

## ජ.වි.පෙ. සහ ඉතාලි කොමියුනිස්ට් පක්ෂ නායකයින් අතර හමුවක්




ඉතාලියේ වෙසෙන ලාංකිකයන්ගේ සහ ජනතා විමුක්ති පෙරමුණේ ඉතාලි කමිටුවේ ආරාධනාවකට අනුව එරටට ගොස් සිටින ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා එරට ජාතික මට්ටමින් සංවිධානාත්මක ප්‍රධානතම කොමියුනිස්ට් පක්ෂය වන Partito Della Rifondazione Comunista පක්ෂයේ ආරාධනයක් මත විශේෂ සාකච්ඡාවකට එක්වී ඇත.

එම සාකච්ඡාවට ඉතාලියේ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් එහි ප්‍රධාන ලේකම් Maurizio Acerbo සහ ජාත්‍යන්තර කටයුතු ලේකම් Marco Consolo යන සහෝදරවරුන් එක්වී තිබේ.

Partito Della Rifondazione Comunista පක්ෂයේ මූලස්ථානයේදී පවත්වා ඇති එම හමුවේදී දෙරටේ වත්මන් දේශපාලන තත්වය පිළිබඳව, ලෝක දේශපාලන තත්වය පිළිබඳවත් පක්ෂ දෙකේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මෙන්ම විශේෂයෙන් පක්ෂ දෙක අතර සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් කර ගැනීම පිළිබඳව ඇතුළු බොහෝ කරුණු ගණනාවක් සාකච්ඡාවට බඳුන් කර ඇත.

එම අවස්ථාවට ඉතාලියේ ජ.වි.පෙ. සංවිධායක, ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික සුදත් අධිකාරි සහෝදරයාද එක්ව සිටියේය.

## ජ.වි.පෙ. නායකයා යුරෝපයේදී ශ්‍රී ලාංකිකයන් අමතයි




ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් ඔක්. 16 වැනිදා ඉතිලියේ වෙරෝනා හිදී "රට රකින, රට හදන, ජනතාවාදී පාලනයක්" සම්න්ත්‍රණය පැවත්විණි.

යුරෝපා රටවල වෙසෙන ලාංකිකයින්ගේ ආරාධනා අනුව අනුර දිසානායක සහෝදරයා පසුගිය දිනවල එම රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන් ඇමතීම සඳහා සංචාරයක නිරත වූ අතර වෙරෝනාහි පැවති මෙම සම්න්ත්‍රණය සඳහා එහි වෙසෙන ශ්‍රී ලාංකිකයෝ බොහෝ පිරිසක් එක්වී සිටියහ.

එම සම්මන්ත්‍රණයේදී ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන තත්වය සහ ජනතා විමුක්ති පෙරමුණේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව අනුර දිසානායක සහෝදරයා විසින් පැමිණ සිටි පිරිසට දීර්ඝ දේශනයක් පවත්වන ලදී.

ජනතා විමුක්ති පෙරමුණේ ඉතාලි කමිටුවේ වෙරෝනා සංවිධායක විසින් මෙම සම්මන්ත්‍රණ සංවිධානය කර තිබූ අතර අනුර දිසානායක සහෝදරයා මෙම සංචාරයේදී ඉතාලියට අමතරව ඔස්ට්‍රියාව, ස්වීඩනය සහ ඩෙන්මාර්ක් යන රටවල වෙසෙන ශ්‍රී ලාංකිකයන්ද ඇමතීය.

ස්වීඩනයේ පැවති මෙම සම්මන්ත්‍රණය සඳහා ස්වීඩන් කොමියුනිස්ට් පක්ෂයේ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම් ඔගස්ට් ඇලියොස්ට් මහතාද පැමිණ සිටි පිරිස ඇමතීය.

මෙම අවස්ථාවට ජනතා විමුක්ති පෙරමුණේ ක්‍රියාකාරී, 'එතෙර අපි' සංවිධානයේ ස්වීඩන් සභාපති, ස්වීඩනයේ ඔරෙබ්රෝ නගර සභා මන්ත්‍රී සුනිල් ජයසූරිය, ස්වීඩනයේ ජනතා විමුක්ති පෙරමුණේ සම්බන්ධිකාරක කුමාර ගිනිගත්ගල, ගෝතම්බර්ග් විශ්විද්‍යාලයේ ආචාර්ය උපාධිධාරි මංජුල ගුරුසිංහ, ගෘහ නිර්මාණ හා සැලසුම් ඉංජිනේරු අයෝෂානි වඳුරඹගේ සහ ඉස්කැනියාහි යාන්ත්‍රික ඉංජිනේරු, කටුබැද්ද විශ්වවිද්‍යාලයේ උපාධිධාරී ශානුක ප්‍රසන්න යන මහත්ම මහත්මීහුද එක්වී සිටියහ.

## ප්‍රජාතන්ත්‍රවාදය...

ස්ථාපිත කිරීමෙන් මෙපිට විසඳුම් නොමැති බව රටටත් ජනතාවටත් තේරුම් ගැනීමට දිගහැරෙමින් තිබෙන සිදුවීම් චුවමනාවත් වැඩි බව කියා සිටියේය.

"රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙනුත් වංචාවට දූෂණයට එරෙහිවත් වන ජනතා බලාපොරොත්තු ඉටුකිරීමට අපි සූදානම්. ඒ සඳහා වන පුළුල් ජනතා මධ්‍යස්ථානයක් ගොඩනැගීමට සහ ඊට දේශපාලන නායකත්වය ලබාදීමට ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි මැදිහත් වනවා. ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කෙරෙන ජනතාවාදී පාලනයක් වෙනුවෙන් මහ පාරේ සටනටත් පාර්ලිමේන්තුව ඇතුළු මහජන නියෝජිත ආයතන තුළ අරගලයටත් අපි සූදානම්. ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂපාතී, දූෂණ විරෝධී සියලු ජනතාවට අප සමඟ අත්වැල් බැඳගන්නා ලෙස ආරාධනා කරනවා" විජිත හේරත් සහෝදරයා වැඩිදුරටත් අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## මරා දැමිය නොහැකි ඉල් මහේ සත්‍යය

මෙතෙක් පැවතුණු සමාජයන්ගේ ඉතිහාසය (ලිඛිත ඉතිහාසය) වූ කලී පන්ති සටන්වල ඉතිහාසය යයි මාක්ස් -එංගල්ස් කොමියුනිස්ට් ප්‍රකාශනයේ ආරම්භයේදීම සඳහන් කළෝය. එම අදහස තවදුරටත් පැහැදිලි කළ ඔවුන් සඳහන් කළේ ඉතිහාසය තුළ පීඩක පංතිය හා පීඩිත පංතිය අතර අනවරත අරගලයක්, සටනක් තිබුණු බවය. එනම් වරෙක එළිමහනේ කළා වූද විටෙක සැඟවුණා වූද සටනක්, එක්කෝ සමාජය විප්ලවවාදී ලෙස වෙනස් කළ, නැතිනම් සටන්කරන පංතීන්ගේ පොදු විනාශයෙන් කෙළවර වූ සටනක් දිගටම පැවති බව ඔවුහු සඳහන් කළෝය.

රෝමයේ වහල් හිමියන්ගේ පාලනයට එරෙහිව වහලුන්ගේ කැරැල්ලේ සිට මේ දක්වාම මේ සටන විවිධ ආකාරයන්ගෙන් පවතින අතර වහල් කැරැල්ල පරාජය වී එහි නායක ස්පාටකස්ට දිවි පිදීමට සිදු වූ ලෙසම ඉතිහාසය පුරා බොහෝ අරගල පරාජය වී එහි නායකයන්ට දිවි පිදීමට සිදු වූ බව පැහැදිලි සත්‍යයකි. ස්පාටකස්ගේ පරාජය විසින් වහල් ක්‍රමය සදාකාලික කළේ නැත. පසුව වහල් ක්‍රමය බිඳවැටුණ අතර ස්පාටකස්ගේ අරගලය එහි පළමු වෙඩි මුරය විය. ඉතිහාසය එසේය. ලෙනින් රුසියාවේදී 1917 විප්ලවය ජයගත්තද 1905 දී පරාජය විය. ෆිදෙල් 1959 දී කියුබානු විප්ලවය ජයගත්තද 1953 මොන්කාඩා සටනේදී පරාජය විය. ලෝකයේ සියලු ජයග්‍රහණ සඳහා මාවත සකසා ඇත්තේ ඊට කලින් සිදුවූ පරාජය වීම්, පසුබැසීම් හා දිවිපිදීම්වල අත්දැකීම්ය.

අප මේ කරුණු සිහිපත් කළේ, 1989 නොවැම්බරයේදී හා ඒ ආසන්න කාල වකවානුවේදී මරා දැමුණු අපේ පක්ෂයේ නිර්මාතෘවර රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු දස දහස් ගණනක් වූ සටන් සගයින්ගේ සැමරුම් දිනය මෙම නොවැම්බර් 13වැනිදාට යෙදී තිබෙන නිසාම නොවේ. මේ අරගලය ගැන කිසිදු දැනුමක් නැති දේශපාලන නොදරුවන්ද ජ.වි.පෙ. හා බද්ධ වෛරයෙන් පෙළෙන එහි සතුරන්ද තමන් කළ මහා මිනිස් සංහාරය සාධාරණ කර ගැනීමට තවමත් ජ.වි.පෙ.ට දොස් කියන පාලක පංතියේ කණ්ඩායම්ද ඉල් මහේ දිවිපිදීමේ අර්ථය විකෘති කිරීමට හා ඊට හානි කිරීමට නිරන්තරයෙන් උත්සාහ ගනිමින් සිටින නිසාය.

ඉතිහාසයේ ගමන්මගේ අර්බුද කාලවලදී, ඉතිහාසය තියුණු නැම්මක් ගන්නා අවස්ථාවලදී, සමාජයම වෙනසක් ඉල්ලා සිටින අවස්ථාවලදී, රටකට ජනතාවට අනතුරක් විපතක් සිදුවන අවස්ථාවන්වලදී එහි නරඹන්නන් වීම, ප්‍රේක්ෂකයන් වීම හෝ නිරීක්ෂකයන් වීමට සැබෑ මිනිසුන්ට හැකියාවක් නැත. යුක්තිගරුක මිනිසුන් එහිදී සමාජ සංවර්ධනය වෙනුවෙන් සටන් කළ යුතුය. සමාජයේ ප්‍රගතියේ පැත්තේ සිට සටන් කළ යුතුය. ප්‍රතිඵලය කුමක් වුවත් එය ජයග්‍රහණය හෝ පරාජය වුවත් එය නොසලකා සටන් කළ යුතුය. ආත්මාර්ථකාමීත්වයෙන් තොරව කැපවීමෙන් සටන් කළ යුතුය. ඉල්මහේ දිවි පිදූවන් අපට විරුවන් වන්නේ එම අර්ථයෙනි. ඔවුහු ඉතිහාසයේ ප්‍රේක්ෂකයින් හා නිරීක්ෂකයින් වනවා වෙනුවට ඉතිහාසය ආපසු හැරවීම වැළැක්වීමට හා නව සමාජයක් නිර්මාණය කිරීමට දැනුවත්ව සටන් කළ අය වෙති. සියලු අඩුපාඩු දුර්වලතා අභිබවා ඔවුන්ගේ කීර්ති නාමය ප්‍රබල වන්නේ ඒ නිසාය.

ස්පාටකස් ඇතුළු පිරිස එදා සටන් කළේ නොමැරී සිටීමට නොව මියෙන තෙක් නිවහල්ව සිටීමටය. මන්ද වහල් ක්‍රමය ඔවුන්ගෙන් නිවහල්කම උදුරා ගෙන තිබූ නිසාය. වහල්කම පිළිගෙන ජීවත් වෙනවාට වඩා නිවහල් ජීවිතයක් වෙනුවෙන් සටන් කොට මිය යෑම උතුම් බව ඔවුහු විශ්වාස කළෝය. අපේ යුගයේ ධනවාදයට එරෙහිව සටන් කොට දිවි පිදූ සියලු වීරයෝද එවන් අයය. දණින් වැටී ජීවත් වනවාට වඩා දෙපයින් සිට මිය යෑම උතුම් බව ඔවුහුද විශ්වාස කළෝය; ඒ අනුව කටයුතුද කළෝය. ඉල්මහ විරුවෝ එවන් පිරිසකි.

තම පංතියට සංවිධානය වීමේ අයිතිය, තමන්ගේම දේශපාලනයක් කිරීමේ ශුද්ධ වූ අයිතිය ධනේශ්වර පාලනය විසින් අහුරා දමන විට, එය ධනපති නීතියෙන් තහනම් කරන විට, තමන් මත දිගුකාලීන මර්දනයක් පටවා ධනපති පංතිය ඉදිරියේ දණ ගසනු!යයි බල කරන විට, රට පාවාදෙන ගිවිසුම් අත්සන් කරන විට, ආක්‍රමණික හමුදාවකට රට තුළට ඒමට කැමැත්තෙන් ඉඩ දෙන විට, මානව හිමිකම්, මූලික මිනිස් අයිතීන් පවා අමු අමුවේ මරා දමන විට, ප්‍රජාතන්ත්‍රවාදය විහිළුවට ලක්කර, මැර හමුදා ලවා සාධාරණ මිනිසුන්ට පහර දෙන විට සාධාරණ ජනතා අරගල පොඩිපට්ටම් කර දමන විට ඒ දෙස නොබලා තමන්ගේ වැඩක් බලා ගැනීම නිවටකමක් ලෙස ඔවුහු සැලකූහ. අයුක්තියට අසාධාරණයට එරෙහිව තම පංතියේ අයිතිය වෙනුවෙන් සටන් නොකර සිටීම බියගුළුකමක් බව ඔවුහු දැඩිව විශ්වාස කළෝය. ඔවුන් සටන් කළේ ඒ නිසාය. ඔවුන් දිවි පිදුවේ ඒ අරමුණෙනි. ඔවුන් අපගේ පරමාදර්ශයන් වන්නේද ඒ නිසාය.

ඉතිහාසයේ එක් නිමේෂයකදී ඔවුන් අපෙන් උදුරා ගනු ලැබුවද, ඔවුන්ගේ අරගලය තාවකාලිකව පරාජය වුවද සටන නතර වී නැත. ඔවුන් සිය ලෙයින්, ජීවිතවලින් පණ පෙවූ ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාරය විනාශ වී නැත. එය වඩාත් සවිමත්ව, වඩ වඩාත් ජනතා ප්‍රසාදය ලබමින් ලාංකේය දේශපාලනයේ බලගතු දේශපාලන සාධකයක් බවට මේ මොහොතේදී පත්ව තිබේ. ධනපති පාලක කල්ලිවල අසාර්ථකත්වයන් හමුවේ, වංචා, දූෂණ හමුවේ, බල පෙරළි, කුමන්ත්‍රණ හමුවේ, ඉල්මහ විරුවන් පෝෂණය කළ දේශපාලන බලවේගය ඉන්ද්‍රඛීලයක් සේ රට තුළ ඉහළින්ම ක්‍රියාත්මක වෙමින් තිබේ. එහි රුව ගුණ නිතිපතා ජනතාව විසින් හඳුනාගනු ලබමින් තිබේ. ඉල්මහ විරුවන්ගේ සටන පරාජය වී නැති බව පැහැදිලි වන්නේ ඒ අනුවය.

දැන් දැන් ලංකාවේ දේශපාලනය පෙළගැසෙමින් තිබෙන්නේ ධනපති පාලක-කල්ලිවලට වාසිදායක අයුරින් නොව වමේ ව්‍යාපාරයට වාසිදායක අයුරිනි. ඉල්මහ විරුවන්ට ලබා දිය හැකි ඉහළම සැමරීම වන්නේ, ඔවුන්ගේ අවසන් බලාපොරොත්තුව වූ නව සමාජයක් බිහි කිරීමය. පාලක පංතියේ වර්තතමාන අර්බුදය නව සමාජයක් කැඳවාගෙන ඒම වෙනුවෙන් යොදා ගැනීමත් ඒ වෙනුවෙන් උපරිම කැපවීමෙන් කටයුතු කිරීමත් ඉල්මහ විරුවන් සැමරීම වෙනුවෙන් මේ මොහොතේ කළ හැකි ඉහළම කාර්යය වේ. අපි ඒ වෙනුවෙන් කැපවෙමු!

# ජනතාවාදී පාලනයක් ගොඩනැගීම සඳහා මේ හොඳම අවස්ථාවයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**

***නියමුවා:- මේ වෙලාවේ රටේ විශාල දේශපාලන අර්බුදයක් මතුවෙලා තිබෙනවා. ඔබ කොහොමද මේ තත්වය දකින්නෙ?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේක පැහැදිලිවම අපේ රටේ ධනේශ්වර දේශපාලන කණ්ඩායම්වල හා නායකයින්ගේ බලලෝභය විසින් ඇතිකරපු එකක්. නැතිව මේක රට ගැන හරි, ජනතාව ගැන හරි හිතලා කරපු දෙයක් නෙවෙයි. වත්මන් ජනාධිපති මෛත්‍රිපාල නායකයෙක් ලෙස දේශපාලනිකව බංකොලොත් වෙලා ඉන්නෙ. ඔහුට ලැබුණ ඡන්ද ලක්ෂ 62 තවදුරටත් නැහැ. ඒ වගේම සන්ධානයේ ඡන්දත් ඔහුට නැහැ. ඒ නිසා මේ දේශපාලන අනාථභාවයෙන් ගැලවෙන්න මඟක් ඔහුට අවශ්‍යයි. ඒ අනුව තමයි ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා, ප්‍රජාතන්ත්‍රවාදය හා දේශපාලන සදාචාරය පැත්තකට දාලා ඔහු මහින්දව අගමැතිකමට නම් කරන්නෙ. ඔහු කල්පනා කරනවා ඇති ඊළඟ ජනාධිපතිවරණයේදී මහින්දට බැරි නිසා සන්ධානයේ ජනාධිපති අපේක්ෂකයා වෙන්න.

ඒ වගේම මහින්දත් ඉන්නෙ අර්බුදයක. ඊළඟ ජනාධිපතිවරණය ඔහුට මාරාන්තික උගුලක්. ඔහුට ඉල්ලන්න බැහැ. ඒ වෙනුවට නොවැළක්විය හැකි ලෙස ගෝඨාභයට අපේක්ෂකත්වය දෙන්න වුණොත් ඉන්පසු මහින්දගේ හා නාමල්ගේ නායකත්වය අවසන් වෙනවා. ඒ නිසා මහින්ද කල්පනා කරන්නේ මේ දේශපාලන කුමන්ත්‍රණයට හවුල්වෙලා ඉක්මන් මහ මැතිවරණයකට අවශ්‍ය වටපිටාව හදාගැනීම විය හැකියි. ඒ නිසා මේ දේශපාලන කලබැගෑනිය තම තමන්ගේ බල අරමුණු වෙනුවෙන් පමණක් කරන එකක් බව පැහැදිලියි.

***නියමුවා:- මේ තත්වය තුළ ජනතා විමුක්ති පෙරමුණ ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග හා ඔබ පක්ෂයේ ස්ථාවරය කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේ සියලු කණ්ඩායම් එක කඳවුරක අය. එකම ප්‍රතිපත්තියක් තිබෙන අය. ඒ නිසා මේ සියලු දෙනාම පරාජය කිරීම සඳහා වන දේශපාලන බලයක් නිර්මාණය කිරීමත් ඊට ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වය දීමත් තමයි අපේ කාර්යභාරය. 2015 ජනවාරි 08 මහින්ද රාජපක්ෂගේ දූෂිත පවුල් පාලනය පැරදවීමට පොදුවේ පෙළගැසුණ ලක්ෂ 62ක් වූ ජනතාවගේ අභිලාෂය රනිල්-මෛත්‍රී නායකයෝ දෙන්නාම පාවාදුන්නා. පසුගිය අවුරුදු තුන පුරාම රනිල් තමන්ට ලැබුණ

> "පාලකයන් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය හා ධනේශ්වර දේශපාලන සදාචාරය පවා පැත්තක දාල බලය වෙනුවෙන් නිරුවතින් පොර කනවා. එහි ප්‍රේක්ෂකයන් හෝ නිරීක්ෂකයින් වීම අපේ කාර්ය නොවෙයි. මේ දුෂ්ට රැළ, හොර නඩ දෙක එක් කඳවුරක් සේ සලකා ඔවුන් පැරදවීම සඳහා ජනතාවගේ දේශපාලන කඳවුර නිර්මාණය කරමින් ඊට සක්‍රිය නායකත්වය ලබාදීම තමයි අපේ වගකීම."

ජනවරමට පටහැණිව වැඩ කළා. පසුගිය ආණ්ඩුවේ හොරු ආරක්ෂා කළා. මහ බැංකු බැඳුම්කර වංචාවට දායක වුණා. එහි හොරු රැක්කා. ආර්ථිකය විනාශ කළා. ජනතාවට බර පැටෙව්වා. රටේ සම්පත් වික්කා.

මෛත්‍රිපාලත් ඊට වරින්වර දායක වුණා. අන්තිමට පරාජය කරපු මහින්දටම අගමැතිකම දෙන්න තීරණය කරලා මෛත්‍රී ලක්ෂ 62ක ජනතා අභිලාෂය පාවා දුන්නා. අනෙක් අතට මහින්ද බලයට ඇති කෑදරකම වෙනුවෙන් ව්‍යවස්ථාව පවා නොසලකා මෛත්‍රී යටතේ අගමැතිකම බාරගත්තා. ඒ නිසා මේ සියලු දෙනාම දැන් ඉන්නෙ ජනතා විරෝධී කඳවුරේ. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණේ අපට පැහැදිලිවම ඉදිරි දැක්මක්, ඉදිරි ක්‍රියාමාර්ගයක් තිබෙනවා. ඒ තමයි 2015 ජනවාරි 08 ජන බලවේගයේ වුවමනාව නියෝජනය කරමින් ඊට නායකත්වය දීම. ප්‍රජාතන්ත්‍රවාදය, සමාජ සාධාරණත්වය, ජාතික සමගිය අපේක්ෂා කරන ජනතා බලවේගයට දැන් නායකත්වය දිය හැක්කේ අපට පමණයි. අපි ඒ කාර්යයට උරදෙනවා.

***නියමුවා:- මේ නොවැම්බර් 13ට ඔබේ පක්ෂයේ නිර්මාතෘවරයා ඇතුළු නායකයින් සාමාජිකයින් රට වෙනුවෙන් දිවිපුදා වසර 29ක් වෙනවා. මේ මොහොත ඔබ දකින්නේ කොහොමද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්. 29වැනි ඉල්මහ විරු සමරුව අපි අභියසට ඇවිත් තියෙන්නෙ රටේ විශාල දේශපාලන අර්බුදයක් තියෙන වෙලාවක. ධනපති සමාජ ක්‍රමය ගොඩ ගත නොහැකි ලෙස අර්බුදයට ගිහින් තිබෙන බවත් ඊට විසඳුම සමාජවාදය බවත් ඉල්මහේ දිවි පිදූ අපේ නායකයින් අපට උගන්වා තිබුණා. දැන් යළි යළිත් සිදුවීම් විසින් සනාථ වෙමින් තිබෙන්නෙ ඒ සත්‍යයම තමයි. ධනවාදය සමාජ ක්‍රමයක් ලෙස කොතරම් අර්බුදයට ගිහින් තියෙනවාද කියන කාරණය මේ දේශපාලන අර්බුද හා කුමන්ත්‍රණවලින් පෙන්නුම් කරනවා. දැන් තවදුරටත් පාලක පංතියට පැවති ක්‍රමයට, ඔවුන්ගේම ප්‍රජාතන්ත්‍රවාදයට, ඔවුන්ගේම ව්‍යවස්ථාවලට අනුව වැඩකරන්න බැරිවෙලා. පාලක පංතියේ අර්බුදය ඉතාම බරපතළ බවයි මින් පේන්නෙ. ඉතිං ඒ තත්වය ඉල්මහ විරුවන්ගේ බලාපොරොත්තු ඉටුකිරීමේ දිශාවට යොදාගැනීම තමයි අපේ වගකීම.

***නියමුවා:- 1988-1989 අරගලය පිළිබඳව සමාජය තුළ විවිධ මත තියෙනවා. තාමත් සමහරු මේ යුගය ගැන ජ.වි.පෙට දොස් කියනවා. මේ ගැන ඔබ කියන්නේ කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේ පිළිබඳව අපි පසුගිය කාලය පුරාම ඇති තරම් පැහැදිලි කිරීම් කරලා තියෙනවා. 88-89 ගැන නොදන්නා අය හා අපේ සතුරන්ගේ අවලාද අනුව සිතන අය තමයි අපට චෝදනා කරන්නෙ. 88-89 යුගය කියන්නේ ඉබේ ඇතිවූ, ඕපපාතිකව පහළ වූ දෙයක්වත් ජනතා විමුක්ති පෙරමුණේ හිතුවක්කාරකමක ප්‍රතිඵලයක්වත් නොවෙයි. මේක පැහැදිලිවම එවකට පැවති ධනේශ්වර පාලනයේ මර්දනයටත්, රට පාවාදීමේ දේශපාලනයටත් එරෙහිව දේශපාලනය තුළින් හා සමාජයෙන්

15 වැනි පිටුවට



# Yes We Can

## රැවටීමට නියමිතයි

2018 වසර නිමවීමට ඇත්තේ තවත් මාස දෙකක කාලයකි. වසරක් ගෙවුණාද කියා හිතන විටත් දැනෙන්නේ බියකි. ඒ වෙන කිසිවක් නිසා නොව වසරක් ගෙවී ගියද අපේ ජීවිත තිබුණු තැන්වලමය. ආපසු හැරීබලන විට ප්‍රශ්න ගොඩගැසී ඇත. ජීවිතයේ බලාපොරොත්තු බලාපොරොත්තුවලට පමණක් සීමා වී ජීවිතයේ බොහෝ කටයුතු ආපස්සට ඇද දමා ඇත.

'හුස්මගත් වසර තුනෙන්' එකක් වන 2018 දීත්, අනිත් වසර දෙකේදීම මෙන්ම තරුණ තරුණියන්ටනම් හුස්ම ගැනීමට ඉඩක් නොතිබුණි. ඒ යහපාලන ආණ්ඩුව කොල්ලො කෙල්ලන්ගේ හුස්ම හිරවන තරමටම අයවැයෙන් දුන් පොරොන්දු නිසාය. රැකියා දසලක්ෂය, රෙදැ අසසෙ, වොක්ස්වැගන් කාර්වලින් හුස්ම හිරවිය; අදහාගත නොහැකි විය. අදහාගත නොහැකි ලෙසම ඒවා බොරු පොරොන්දු පමණක්ම විය.

රෙදැ අසසෙ දෙන බවට පුරසාරම් දෙඩූ ඊනියා යහපාලනය විසින් දුරකථන හා අන්තර්ජාල ගාස්තු මත අසීමිත ලෙස බදු පැනවීය. රැකියා දසලක්ෂයක් දෙනවා කියූ ආණ්ඩුවට රැකියා දහදාහක්වත් දීමට නොහැකි විය. උපාධිධාරීන්ට රැකියා ඉල්ලා මහපාරේ ලැගීමට සිදුවිය. බාහිර උපාධිධාරීන්ට වෙනස්කොට සලකන චක්‍රලේඛ ගෙනවිත් තිබේ. රැකියා උත්පාදනය කිරීමට වොකස්වැගන් කාර් හදනවා කියූ පාලකයා මත්තල ඉන්දියාවට වික්කේය. සිංගප්පූරු - ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම අත්සන් කොට විරැකියාවේ දොරගුලු හැර දැමුවේය. ත්‍රීකුණාමල තෙල්ටැංකි විකිණීමට නියමිතය.

රටේ ආර්ථිකය බංකොලොත් වී දිනෙන් දින රුපියල අවප්‍රමාණය වන, රටේ වටිනා සම්පත් විකුණන, රටට ඉතාම අවාසිදායක ආර්ථික ගිවිසුම්වලට එලඹෙන, රාජ්‍ය සේවය පුද්ගලීකරණය කිරීමට යෝජනා ගෙන එන වටපිටාවන් තුළ, තරුණයින්ට දීමට ඇති පොරොන්දු මොනවාද? පොරොන්දුනම් දිය හැක. නමුත් ඒවා 2018 අයවැය මෙන්ම අකුරුවලට පමණක් සීමා වන ඒවාය. ඒ නිසා ඒමට නියමිත අයවැය තරුණ තරුණියන්ට දෙන බොරු පොරොන්දු ගොන්නක එකතුවක් වන බවට නොඅනුමානය. මෙවරද රැවටීමට නියමිතය.


මේ වසරේදීත් බොරු පොරොන්දුවලට රැවටී තරුණ ජීවිත මත් සාද, දිවිනසාගැනීම්, මිනීමැරුම්, මංකොල්ලකෑම් වැනි සමාජ අපචාරයන්ගේ ගොදුරු බවට පත්වීමට ඉඩ සලසා බලා සිටිනවාද නැතිනම් මේ ඊනියා යහපාලනය පලවා හරිනවාද යන්න තීරණය කළ යුතුව ඇත. කළ යුතුව ඇත්තේ මේ ඊනියා යම පාලනයත්, ජරාජීර්ණ ධනපති ක්‍රමයත් පළවා හැරීමයි. ඒ සඳහා තරුණ තරුණියන් ලෙස සංවිධානාත්මකව පෙළගැසිය යුතුය. සටන් කළ යුතුය. සටනින් තොර ජයග්‍රහණයක් නොමැත. සටන් කළ තැන ජයග්‍රහණ ඇත. ඒ වෙනුවෙන් එකතුවෙමු..! පෙළගැසෙමු..! සංවිධානය වෙමු..!




# සාර්ථක චේ දිනයකින් ඉක්බිති...



අධිරාජ්‍යවාදයේ මුර බල්ලන් විසින් චේ ගෙවාරා සහෝදරයා මරා දමා පසුගිය ඔක්තෝබර් 08 වැනි දිනට වසරක් 51ක් ඉක්ම ගොස් ඇත. 2008 සිට සෑම වසරකම සමාජවාදී තරුණ සංගමය විසින් "චේ දිනය" පවත්වනු ලබන්නේ ඔහු සැමරීම වෙනුවෙනි. මෙවරද චේ දිනය වෙනුවෙන් විවිධ වැඩසටහන් සංවිධානය කර තිබුණි." Che Medical Camp" නමින් වෛද්‍ය සායන දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක් තුළම පැවැත්වනු ලැබිණි. මෙවර චේ දිනයේ ප්‍රධාන වැඩසටහන් ලෙස ඔක්තෝබර් 08 වන දින මොරගහහේන, යහලකැලේ වත්තේ පිහිටි චේ උද්‍යානයේදී පුෂ්පෝපහාර දැක්වීමත් රැලිය හා සංකෘතික ප්‍රසංගය වෙන්නප්පුව උල්හිටියාව වෙරළ තීරයේදීත් පැවැත්වීමට සංවිධානය කර තිබුණි.





චේ උද්‍යානයේදී පැවැති පුෂ්පෝපහාර දැක්වීමේ අවස්ථාවට ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා සහ කියුබානු තානාපතිනි ජුවනා එලේනා රමෝස් මහත්මිය පැමිණි අතර ඔවුහු රැස්ව සිටි පිරිස ඇමතූහ. අරමුණ හා පිළිගැනීමේ කතාව සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා විසින් පැවැත්වනු ලැබීය. එම අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන අමරසිංහ සහෝදරයා සහ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාතික සංවිධායක ලක්මාල් දේවප්‍රිය සහෝදරයා සහභාගි වූහ.





මෙවර චේ දිනයේ ප්‍රධාන වැඩසටහන වෙන්නප්පුවේදී පැවැත් විණි. අහයහපත් කාලගුණික තත්වය නිසා වෙන්නප්පුව උල්හිටියාව වෙරළ තීරයේදී පැවැත්වීමට නියමිත වූ වැඩසටහන අවසන් මොහොතේදී වෙන්නප්පුව නගරයේ නිමාලි ශාලාවේ පැවැත්වීමට සිදු විය. එහිදි ආරාධිතයන් ලෙස ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ කියුබානු තානාපතිනි ජුවනා එලේනා රමෝස් මහත්මිය විසින් දේශන පැවැත් වූ අතර එරංග ගුණසේකර සහෝදරයා විසින් අරමුණු පැහැදිලි කරමින් අදහස් ප්‍රකාශ කළේය. සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජිකා නිපුණා සාරංගි සහෝදරිය පිළිගැනීමේ කථාව සිදු කළාය. එහිදී කියුබානු සහයෝගිතා බැනරයක් අත්සන් කළ අතර අවසානයේ සංගීත සන්ධ්‍යාවකින් වැඩටහන නිමාවට පත් විය.




හඬක් නැති
කිසිවෙක්
ලොව නැත
ඇත්තේ
සිතාමතා නිහඬවීමයි.
නැත්නම් කැමැත්තෙන්ම
නෑසුනාක්ව සිටීමයි.

--අරුන්දතී රෝයි--

## නන්නත්තාරේ සූත්තරේ

සතියක් පුරා
එක දිගට පත්තරේ
ටීවී චැනල් යූ ටියුබ්
ගෙවන හැම තප්පරේ
නෝනලා මහත්තුරු
ජපකරපු මන්තරේ
එකෙක්වත් හරිහැටි
නොකියපු සූත්තරේ..
පටළලා හිස් කබල්
ලිහෙන්නැති සාස්තරේ
මාසෙකට එක වරක්
පිරිමහන කෝන්තරේ
කලිසමේ සාක්කුව
දොයිතුවට හිස්කරේ
රොකට්ටුවෙ එල්ලිලා
තෙල් නගින විස්තරේ..
කියා දිය දැන්වත්
යකු නගින සූත්තරේ...

UPDATE

### පැයට කිලෝමීටර් 1100ක වේගවත් හයිපර්ලූපයක්




සුපිරි - අධි වේගවත් මගී ප්‍රවාහනය සඳහා යොදා ගත හැකි හයිපර්ලූප් මාදිලියේ ප්‍රථම කැප්සූලය පසුගියදා ස්පාඤ්ඤයේ කාඩිස්හිදී එළිදැක්වුණි. එය පැයට කිලෝමීටර් 1100කට ආසන්න වේගයකින් ධාවනය කරන බව එහි නිෂ්පාදකයා වන හයිපර්ලූප් ට්‍රාන්ස්පොටේෂන් ටෙක්නොලොජීස් සමාගම පවසයි. Quintro one ලෙස නම්කර ඇති මෙය දිගින් මීටර් 32 ක් හා ටොන් පහක බරකින් යුතු වන අතර ද්විත්ව ස්ථරයක් සහිත අමු ද්‍රව්‍ය යොදා ගනිමින් නිර්මාණය කර ඇත.

### ඇමරිකා එක්සත් ජනපදයේ ලිංගික අපයෝජන ඉහළට



සෑම තත්පර 98කට වරක් ඇමරිකානුවෙකු ලිංගික අඩත්තේට්ටම්වලට ලක්වන බව වාර්තා වේ. එරට කාන්තාවන් අතුරින් 6 දෙනෙකුගෙන් එක් අයෙකු සහ පිරිමින් 33 දෙනෙකුගෙන් එක් අයෙකු දූෂණයට හෝ ජීවිත තර්ජනවලට මුහුණ පෑමට සිදු වේ. සෑම වයස් සීමාවකම සිටින පුද්ගලයන් මෙලෙස අඩුවැඩි වශයෙන් ගොදුරු වන අතර එරට විශ්වවිද්‍යාල තුළ වයස අවුරුදු 18 - 34ත් අතර කාන්තාවන්ගෙන් 25% කුත් පිරිමින්ගෙන් 15%කුත් අධ්‍යාපන කාලසීමාව තුළ බලහත්කාර ලිංගික කටයුතුවලටද යොදා ගන්නා බව වාර්තා වේ.

### මළවුන්ට ප්‍රිය කළ "ඩොක්ටර් ඩෙත්"



ජර්මනියේ වෛද්‍ය විද්‍යාඥයෙකු වන ආචාර්ය ගන්තර් වොන් හගෙන්ස් හෙවත් ඩොක්ටර් ඩෙත් "ප්ලාස්ටිනේෂන්" තාක්ෂණය වෛද්‍ය විද්‍යාවට හා ලෝකයට හඳුන්වාදීමේ පේටන්ට් බලපත්‍රය 1982 දී හිමිකරගත් අයෙකි. ප්ලාස්ටිනේෂන් යනු මළ සිරුරුවල ඇති දේහ, තරල, මේද, පටක සහ වතුර ඉවත් කරමින් ඒ වෙනුවට සිලිකන් සහ පොලිමර් වැනි කෘතිම ද්‍රව්‍ය මගින් සියලුම සෛල පිරවීමයි. එමගින් මළ සිරුරේ තද බව නැති වී ඕනෑම ඉරියව්වකින් රඳවා තැබිය හැකිය. සුවකළ නොහැකි දරුණු පාකින්සන් රෝගයෙන් පෙළෙන මෙම වෛද්‍යවරයා ඉල්ලා ඇත්තේ තම මරණයෙන් පසු සිය ශරීරයය ද තමා සොයාගත් ප්ලාස්ටිනේෂන් තාක්ෂණය මගින් මූර්තිමත් කර ලෝකයාගේ ප්‍රදර්ශනය සඳහා තබන ලෙසය.


### දිගම මුහුදු පාලම චීනයෙන්



ලොව දිගම මුහුදු පාලම පසුගියදා විවෘත වූ අතර එය චීනයේ සිට හොංකොං සහ මැකාවු දක්වා මුහුද මැදින් ඉදි කර තිබිණි. මෙය සඳහා ඩොලර් බිලියන 20ක් පමණ වැය වූ බව පැවසේ. මෙය නම් කර තිබුණේ හොංකොං - සුහායි - මැකාවූ ලෙසිනි. දිගින් කිලෝමීටර 55 කින් යුත් මෙම පාලම රික්ටර් මාපක 8ක භූමිකම්පාවකටද ඔරොත්තු දීමේ හැකියාව පවතී. සුළි කුණාටු නෞකා ගැටීමෙන්ද හානි නොවන අතර මේ සඳහා යොදා ගෙන ඇති ලෝහවල ප්‍රමාණය ටොන් 400,000 කි.

# පුපුරා ගිය දේශපාලන අර්බුදය හා

# රටේ හෙට දවස




ශ්‍රී ලාංකේය දේශපාලනයේ මෑත ඉතිහාසයේ මතුවූ බරපතළම දේශපාලන අර්බුදය දැන් මතුව තිබේ. ඒ පසුගියදා ජනාධිපතිවරයා විසින් සිය බලය යොදා රනිල් වික්‍රමසිංහ අගමැතිකමෙන් ඉවත්කොට මහින්ද රාජපක්ෂ අගමැති කිරීමත් පාර්ලිමේන්තුව කල්තැබීමත් සමගය. පවතින ව්‍යවස්ථාවට අනුව මෙහි හරි වැරැද්ද විමසා බැලීමේ දැන් තේරුමක් නැත. ව්‍යවස්ථා හදන පාලකයන්ම තමන් අර්බුදයට ගියවිට ව්‍යාවස්ථාව උල්ලංඝනය කරන බවත් සමහර විට ව්‍යවස්ථා අත්හිටවීම පවා කරන බවත් ඉතිහාසසය ලොවට උගන්වා ඇත.

මෙය ප්‍රජාතන්ත්‍රවාදීද නැද්ද යන්නද විමසා බැලීමේද තේරුමක් නැත. වරක් ලෙනින් ඉතා පැහැදිලිව කියූ පරිදි ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය යනු කප්පාදු කරනු ලැබූ, සීමා කරනු ලැබූ, ව්‍යාජ හා කුහක එකකි. එය ධනපති කණ්ඩායම් සඳහාත් මෙසේ නම් නිර්ධන පංති ව්‍යාපාරයක් පිළිබඳ ප්‍රශ්නයේදී මොවුන් කෙලෙස කටයුතු කරනු ඇද්ද යන්න පමණක් සිතා ගැනීම ප්‍රමාණවත්ය.

මේ සිදුවීමත් සමග මෙතෙක් රෝගීව සිටි ධනේශ්වර දේශපාලනය එහි අවසානයට පැමිණ තිබේ. මෙම අර්බුදය තාවකාලිකව සමනය වුවද එය දිගටම පවතින බව සහතිකය. යළි යළි මතුවන බව පැහැදිලිය. ලංකාවේ ධනපති කණ්ඩායම් තුනම එනම් රනිල්, මෛත්‍රී හා මහින්ද යන කණ්ඩායම් තුනම දේශපාලන වශයෙන් දැන් බංකොලොත්වී අවසන්ය. අවම දේශපාලන සදාචාරයන් පවා පසෙකලා සිය සැබෑ නිරුවත පෙන්වීමට ඔවුන්ට සිදුව තිබේ. රජගෙදර කුමන්ත්‍රණ, පිල් මාරුකිරීම්, මුදලට හා තනතුරුවලට විකිණීම්, බලයෙන් මත්ව කරන ප්‍රචණ්ඩ හැසිරීම් ආදිය විසින්ද ජනවරම, ජනතා පරමාධිපත්‍ය වැනි සංකල්ප හිස් වදන් බවට පත්කරමින් ගන්නා දේශපාලන තීරණ විසින්ද මේ කල්ලිවල බල තණ්හාවේ තරමත්, ප්‍රතිපත්ති විරහිතකමත්, විලිලැජ්ජා නැතිකමත් ඇති තරම් ප්‍රදර්ශනය කර ඇත. වසර 70ක් තිස්සේ ඉගෙන ගැනීමට අසමත් වූ පාඩම්, අත්දැකීම් ජනතාවට දින කීපය තුළ උගත හැකිය. ජනතාව උගෙන ගන්නේ නැතිනම් ජනතාවට මේ සත්‍යය ඉගැන්විය යුතුය.

මෛත්‍රිපාල ජනාධිපතිවරයා තමන්ට බලය ලැබුණ දා සිටම කටයුතු කළේ ජන වරමේ අපේක්ෂාවන්ට අනුව නොව තම බල ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහාය. රනිල් වික්‍රමසිංහ මහතා කටයුතු කළේද එසේමය. මෛත්‍රී හා රනිල් අතර අතර බරපතළ විරසකයක් ඇතිවී මෛත්‍රී කෝප වූයේ ඒ නිසාය. මෛත්‍රි, රනිල් සමග කෝප වූයේ රනිල් ජනවරම නොරැක්ක නිසා නොව තම බල ව්‍යාපෘතියට බාධාවූ නිසාය. වරක් වහකදුරු වෙමින් සිටි මහින්ද මෛත්‍රිට හොඳ වූයේද තම බල ව්‍යාපෘතියට වෙන මඟක් නැති නිසාය. ඊළඟ ජනාධිපතිවරණයේදී එ.ජා.ප.ය වෙනමත් රාජපක්ෂ පිල වෙනමත් අපේක්ෂකයන් ඉදිරිපත් කළහොත් මෛත්‍රීට සිදුවන දේශපාලන පරාජය බරපතළය. මෛත්‍රී එවිට දේශපාලන අනාථයෙක් වේ. ඉන් මිදීමට ඇති මඟ මෛත්‍රී වහාම තම කඳවුර මාරුකොට මහින්දගේ කඳවුර සමග එකතු වීමය. ඊළඟ ජනාධිපති වරණයකදී මහින්දට තරඟකිරීමට නොහැකිවීමත්, මහින්ද ගෝඨාභයට දක්වන අකමැත්තත් මත තමන්ට අපේක්ෂකයා විය හැකි යයි මෛත්‍රී සිතන බව පෙනේ. මේ බල පෙරළි සියල්ල ඒ වෙනුවෙනි. එසේ නොමැතිව රට වෙනුවෙන් හෝ ජනතාව වෙනුවෙන් නොවේ. ඔහු තම පෞද්ගලික බල වුවමනාව වෙනුවෙන් පරදුවට තබා ඇත්තේ රට හා ජනතාවය.

මහින්ද රාජපක්ෂද සිටින්නේ අර්බුදයකය. ඊළඟ ජනාධිපතිවරණයේදී ඔහුට තරඟ කිරීමට නොහැක. ඒ වෙනුවට ගෝඨාභයට එම අවස්ථාව දීම තම දේශපාලනයේ අවසානය බව මහින්ද දනී. ඉන්පසු නාමල් රාජපක්ෂගේ අවස්ථාවද නැතිවේ. ඒ නිසා ජනාධිපතිවරණයට පෙර මහමැතිවරණයක් ගැනීම මහින්ද කණ්ඩායමේ වුවමනාව වී තිබේ. ඔහු තමන්ට අයත් නැති අගමැතිකමක් බාරගන්නේ මේ නිසාය. එය සාර්ථක වුවහොත් ඉන්පසු ඇතිවන අරාජිකතත්වය මත පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමකට එකඟකර ගත හැකියයි ඔහු සිතයි. අනෙක් අතට ටික කලකට බලය අතට ලැබේ. නඩු යට යාමද සිදුවේ. ඒවා අතුරු ඵලය. මහින්ද මෛත්‍රී සමග දීගෙට යන්නේ තමන්ගේම අරමුණු හිතේ තබාගෙනය. රට, ජනතාව, හෝ ප්‍රජාතන්ත්‍රවාදය එහිදී අදාළම නැත.

රජගෙදර සිදුවූ මේ දේශපාලන කුමන්ත්‍රණය මගින් පහසුවෙන් කුමන්ත්‍රණකරුවන්ට බලය තහවුරු කර ගැනීමට ඉඩ ලැබී නැත. මේ ලිපිය ලියන මොහොත වනවිට පාර්ලිමේන්තුව කල්තබා ඇත. එහි අදහස නම් මෛත්‍රි පිලට පාර්ලිමේන්තුවේ බහුතරය නැති බවය. දේශපාලන පැති මාරුවීම් එහෙට මෙහෙට පැනීම්, යාම් හා ඊම් දෙස බලන විටද පෙනෙන්නේ මෛත්‍රී - මහින්ද හවුලට පාර්ලිමේන්තුවේ බහුතරය ලබාගැනීම පහසු නැති බවය. එබැවින් මේ අර්බුදය ඉක්මනින් නිමාවන්නේ නැත. තව තවත් ප්‍රජාතන්ත්‍ර විරෝධී, ව්‍යවස්ථා විරෝධී ක්‍රියාමාර්ග හා කුමන්ත්‍රණ ඔස්සේ මෙය දිගට ඇදී යනු ඇත. මෙම අර්බුදය තුළ තාවකාලිකව කවුරු ජයගත්තත් කවුරු අගමැති වුවත් රට වැටී ඇති අගාධයෙන් ගොඩ ඒමට හැකිවන්නේ නැත. රට තව තවත් අගාධයටම වැටෙනු ඇත. සත්‍යය එයයි.

මෙහිදී විය හැකි දේවල් රැසක් තිබේ. තමන්ට බහුතරය නැති නම් පාර්ලිමේන්තුව නැවත කල් දැමීම පිළිබඳව මෛත්‍රී සිතීමට ඉඩ තිබේ. එහෙත් දැන් එය දුෂ්කරය. නැතිනම් පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්නා මහින්දගේ අගමැතිකම තහවුරු කර ගත යුතුවේ. දැන් තිබෙන තත්වය මත ඊට ඇති ඉඩ ඉතා සීමිතය. එසේත් නැතිනම් පාර්ලිමේන්තුවේ බහුතරය තමන්ට ඇති බව රනිල් විසින් පෙන්වනු ලැබ ඔහු නැවත අගමැති විය හැක. එවිට රනිල්ගේ පාලනය හා මෛත්‍රීගේ ජනාධිපතිකම අතර අවසන් නොවන ගැටුමක් මතුවීම වැළැක්විය නොහැක. එය කෙලෙස කෙළවර වේ දැයි දැන්ම කිව නොහැක.

> මේ කුමන්ත්‍රණකාරී කල්ලි පසුපස දේශපාලන අන්ධභාවයෙන් යුතුව දුවන, චාරයක් නැති ලුම්පන් වර්ගයේ සීමිත පිරිසක් හැර අන් සියල්ලෝ මේ ජරාජීර්ණ දේශපාලනය පිළිකුල් කරති; ප්‍රතික්ෂේප කරති. ඒ නිසා ඔවුන් වෙනුවෙන් දේශපාලන බලයක්, දේශපාලන ගමනක් අවශ්‍යය. එම දේශපාලන බලය ගොඩනැගීමේ නායකත්වය මේ මොහොතේ බාරගත හැක්කේත් බාරගත යුත්තේත් ජනතා විමුක්ති පෙරමුණය.

අනෙක් අතට රනිල් නැවත අගමැති වුවහොත් මහින්ද දේශපාලන වශයෙන් ලබන පරාජය බරපතළය. ඔහු දේශපාලනයේ දුර නොදකින විහිළුකාරයකුගේ තත්වයට වැටෙනු ඇත. දේශපාලනයේ උසුළු විසුළුවලට මුහුණ දීමට ඔහුට සිදුවේ. එලෙස ඔහු දුර්වල වන විට ගෝඨාභයගේ කල්ලිය යළි හිස ඔසවනු ඇත. ඒ නිසා මහින්දගේ දේශපාලන අනාගතයද අවිනිශ්චිතය.

යම් හෙයකින් රනිල් අගමැති වුවද ඔහුගේ පක්ෂයේ අභ්‍යන්තර අර්බුදය යළි මතුවිය හැකි අතර එ.ජා.ප. තුළ රනිල් විරෝධී කණ්ඩායම ප්‍රබල විය හැක. දැන් මේ 'විපත' තුළ කවුරුන් රනිල්ට උදව් කළද රනිල් අගමැති වූ විට ඔහුගේ පසුගිය පාලන ක්‍රියාකාරකම් ගැන, අන් අය නොසලකා වැඩකිරීම ගැන, කුස්සි කැබිනට්ටුව ගැන විවේචනය බරපතළ විය හැක. ඒ නිසා මේ අර්බුදයෙන් කිසිවෙකුටත් ගැලවීමක් නැත.

මේ තත්වය තුළ මෛත්‍රීපාලද තම දේශපාලන භූමිකාව අවසන් කරනු ඇති අතර ලංකාවේ දුර්වලම හා අපකීර්තිමත් ජනාධිපතිවරයා බවට ඔහු පත්වනු ඇත. තමන් වටා සිටින මන්ත්‍රීවරු පවා ඔහු අත්හැර යනු ඇත. සිදුවිය හැකි දේ එයය.

මේ තත්වය මත මහමැතිවරණයක් කලින් එයිද, නැතිනම් මෛත්‍රි ධුර කාලය නිමාවීමට වසරකට පෙර ජනාධිපතිවරණයකට යයිද යන්න කීම පහසු නොවේ. මීළඟට මෛත්‍රී සතුව ඇති තුරුම්පුව වන්නේ ඉක්මන් ජනාධිපතිවරණයකට යාමය. එහිදී ඔහු නැවත තරග කරනු ඇත. එහෙත් ඔහුට ජයගත හැකිද යන්න සැකසහිතය. එවැනි සැකසහිත තත්වයක් තුළ මෛත්‍රී තම ධුර කාලය නිමාවීමට පෙර පරාජය වීමට කැමති වේද යන්න සැක සහිතය.

මේ සියලු කරුණු සලකා බලන විට පෙනී යන්නේ, වර්තමානයේ නිර්මාණය වී ඇති පාලක පංතියේ දේශපාලන අර්බුදයට විසඳුමක් නැති බවය. එතරම්ම ධනවාදය අර්බුදයට ගොස් තිබේ. සෑම කළු වළාවකම රිදී රේඛාවක් ඇතැයි කියූ ලෙසම මෙම පාලක පංතියේ අර්බුදය තුළ ජයග්‍රහණයක සේයාද සැඟව තිබේ. ඒ වමේ හා ප්‍රගතිශීලී ව්‍යාපාරයන්ටය. වමේ හා ප්‍රගතිශීලී ව්‍යාපාරයක් ප්‍රබල

15 වැනි පිටුවට



"ජනතාව මෙම පාඩම ඉක්මණින් ග්‍රහණාය කරතිද, නැතහොත් , ඔවුහු කොතරම් ඉක්මණින් එය ක්‍රියාත්මක කරතිද යන්න අපි නොදනිමු. නමුත් මෙම පාඩමට අමතරව, නොවිසඳිය හැකි අවුලෙන් මිදීමේ වෙනත් මගක් නොමැති බවත් ප්‍රතිවිප්ලවවාදීන් දැක්විය හැකි චපලකම් හෝ මිලේච්ඡකම්වලින් හෝ කිසිම සෙතක් නොවන බවත් අපි මැනවින් දන්නෙමු. පොදු ජනතාව තමන්ගේ නායකයා වන නිර්ධන පංතිය කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීම හැර වෙනත් ගැලවීමේ මගක් නොමැත."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**158 පිටුව**

# ජ.වි.පෙ. වතු සටනට පණපොවයි




බටහිර ජාතීන්ගේ ආගමනයත් සමග මෙරට මත ස්ථාපිත වූ ධනවාදී ආර්ථිකය පවත්වා ගෙන යාම සඳහා යම් ආර්ථික ප්‍රතිසංස්කරණ සිදුවූ අතර විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයන්ගේ පැමිණීමත් සමග මෙරට වඩා හොඳින් ස්ථාපිත වූ තේ, කෝපි වගාවන් සඳහා ඉන්දියාවෙන් ජනයා ගෙන්වා ගැනීමටද ඔවුන් විසින් කටයුතු කරන ලදී.

වතු වගාවන් සඳහා ඉන්දියාවෙන් ගෙන්වන ලද ජනයා බ්‍රිතාන්‍ය පාලනය තුළ දැඩි සූරාකෑමකට ලක් වූ අතර බ්‍රිතාන්‍යන්ගේ එම පාලනයෙන් පසු බලය හිමි වූ ස්වදේශීය පාලකයන්ගෙන්ද ඔවුනට හිමි වූ වරප්‍රසාදයක් නොවීය. ඊනියා නිදහසින් පසු බලයට පත් එ.ජා.ප. ශ්‍රී.ල.නි.ප. මෙන්ම වතුකරයෙන් බිහිවූ ජාතිවාදය පදනම් කරගත් දේශපාලන පක්ෂවලින්ද වතු කම්කරු ජනයාගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා කිසිදු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවීය. බොහෝ විට සිදුවූයේ එම ජනයාගේ ඡන්ද ප්‍රමාණය කේවල් කරමින් වතුකරයේ දේශපාලන නියෝජිතයින් කිහිප දෙනෙකු ආණ්ඩු තුළට රිංගා තම සුබ විහරණය සලස්වා ගැනීම පමණි.

2016 වසරේ වැවිලි සමාගම් සහ වතුකරයේ ප්‍රධාන වෘත්තීය සමිති සමග අත්සන් කරන ලද සාමූහික ගිවිසුම 2018 ඔක්තොම්බර් මාසය වන විට අවසන් වුවද වතු සේවකයන් සඳහා නව වැටුපක් ඉදිරිපත් කිරීමට වතු හාම්පුතුන් විසින් මගහරිමින් සිටින අතර ඔවුන් සමග කේවල් කරමින් සිටින ප්‍රධාන වෘත්තීය සමිති දෙකද නව වැටුපක් ලබාදීම යන කාරණය මගහැර වැවිලි සමාගම් නියෝජිතයින්ගේ තීරණවලට එකග වෙමින් සිටියි. මෙවැනි තත්වයක් තුළ ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන නායකත්වය යටතේ ක්‍රියාත්මක වන සමස්ත ලංකා වතු කම්කරු සංගමය, කම්කරු ජනයා සඳහා නව වැටුපක් යෝජනා කරමින් සටනට අවතීර්ණ වී තිබේ. වතු සේවකයෙකුගේ අවම දෛනික වැටුප රාජ්‍යයේ සේවකයෙකුගේ අවම වැටුපට සමාන විය යුතු බවත් ඒ අනුව දෛනික වැටුප වශයෙන් රුපියල් 1281ක මුදලක් ලැබිය යුතු බවටත් එම සංගමය ආණ්ඩුවට යෝජනා කර තිබේ.

මෙම ඉල්ලීම පදනම් කර ගනිමින් අත් පත්‍රිකා බෙදීම, විරෝධතා බැනර් අත්සන් කිරීම් සහ උද්ඝෝෂණ ආදී ක්‍රියාමාර්ග රැසක් සමස්ත ලංකා වතු කම්කරු සංගමය විසින් දියත් කර ඇති අතර පසුගිය ඔක්තොම්බර 25වනිදා හැටන් නගරයේදී විරෝධතා බැනරයකට අත්සන් කිරීම එම සංගමයේ සභාපති කේ. සෙල්වරාජ් සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් සාර්ථකව පැවැත්විණි.

# ජනතාවාදී පාලනයක් වෙනුවෙන් වැඩකරන ජනතා සංවාද සභාවක්

වෘත්තීය සමිති යනු පදනමින් ගත් විට තම අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා වැඩ කරන ජනයා සංවිධානය කරන ව්‍යුහයකි. බොහෝ වෘත්තීය සමිති ගත් විට මේ සීමාව තුළ පමණක් සිර වී කටයුතු කළද ජනතා විමුක්ති පෙරමුණ ඉන් ඔබ්බට ගොස් ජනතාවගේ පොදු අයිතිවාසිකම් මෙන්ම වඩා යහපත් ලොවක් නිර්මාණය කිරීම වෙනුවෙන්ද වෘත්තීය සමිති ව්‍යාපාරය මෙහෙයවමින් සිටී.

පසුගිය ඔක්තොම්බර් 04 වෙනිදා " රට හදන ජනතාවාදී පාලනයක් උදෙසා වැඩ කරන ජනතා දායකත්වය" යන මැයෙන් සංවාද සභාවක් ජනතා විමුක්ති පෙරමුණට අනුබද්ධ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය විසින් කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී සංවිධානය කර තිබුණි.

රට ආර්ථික හා සමාජීය වශයෙන් පිරිහුණු වත්මන් තත්වය තුළ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, රාජ්‍ය නිලධාරීන්, බුද්ධිමතුන් ආදීන්ගෙන් සමන්විත වූ ජාතික විද්වත් සංවිධානය රට ගොඩනැගීම අරමුණු කර ගනිමින් ජාතික වැඩපිළිවෙලක් සකස් කරමින් සිටී. එම වැඩපිළිවෙළ වැඩකරන ජනතා දායකත්වය ලබා ගැනීම අරමුණු කර ගනිමින් මේ සංවාද සභාව ගොඩ නැගී තිබුණි.

මෙම අවස්ථාවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අනිල් ජයන්ත, චන්දන ජයලත් යන මහත්වරුන්ද, ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත යන සහෝදරවරුන්ද දේශන පැවැත්වූ අතර ජල, විදුලි, දුම්රිය, වරාය, ඛනිජ තෙල් සහ ගුරු ඇතුළු ක්ෂේත්‍ර මෙන්ම පෞද්ගලික අංශය නියෝජනය කරමින් වෘත්තීය සමිති නියෝජිතයෝ රැසක් මේ සංවාද සභාවට සහභාගි වී සිටියහ.




# ජන පීඩක ආණ්ඩුවට එරෙහිව ජනතාව දැනුවත් කරමින්



රනිල් - මෛත්‍රී ආණ්ඩුව විසින් බඩු මිළ ඉහළ දැමීම, දඩ වැඩි කිරීම, අධික බදු බර, දූෂිතයින්ට දඬුවම් නොකිරීම, ජාතික සම්පත් විකිණීම, එට්කා ඇතුළු ගිවිසුම්වලට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ ඔක්තොම්බර් 23වැනිදා උද්ඝෝෂණයක් සංවිධානය කරන ලදී.

රාජපක්ෂ කල්ලියද රනිල් - මෛත්‍රී ආණ්ඩුවට එරෙහිව උද්ඝෝෂණයක් කැඳවා තිබුණේ ඔක්තොම්බර් මුල් සතියේ පමණය. එහෙත් ඔවුන්ගේ සටන් පාඨ අතර "දූෂිතයින්ට දඬුවම් නොකිරීම " යන කාරණාව අඩංගු නොවීය. අනෙක් කරුණු කාරණා කෙසේ වුවද යහපාලන ආණ්ඩුව පත් වී කෙටි කාලයක් තුළ ජනතාවගේ අප්‍රසාදයට පත් වීමට මූලික කාරණය වූයේ රාජපක්ෂ පාලන සමයේ සිදුවූ වංචා හා දූෂණයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොකිරීමත් රනිල් ආණ්ඩුව විසින් වංචා දූෂණයන් සිදුකිරීමය.

ඒ කෙසේ වුවද ඔක්තොම්බර් 23වැනිදා සංවිධානය කරන ලද උද්ඝෝෂණය වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය තුළ අවකාශයක් නොමැති තත්වයක් තුළද පුළුල් පූර්ව ප්‍රචාරයක් ජනතාව අතරට ගෙන යාමට ජ.වි.පෙ. සමත් විය. තම සංවිධාන යාන්ත්‍රණය භාවිතා කරමින් දිවයිනේ සෑම නගරයක මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික සේවා ස්ථානයන්හිද උද්ඝෝෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ අත් පත්‍රිකා බෙදාහරිනු ලැබීය.

ඔක්තොම්බර් 16 වැනිදා නුගේගොඩ නගරයෙන් මේ පත්‍රිකා බෙදීම ආරම්භ කළ අතර ඔක්තොම්බර් 20වැනිදා යාපනේ නගරයේ අත් පත්‍රිකා බෙදමින් මෙම පණිවිඩය උතුරටද සැල කරන ලදී.


යාපනය නගරයේ අත්පත්‍රිකා බෙදා හැරීම ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ජ.වි.පෙ. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමලිංගම් චන්ද්‍රසේකර් ඇතුළු පිරිසකගේ සහභාගිත්වයෙන් සිදු විය.

# වැඩකරන ජනතාවට සෞන්දර්යාත්මක වේදිකාවක් තනා

වැඩ කරන ජනතාවගේ කලා කුසලතා එළිදැක්වීමට මෙරට ඇති එකම විකල්ප වේදිකාව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සාහිත්‍ය අනු කමිටුව මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන 'දහදිය සිත්තම කලා උළෙල' බව මෙරට තහවුරු වී අවසානය.

සියලු කලාවන්හි උල්පත වූ ශ්‍රමයේ උරුමය සොයා පියනගන සෞන්දර්යාතමක විකල්ප වේදිකාව තේමාව අරමුණු කර ගනිමින් වැඩ කරන ජනයාට අහිමි කර ඇති සංස්කෘතික ජීවිතය යළි උරුම කර දීම සඳහා රසවින්දනයට පමණක් සීමා වූ නිර්මාණ භාවිතයකට එහා යමින් බුද්ධිමය නිම් වළලු පුළුල් කළ හැකි කලා සාහිත්‍ය භාවිතයක් ලාංකේය භූමිය තුළ ස්ථාපිත කිරීම දහදිය සිත්තම කලා උළෙලේ අරමුණ වේ.

පසුගිය ඔක්තොම්බර් 26-27 දෙදින පුරා විශේෂාංග රැසක් සහිතව අති උත්කර්ෂවත් අන්දමින් බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන පරිශ්‍රයේදී පැවැත්විණි. මෙහි සමාරම්භක උත්සවය ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත්, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත යන සහෝදරවරුන්ගේ සහභාගිත්වයෙන් සහ කලාකරුවන් රැසකගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.



# පුළුල් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීම වෙනුවෙන් ජ.වි.පෙ. නායකත්වය දෙනවා



"ධනපති දේශපාලනඥයන් කරන රැවටිල්ල ගැන ජනතාවට අවබෝධ වන සේ කම්කරුවන් ජනතාවගේ ඇස් ඇරවිය යුතුය. වචන කෙරෙහි විශ්වාසය නොතබා, තම ආත්ම ශක්තිය කෙරෙහිද, තමන්ගේම සංවිධානය කෙරෙහිද, තමන්ගේම සමගිය කෙරෙහිද, තමන්ගේම ආයුධ කෙරෙහිද විශ්වාසය තැබීමට ඔවුනට ඉගැන්විය යුතුය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වන වෙළුම,**
**19 පිටුව**

රටේ ඇති වී තිබෙන නිර්ලජ්ජිත බලලෝභී දේශපාලනය අවසන් කළ යුතුව තිබෙන බවත් මහින්ද රාජපක්ෂට ඔටුනු පැළඳවීමෙන් හෝ ඔහුගේ ඔටුන්න ගලවා රනිල්ට පැළඳවීමෙන් රටේ අස්ථාවරභාවයට, අරාජිකත්වයට හෝ ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු නොලැබෙන බවත් අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ඒ වෙනුවෙන් නව දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුව ඇති බවත් ජ.වි.පෙ. ඊට නායකත්වය දීමට සූදානම් බවත් ප්‍රකාශ කළේය.

ඔහු මෙසේ පැවසුවේ රට තුළ වර්ධනය වන දේශපාලන තත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා පසුගිය 29වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා සහ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මෙහිදී වැඩිදුරටත් පළ කළ අදහස් කාලීන වැදගත්කම සලකා සම්පූර්ණයෙන් උපුටා ගැනීමට නියමුවා අපි තීරණය කළෙමු.

**දේශපාලන කුමන්ත්‍රණය**

"පසුගිය සිකුරාදා සිදුවූයේ දේශපාලන කුමන්ත්‍රණයක්. එමගින් රට අරාජිකත්වයකට, අස්ථාවරභාවයකට පත්කොට තිබෙනවා. එම කුමන්ත්‍රණය සිදුවී දින කිහිපයක් ගත වුවත් කුමන්ත්‍රණය අවසන් වී නැහැ. දිනෙන් දින රට අරාජිකත්වය, අස්ථාවරභාවය වර්ධනය වෙමින් තිබෙනවා. ජනතාව නොසන්සුන් තත්වයකට පත්ව තිබෙනවා. එම දේශපාලන කුමන්ත්‍රණයේ විපාක කොයි තරම්ද කියනවා නම් තෙල් සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සිදුවූ ගැටුමකින් එක් අයෙකු මිය ගොස් දෙදෙනෙකු තුවාල ලබා තිබෙනවා. රට අරාජික වෙලා ජනතාව වික්ෂිප්ත වෙලා සිටිනවා. මෙම බල පොරය ජනතාවගේ හෝ රටේ අවශ්‍යතාවය නිසා ඇති වූවක් නොවෙයි. රනිල්, මෛත්‍රී, මහින්ද තිදෙනාගේ බල පොරය වෙනුවෙන් ඇතිවූවක්. ඔවුන්ගේ බලය තහවුරු කර ගැනීමේ මෙම දේශපාලන කුමන්ත්‍රණයෙන් රටට හෝ ජනතාවට වාසියක් අත්වෙන්නේ නැහැ. අපි රටේ ජනතාවගෙන් ඉල්ලනවා, මෙම දේශපාලන ගැටුමේ කොටස්කාරයින් බවට පත්වෙන්න එපා කියලා. තෙල් සංස්ථාව් සේවකයෙකු මිය යාමෙන් හෝ දෙදෙනෙකු තුවාල ලැබීමෙන් රනිල්, මෛත්‍රී, මහින්දගේ බල පොරයට කිසිදු බලපෑමක් ඇතිවෙන්නේ නැහැ.

ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන් මල්කඩ යැයි ඔවුන්ම කියන රටේ උත්තරීතරම ආයතනය යැයි හඳුන්වන පාර්ලිමේන්තුවේ දොර වසා තිබෙනවා. මෛත්‍රීපාල වැසිකිළියට ගොස් වීදුරු දොරකින් වසාගෙන සිටිනවා සේ කිසිදු ලැජ්ජාවකින් තොරව පාර්ලිමේන්තුව කල් දමා තිබෙනවා. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහා ලොකුවට දේශන පවත්වන දිනේෂ් ගුණවර්ධනලා මෛත්‍රීගේ වැසිකිළිය අසල නහය වසාගෙන මුර බල්ලන් බවට පත්වෙලා ඉන්නවා. ජනතා නියෝජිතයින් ලෙස මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කරන්න තිබෙන පාර්ලිමේන්තුවේ දොර විවෘත කරන්න කියලා අපි මෛත්‍රීපාලට කියනවා. මෛත්‍රීගේ දේශපාලන කුමන්ත්‍රණයේ කොටස්කාරයෙක් බවට පාර්ලිමේන්තුව පත්කරගෙන තිබෙනවා. පාර්ලිමේන්තුව වසා දැකීම ගැන ලක්ෂමන් යාපලා හය හතර නොදත් නොදරුවන්ට කියා දෙනවා සේ රටට විහිළු සපයනවා. මෙම ඇතිවී තිබෙන තත්වය පිළිබඳව පාර්ලිමේන්තු විවාදයක් අවශ්‍ය නැද්ද? පාර්ලිමේන්තුව වසා දැමීම මෛත්‍රීගේ බල කුමන්ත්‍රණයේම දිගුවක්. එනිසා ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හය දෙනාගේම අත්සනින් යුතුව අද අපි කථානායකවරයාට ලිපියක් මගින් දැනුම් දෙනවා පාර්ලිමේන්තුව කඩිනමින් කැඳවන්න කියලා. කෙසේ වුවත් මෙම ඇතිවී තිබෙන අර්බුදය පාර්ලිමේන්තුව කැඳවීමෙන් පමණක් විසඳා ගත හැකි යැයි අපි විශ්වාස කරන්නේ නැහැ. රටේ ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබාගැනීමට වෙනස් මාවතක් විවෘත කරගත යුතුව තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අපිට මෙම අස්ථාවර ස්වභාවය දෙස හෝ කැත මජර බල සූදුව දෙස නරඹන්නන් ලෙස බලා සිටීමට අයිතියක් නැහැ. එනිසා මෙම බල සූදුවට එරෙහිව පියවර ගැනීමට ජනතා විමුක්ති පෙරමුණ මැදිහත් වෙනවා.

**ජනතා ව්‍යාපාරයක අවශ්‍යතාවය**

රට තුළ දිනෙන් දින සිදුවෙමින් තිබෙන සිදුවීම්වලින් රනිල්-මෛත්‍රී-මහින්ද තවදුරටත් අපේ රට ගොඩනැගීමට අසමත් පාලකයින් බව ඔප්පු කරමින් තිබෙනවා. ඔවුන්ගේ මෙම බල කඳවුරුවලට සහ ඔවුන් වටා සිටින කණ්ඩායම්වලට තවදුරටත් අපේ රට දශමයකින් හෝ ඉදිරියට ගෙනියන්න බැරි බව ඔප්පු කොට තිබෙනවා.

ජනතාව මර උගුලකට හිර කර, ජනතාවගේ ජීවිත සූදුවකට ලක් කර, ඔවුන් මෙම කැත, නින්දිත බල සූදුව දියත් කරමින් තිබෙනවා. රනිල්-මෛත්‍රී-මහින්දලාගේ වුවමනාව මොකක්ද කියලා මෙම බල සූදුවෙන් ඔප්පු කරමින් තිබෙනවා. එනිසා මෙම කැත බල සූදුවට එරෙහිව ජනතාවගේ ගැටලුවට විසඳුම් ලබාදිය හැකි ප්‍රබල ජනතා ව්‍යාපාරයක අවශ්‍යතාවය පැන නැගී තිබෙනවා.

ජනතා විමුක්ති පෙරමුණ ලෙස අපි මේ රටේ ජනතාවගෙන් ඉල්ලනවා, මෙම ගැටුමේ කොටස්කරුවන් බවට පත්වී හෝ ඒ දෙස නරඹන්නන් ලෙස බලා සිටිනවා වෙනුවට මෙම නිර්ලජ්ජිත බල සූදුවට එරෙහිව පුළුල් ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීම සඳහා පෙළගැහෙන්න කියලා. මෙම බල සූදුව අනිවාර්යයෙන්ම නතර කළ යුතුයි. ඒ වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පියවර ගන්නවා. මෙම සිදුවීම්වලින් පාඩමක් ඉගෙන ගන්න කියලා අපි ජනතාවගෙන් ඉල්ලනවා. පොත් දහස් ගණනක් කියවා තේරුම් ගැනීමට නොහැකි දේශපාලන කරුණු මෙම සිදුවීමෙන් ජනතාවට ඉගෙන ගත හැකියි. මෙම බල සූදුවට අපේ රටත් රටේ දරුවන්ගේ අනාගතයත් අගාධයකට ගෙනයාමට ඉඩ දිය යුතු නැහැ. අපේ රටේ ජනතාවගේ කාලය, ශ්‍රමය, ධනය සියලු දේ කැප කළ යුත්තේ රනිල්ලාගේ, මෛත්‍රීලාගේ, මහින්දලාගේ බල කඳවුරු ශක්තිමත් කිරීමට නොවේ. ජනතාව කැප කිරීම් කළ යුතු වන්නේ මෙම බල කඳවුරුවලට එරෙහිව ගොඩනැගෙන ජනතා බලවේග යක් සඳහායි. ජනතා විමුක්ති පෙරමුණ එකතු කරගත හැකි යහපත් පුද්ගලයින් සමඟ වමේ ව්‍යාපාරය සමඟ නව බලවේගයක් ගොඩනැගීම වෙනුවෙන් සාකච්ඡා ආරම්භ කරනවා. ඒ වගේම හැම මොහොතකම රටේ අර්බුද අවස්ථාවලදී පෙරට ආපු සිවිල් සංවිධාන සමග අපි සාකච්ඡා කරනවා. විකල්ප මහජන ධාරාවක්, පොදුජන ව්‍යාපාරයක් ගොඩනැගීම වෙනුවෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීයවේදීන්, කලාකරුවන් ඇතුළු සියලු ප්‍රගතිශීලී බලවේග සමග සාකච්ඡා පවත්වමින් පොදු ජනයා මෙම බල සූදුවට එරෙහිව පෙළගස්වමින් පොදුජන ව්‍යාපාරයක් ආරම්භ කරනවා.

මෙම දේශපාලන කුමන්ත්‍රණයට එරෙහිව ගොඩනගන ව්‍යාපාරයේ පළමු පියවර ලෙස අපි ජනතා රැලියක් නොවැම්බර් 01වැනිදා නුගේගොඩදී පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබෙනවා. එම අවස්ථාවට විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීයවේදීන්, කලාකරුවන් ඇතුළු සියලු ප්‍රගතිශීලී බලවේග සහභාගී වීමට නියමිතව තිබෙනවා. මන්දිර ඇතුළේ සිදුකරන දේශපාලන කුමන්ත්‍රණ වෙනුවට, දේශපාලන නායකයින් අතර ඇතිවන දේශපාලන කුමන්ත්‍රණ වෙනුවට රට ගොඩනගන වැඩපිළිවෙළක් සඳහා ඉඩ විවෘත කරගත යුතු වෙනවා. ඒ වෙනුවෙන් මේ රටේ මාධ්‍යවේදීන්ගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. දේශපාලඥයින් කියන ප්‍රකාශ වාර්තා කිරීමෙන් ඔබ්බට ගොස් රට ගොඩනගන වැඩපිළිවෙළේ කොටස්කරුවන් බවට පත්වෙන්න කියලා මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලනවා. රටේ ඇතිවෙලා තිබෙන කැත, නින්දිත, නිර්ලජ්ජිත බලලෝභී දේශපාලනය අවසන් කළ යුතුව තිබෙනවා. මහින්ද රාජපක්ෂට ඔටුන්න පැළඳවීමෙන් හෝ ඔහුගේ ඔටුන්න ගලවා රනිල්ට පැළඳවීමෙන් රටේ ඇතිවෙලා තිබෙන මේ අස්ථාවරභාවයට, අරාජිකත්වයට හෝ ජනතාවගේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නේ නැහැ. ඒ සඳහා නව දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගිය යුතුව තිබෙනවා. ඒ වෙනුවෙන් රටේ වැඩකරන ජනතාව, සිවිල් බුද්ධිමතුන් සියලු දෙනාට අපි ආරාධනා කරනවා."

ජනතා විමුක්ති පෙරමුණ එකතු කරගත හැකි යහපත් පුද්ගලයින් සමඟ වමේ ව්‍යාපාරය සමඟ නව බලවේගයක් ගොඩනැගීම වෙනුවෙන් සාකච්ඡා ආරම්භ කරනවා. ඒ වගේම හැම මොහොතකම රටේ අර්බුද අවස්ථාවලදී පෙරට ආපු සිවිල් සංවිධාන සමග අපි සාකච්ඡා කරනවා. විකල්ප මහජන ධාරාවක්, පොදුජන ව්‍යාපාරයක් ගොඩනැගීම වෙනුවෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීයවේදීන්, කලාකරුවන් ඇතුළු සියලු ප්‍රගතිශීලී බලවේග සමග සාකච්ඡා පවත්වමින් පොදු ජනයා මෙම බල සූදුවට එරෙහිව පෙළගස්වමින් පොදුජන ව්‍යාපාරයක් ආරම්භ කරනවා.



# උතුරු හා දකුණු කොරියා ගැඹුරු බැඳීමක් කරා...



උතුරු කොරියානු නායක සභාපති කිම් ජොන් උන්ගේ සහ එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ඓතිහාසික හමුවෙන් පසුව පසුගිය සැප්තැම්බර් 18වැනිදා උතුරු හා දකුණු කොරියානු නායකවරු ඓතිහාසික ප්‍යොන්ග් යැන්ග් (Pyong Yang) ප්‍රකාශයට අත්සන් තැබූහ. මේ අතර ප්‍යොන්ග් යැන්ග් ප්‍රකාශයේදී එකඟ වූ කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ පෙළේ සාකච්ඡාවක් පසුගිය ඔක්. 15වැනිදා ආරම්භ කෙරිණි. මේ නිසා උතුරු හා දකුණු කොරියානු සබඳතාවයන්හි වර්ධනය කවරාකාර ද යන්න මේ වෙන විට ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රයේ කතාබහට ලක් වී තිබේ.

ප්‍යොන්ග් යැන්ග් ප්‍රකාශය මූලික වශයෙන් කරුණු හයකින් සමන්විතය. ඉන් අවසාන එකතාවය වූයේ සභාපති කිම් ජොන් උන් ඉක්මන් දිනයකදී දකුණු කොරියාවේ සියොල් අගනුවරට පැමිණීමයි.

ප්‍යොන්ග් යැන්ග් ප්‍රකාශය නීතිමය වශයෙන් අවබෝධතා ගිවිසුමක තත්වය ගනී. එහි පළමු කරුණ වන්නේ දෙරට අතර වර්ධනය වී ඇති යුදමය පීඩනය අවම කිරීමයි. ඒ අනුව පහත සඳහන් පියවර ගැනීමට දෙරට එක වී තිබේ.

- ගොඩබිම් දේශසීමා ප්‍රදේශය තුළ කි.මී. 10ක පළලින් යුතු යුද මුක්ත කලාපයක් ඇති කිරීම. මෙම ප්‍රදේශය නොවැ. 01 වෙනිදා සිට යුදමය ගුවන්ගත කිරීම් සඳහා, සැහැල්ලු අවි භාවිතය සඳහා සහ යුධ අභ්‍යාස සඳහා යොදා නොගැනීම
- දෙරටෙහි මුහුදු සීමාවෙහි කි. මී. 80ක පළලින් යුක්ත යුද මුක්ත කලාපයක් ඇති කිරීම
- දැනට ඇති යුද මුක්ත කලාපයේ පිහිටුවා ඇති ආරක්ෂක මුර කපොලු එකොළහ දැනට පිහිටි ස්ථානයේ සිට කි.මී. 1ක් දුරකින් පිහිටුවීම
- දේශසීමා ප්‍රදේශය තුළ රඳවා ඇති සෙබළුන් සංඛ්‍යාව එක් පසෙකට 65 දක්වා අඩු කිරීම.
- කිසියම් සිද්ධියකදී ක්‍රියාකිරීමට මෙතෙක් එකඟ වී තිබූ පිළිවෙත වෙනස් කිරීම. එනම් කවර සිදුවීමක් වුවද වෙඩි තැබීම් සිදු නොකර සිටීම

දෙවෙනි කරුණ වන්නේ ආර්ථික, යටිතල පහසුකම් ව්‍යාපෘති, වෛද්‍ය පහසුකම් හා වනාන්තර යන ක්ෂේත්‍රවල දෙරට අතර සහයෝගිතාව ඇති කිරීමයි. මෙහි දී උතුරු කොරියාව තුළ නැවත වන වගා ව්‍යාපෘතියක් පළමු වැඩ සටහන ලෙස ආරම්භ කිරීමට වැඩි ඉඩ කඩක් ඇත්තේ එය සම්බාධකවලට අයත් නොවන බැවිනි. එහෙත් සම්බාධක හේතුවෙන් බරපතළ ලෙස අඩපණ වී ඇති උතුරු කොරියාවේ සෞඛ්‍ය සේවය නගා සිටුවීම, විශේෂයෙන් වසංගතයන් පැතිර යාම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම හදිසි මැදිහත්වීමක් කළ යුතු ක්ෂේත්‍ර වුවද එය පහසු කාර්යයක් වී නොමැත. මේ අතර දෙරට අතර ප්‍රවාහන සේවය ආරම්භ කිරීම උත්සවාකාරයෙන් සිදු කිරීමට දෙරට එක වී සිටී.

උතුර හා දකුණු කොරියාව ලෙස දෙරට බෙදී යාමේ දී වෙන් වූ පවුල් යළි එක් කිරීම ඊළඟ කරුණයි. දැනට ඔවුන් මුණ ගැසෙන්නේ කලින් කලට වුවද එය ස්ථාවර දෙයක්, නිතිපතා මුණ ගැසීමක් දක්වා එය ගෙන යාම සඳහා ඔවුන් අතර සන්නිවේදනය විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම පිළිබඳ සාකච්ඡා කෙරෙමින් තිබේ. 2018 මැයි වන විට වෙන්වූ පවුල්වල සංඛ්‍යාවෙන් (132,124) 75,234ක් මිය ගොස් සිටි අතර ඉතිරි අයගෙන් 80%ක්ම වයස අවුරුදු 70ට වැඩිය. මේ නිසා මේ සම්බන්ධයෙන් ඉක්මන් පියවර ගත යුතු බව ද සාකච්ඡා වී තිබේ.

ක්‍රීඩා හා සංස්කෘතික ක්ෂේත්‍රයේ සහයෝගිතාව වර්ධනය කිරීම හතරවැනි කරුණයි. මේ අනුව 2032 ඔලිම්පික් උළෙල පැවැත්වීම සඳහා දෙරටින්ම පොදු යෝජනාවක් කිරීමත්, 2020 ටෝකියෝ ගිම්හාන ඔලිම්පික් උළෙලට දෙරටින්ම පොදු කණ්ඩායමක් යැවීමටද සාකච්ඡා කෙරී තිබේ. තවද උතුරු කොරියානු ජනතාව පිළිබඳ දකුණු කොරියානු ජනතාවට අවබෝධය ලබා දීම සඳහා වෙනම රූපවාහිනී චැනලයක් ආරම්භ කිරීමටද දකුණු කොරියාව බලාපොරොත්තු වේ.

පස්වන කරුණ වෙන්නේ න්‍යෂ්ටික අවි හරණයයි. ඒ අනුව 'කොරියන් අර්ධද්වීපය සාමයේ භූමියක්' බවට පත් කිරීමටද එකඟ වුවද අගෝස්තු 03වැනිදා සිට මේ පිළිබඳව එක්සත් ජනපදය සමග තිබූ සාකච්ඡා බිඳ වැටී තිබේ.

උතුරු හා දකුණු කොරියාව අතර සබඳතා වර්ධනය කර ගැනීමේ දී ඇතැමුන් යෝජනා කරන්නේ එය හොංකොං හා චීනය අතර මෙන් 'ක්‍රම දෙකක්, එක් රටක් ' ලෙස සකස් විය යුතු බවයි. එහෙත් උතුරු කොරියාව හා දකුණු කොරියාව අතර තත්වය චීනය හා හොංකොං අතර තත්වය මෙන් නොවන නිසා එය සිදුවිය හැකිද යන්න සැක සහිතය.

අනෙක් අතට උතුරු කොරියාව හා දකුණු කොරියාව අතර සබඳතාව ඒ දෙරටට අවශ්‍ය ආකාරයට ස්වාධීනව තීරණය කිරීමේ හැකියාව කොතරම්ද යන කරුණ මෙහිදී වැදගත් වේ. දකුණු කොරියාව එක්සත් ජනපදයේ වුවමනාවන්ගෙන් ගැලවී තමන්ට අවශ්‍ය අන්දමින් ස්වාධීනව කටයුතු කිරීමට ඇති ඉඩකඩද ඉතාම අල්පය. එබැවින් මෙම සබඳතාවයේ වර්ධනයේ ප්‍රමාණය හා දිශානතිය තීරණය කෙරෙන්නේ එක් එක් රට විසින් නොව ලෝක බල අරගලයේ තීව්‍රතාව විසිනි.

## භූතාන පාර්ලිමේන්තුව කණපිට හැරෙයි




දකුණු ආසියානු කලාපීය රටක් වන භූතානයේ පාර්ලිමේන්තු මැතිවරණය 2018 සැප්තැම්බර් සහ ඔක්තෝබර් 18 යන දෙදින පැවැත්වුණි. එහිදී හිටපු අගමැති ෂෙරින්ග් ටොබ්ගේ (Tshering Tobuy) පරාජය කරමින් භූතාන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (DN) ජයග්‍රහණය කළේය. භූතාන සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට මින් පෙර පාර්ලිමේන්තු නියෝජනයක් නොතිබුණු අතර මෙවර මහ මැතිවරණයේ දී එය ඡන්ද 54.95%ක ප්‍රතිශතයක් ලබා ගනිමින් ආසන 47ක් ඇති පාර්ලිමේන්තුවෙහි ආසන 30ක් දිනා ගැනීමට සමත් විය. භූතානයේ 'සාමය හා සමෘද්ධිය' පක්ෂය ඡන්ද 45.05%ක ප්‍රතිශතයක් ලබා ගනිමින් ඉතිරි ආසන 17 දිනා ගත්තේය. හිටපු අගමැතිගේ ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය එකදු අපේක්ෂකයෙකු හෝ පාර්ලිමේන්තුවට තේරී පත් නොවිණි. ඊට ප්‍රථම ඔවුන්ට පාර්ලිමේන්තු ආසන 32ක් හිමිවී තිබිණි.

## වියට්නාමයට නව ජනාධිපතිවරයෙක්



වියට්නාමයේ නව ජනාධිපතිවරයා ලෙස එරට කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් න්ගුයෙන් ප්හු ට්‍රොන්ග් (Nguyen Phu Trong) තෝරා පත්කර ගැනුණි. මේ අනුව ඔහු 2018 -2021 කාලය දක්වා ජනාධිපති ධුරය දරනු ඇත.

1944 වසරේ දී උපත ලැබූ ඔහු මහාචාර්යවරයෙකි. දේශපාලන විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් දරන ඔහු පක්ෂය ගොඩ නැගීම පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත්තෙකි. ඔහු ප්‍රථම වරට කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ධුරයට තෝරා පත් කර ගැනුණේ 2011දීය. 2016 වසරේදී ඔහු නැවත වරක් එම ධුරයට තෝරා පත්කර ගැනුණි. 1997 වසරේ සිට ඔහු කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකි.

## එක්සත් ජනපදය 'කෙටි දුර' බලමින්



එක්සත් ජනපදය 1987 දී සමාජවාදී සෝවියට් දේශය සමග අත්සන් කළ මධ්‍ය හා කෙටි දුර මිසයිල ගිවිසුමෙන් ඉවත්වීමට සූදානම් වේ. මේ බව එරට ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් නෙවාඩාවලදී ප්‍රකාශ කර තිබිණි. තවද ට්‍රම්ප්ගේ ආරක්ෂක උපදේශක ජෝන් බෝල්ටන් විසින් ද ඒ බව තහවුරු කර තිබිණි.

මේ පිළිබඳව අදහස් දක්වමින් රුසියාව ප්‍රකාශ කර තිබුණේ එක්සත් ජනපදය ඒක පාර්ශවිකව එම ගිවිසුමෙන් ඉවත් වෙන්නේ නම් තමන්ද ඊට ප්‍රතිචාර වශයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවයි. මේ පිළිබඳ අදහස් දක්වන දේශපාලන විචාරකයින් පවසන්නේ, මෙය ට්‍රම්ප්ගේ ඉතාම අනුවණ ක්‍රියාමාර්ගයක් බවයි. මෙ මගින් ආයුධ තරඟය තවදුරටත් ඉහළ යන අතර ලෝකය තුළ අනවශ්‍ය යුද උණුසුමක් වර්ධනය වෙන බවයි. කෙසේ වුවද ට්‍රම්ප් මෙමගින් එක්සත් ජනපද ආයුද අලෙවිය ඉහළ නංවා ගැනීමට අපේක්ෂා කරන බවටද අදහස් පළවේ.

1987 දී එවකට එක්සත් ජනපද ජනාධිපති රොනල්ඩ් රේගන් සහ සෝවියට් ජනාධිපති මිහායිල් ගොර්බචොෆ් අතර මෙම ගිවිසුම අත්සන් කෙරුණු අතර තවමත් එය ක්‍රියාත්මකව පවතී.

## ලෝකය නැවතත් ආර්ථික අර්බුදයක




2008 සැප්තැම්බර් මාසයේ දී ඇති වූ මූල්‍ය අර්බුදයෙන් වසර 10ක් ගත වෙද්දී නැවතත් ආර්ථික අර්බුදයක් ඇතිවීමේ අවදානම පිළිබඳ මාධ්‍ය වාර්තා කරමින් තිබේ. යළිත් එවැනි අර්බුදයක් ඇති විය හැකි තත්වයන් 08ක් පිළිබඳ මෙහිදී සාකච්ඡා කෙරෙමින් තිබේ. බැඳුම්කර බුබුළෙහි පුපුරා යාම, කොටස් වෙළඳපොළ බුබුළ පුපුරා යාම, ඉතාලියෙහි වර්ධනය වී ඇති ආර්ථික අර්බුදය, තීරු බදු පැනවීම් නිසා මතු වී ඇති තත්වය, බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත්වීම සමග මතුවිය හැකි තත්වය, එක්සත් ජනපදය තුළ මතුවී ඇති විශ්‍රාම වැටුප් අර්බුදය, නිවාස වෙළඳපොළ අර්බුදය, චීනයට එරෙහිව තීරු බදු පැනවීම හේතුවෙන් චීනය තුළ මතුවෙන අර්බුදය යන තත්වයන් මෙම අර්බුදය පුපුරා යාමට හේතුවිය හැකිවේ යැයි අනාවැකි පළ කෙරී තිබේ.

# සමාජවාදී රටක අයවැය

මේ දිනවල අප රටේ ආර්ථික ක්ෂේත්‍රයෙහි ප්‍රධාන මාතෘකා දෙකක් පිළිබඳ කතා බහ වෙමින් තිබේ. එකක් රුපියලේ අගය ඩොලරයට සාපේක්ෂව වේගයෙන් කඩා වැටෙමින් තිබීමයි. දෙවැන්න නුදුරේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයවැයයි.

රුපියලේ අගය කඩා වැටීම නවතා ගැනීමට නම් නැවත නිෂ්පාදන ආර්ථිකයකට යා යුතු යයි නිෂ්පාදන ආර්ථිකය බිඳ වැට්ටවීමට පුරෝගාමී වූ අයම දැන් ප්‍රකාශ කරන්නට පටන්ගෙන තිබේ. මේ අනුව රුපියලේ අගය අනෙකුත් මුදල් ඒකකයන්ට සාපේක්ෂව ඉහළ දමා ගැනීමට නම් රට තුළ නිෂ්පාදනය ඉහළ දැමිය යුතුය. එනම් රටෙහි ජාතික ආදායම ඉහළ දැමිය යුතුය. මේ නිසා අපි මෙවර රටක ජාතික ආදායම යනු කුමක්ද යන්නත්, ධනවාදී රටක අයවැය හා සමාජවාදී රටක අයවැය අතර ඇති වෙනස්කම් මොනවාද යන්නත් කෙටියෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.



**රටක ජාතික ආදායම යනු කුමක් ද?**

රටක ජාතික ආදායම යනු එම රටෙහි ඒකාබද්ධ හෙවත් සමස්ත සමාජ නිෂ්පාදනයෙහි කොටසකි. එනම් ද්‍රව්‍යමය නිෂ්පාදනයෙහි යෙදී සිටින ශ්‍රමිකයන් (ගොවීන් + කම්කරුවන් ආදී) එක් අවුරුද්දකදී ඔවුන්ගේ ජීවමාන ශ්‍රම වැය කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස උපයන දේ ජාතික ආදායම් ලෙස සැලකේ.

උදාහරණයක් ලෙස ගතහොත් සමස්ත සමාජ නිෂ්පාදනයේ වටිනාකම ඩොලර් බිලියන 200ක් නම් දැනටමත් එකී රටෙහි ඇති කර්මාන්ත ශාලා, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි, අමුද්‍රව්‍ය ආදියෙහි වටිනාකම ඩොලර් බිලියන 120ක් නම් එම වසරෙහි එකී රටෙහි ජාතික ආදායම ඩොලර් බිලියන 80ක් ලෙස සැලකේ.

| සමස්ත සමාජ නිෂ්පාදනය | - දැනටමත් ඇති වටිනාකම් | = එක් අවුරුද්දක් තුළදී ඉපයූ නව වටිනාකම් |
|---|---|---|
| ඩොලර් බිලියන 200 | ඩොලර් බිලියන 120 | ඩොලර් බිලියන 80 |

රටක ජාතික ආදායම ආකාර කිහිපයකට පවතී. කොටසක් එකී වසරේදී නිපදවන ලද භාණ්ඩ ලෙස පවතින අතර ඉතිරි කොටස වටිනාකම් ලෙස පවතී.

භාණ්ඩ ලෙස පවතින කොටස ප්‍රධාන ආකාර දෙකක් ලෙස පවතී. එනම් එකී වසර තුළ එම රට තුළ නිපදවන ලද පාරිභෝගික භාණ්ඩ ලෙස හා එම වසර තුළදීම එකී රට තුළ නිපදවන ලද යන්ත්‍ර සූත්‍ර හා අමුද්‍රව්‍ය (නිෂ්පාදන මාධ්‍යයන්) ලෙසයි.

වටිනාකම් ලෙස පවතින කොටස කම්කරුවන්, ගොවීන්, හා හස්ත කර්මාන්තකරුවන් උපයන ලද වැටුප හෝ ආදායම ලෙසත් නිෂ්පාදනයේදී දේපළ හිමිකරුවන් විසින් අත්පත් කරගත් ලාභය ලෙසත් පවතී. ධනවාදී රටක නම් වැටුප් උපයන්නේ කුඩා පරිමාණ නිෂ්පාදනයේ සේවා ක්ෂේත්‍රයේ රැකියා කරන තාක්ෂණ ශිල්පීන් හා නිෂ්පාදනීය ක්ෂේත්‍රයේ රැකියා කරන්නවුන්ය. මේ නිසා කිසියම් රටක ජාතික ආදායමේ ප්‍රමාණය එම රටෙහි රැකියාවෙහි යෙදී සිටින පුද්ගලයන් ගණනින් හා නිෂ්පාදනය සඳහා යොදාග න්නා තාක්ෂණික මෙවලම් කෙතරම් කාර්යක්ෂමද යන්නත් මත තීරණය වේ. කිසියම් රටක රැකියාවේදී යෙදී සිටින පුද්ගලයන් ගණන අඩුනම් හා භාවිතා කරනු ලබන උපකරණ යන්ත්‍ර සූත්‍ර තාක්ෂණික වශයෙන් පැරණි නම් එවන් රටක ජාතික ආදායමද අඩුය.

මේ අනුව රටක ජාතික ආදායම මූලික වශයෙන් බෙදී ඇත්තේ ගොවීන්, කම්කරුවන් කුඩා පරිමාණ නිෂ්පාදකයන් හා දේපළ හිමියන් අතරය.

**අයවැය යනු කුමක්ද?**

ධනවාදී රටක අයවැය යනු ඉහත කී ජාතික ආදායම රටේ අනෙකුත් ජනතාව අතර හා විවිධ ක්ෂේත්‍ර වෙත යළි බෙදා හැරෙන ආකාරයයි. ඒ සඳහා රජය ආදායම් ලැබිය යුතුය. ධනවාදී රටක රාජ්‍ය අයවැයේදී ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ ජනතාවගෙන් අයකර ගනු ලබන බදුය. මෙය ඍජු හෝ වක්‍ර බදු ලෙස ලබාග නී. බ්‍රිතාන්‍ය, එක්සත් ජනපදය වැනි රටවල රාජ්‍ය අයවැයෙහි ආදායමෙන් 90%ක් පමණ ලැබෙන්නේ ජනතාවගෙන් ලබා ගන්නා බදු ආදායම ලෙසය.

> සමාජවාදය තුළදී හැමවිටම ජාතික ආදායම සැලසුම් සහගත ලෙස ඉහළ දැමීමට රජය මැදිහත් වෙයි. මේ නිසා නිෂ්පාදනය සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමටත් තාක්ෂණික දියුණුව ඇති කිරීම සඳහාත් සෑම අයෙකුටම රැකියාවක් සහතික කිරීමටත් සමාජවාදී රජය මැදිහත් වේ.

සාමාන්‍යයෙන් ධනවාදී රටක අයවැයක් මගින් යළි බෙදා හරිනු ලබන්නේ ජාතික ආදායමෙන් 40%ක් - 45%ත් අතර ප්‍රමාණයකි. සාමාන්‍යයෙන් ධනවාදී රටක අයවැයෙන් වැඩිම කොටස වෙන්කරනු ලබන්නේ ආරක්ෂක නැත්නම් යුදමය කටයුතු සඳහාය. අධ්‍යාපන හා සෞඛ්‍ය වැනි සේවාවන් සඳහා යොදවන්නේ අවම මුදලකි.

සමාජවාදී රටකදී ජාතික ආදායම යනු ධනවාදය තුළදී මෙන්ම සමස්ත සමාජ නිෂ්පාදනයේ කොටසකි. එය ධනවාදය තුළදී ගණන් බලන ආකාරයටම ගණන් බලනු ලබයි. ඒ අතර සමාජවාදය තුළදී හැමවිටම ජාතික ආදායම සැලසුම් සහගත ලෙස ඉහළ දැමීමට රජය මැදිහත් වෙයි. මේ නිසා නිෂ්පාදනය සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීමටත් තාක්ෂණික දියුණුව ඇති කිරීම සඳහාත් සෑම අයෙකුටම රැකියාවක් සහතික කිරීමටත් සමාජවාදී රජය මැදිහත් වේ.

ධනවාදය තුළදී මෙන්ම සමාජවාදය තුළදීද ජාතික ආදායම යළි ජනතාව අතර සහ විවිධ ක්ෂේත්‍ර අතර බෙදාහරිනු ලබන්නේ රාජ්‍ය අයවැය මගිනි. රාජ්‍ය අයවැය රටේ ජාතික මූල්‍යමය සැලැස්මයි. එය වාර්ෂිකව පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතුය. එයට නීතිමය බලයක් ඇත. සියලු ආයතන එමගින් පාලනය කෙරේ.

සමාජවාදී රටක අයවැයෙහි ආදායම් ප්‍රධාන ආකාර දෙකකින් ලැබේ. එනම් සමාජවාදී ව්‍යාවසායයන්ගෙන් හා සංවිධානවලින් ලැබෙන ආදායම හා ජනතාවගෙන් ලැබෙන ආදායම්ය. පළමු කාණ්ඩයේ ආදායම් ලැබෙන්නේ සමාජවාදී ව්‍යාවසායයන්ගේ ශුද්ධ ආදායමෙන් හෝ අතිරික්ත නිෂ්පාදනයෙනි. දෙවන කාණ්ඩය ගොඩනැගෙන්නේ පුරවැසියන්ගේ පුද්ගලික ආදායමෙන් හා ඔවුන්ගේ ඉතිරිකිරීම්වලිනි. තීරණාත්මක කාර්ය භාරය පැවරෙන්නේ පළමු කාණ්ඩයටයි. එය රාජ්‍ය අයවැයේ ආදායමින් 85%-90%ක් පමණ වේ. සාමාන්‍යයෙන් සමාජවාදී රටක බදු ආදායම මුළු රාජ්‍ය ආදායමෙන් 8%ක් පමණ වේ. සමාජවාදය යටතේ බදු එහි ආර්ථික ස්වභාවය අනුව වන්දි නොගෙවා කම්කරු පන්තියෙන් ලබාගනු ලබන මුදල නොවේ. මක්නිසාද යත් බදු ආදායම අවසාන අර්ථයෙන් ජනතාවගේ වුවමනාවන් තෘප්ත කිරීමට යොදවන බැවිනි. මාක්ස් පෙන්වා දුන්නේ, 'සමාජවාදී සමාජයේදී නිෂ්පාදකයාගෙන් පුද්ගලයෙකු ලෙස ඔහුගේ ධාරිතාවයට අනුව ලබා ගනු ලබන දෙයින් සමාජයේ සාමාජිකයෙකු ලෙස ඔහුට ඍජුව හෝ වක්‍රව වාසි සැලසේ' යනුවෙනි.

සමාජවාදයේදී රාජ්‍ය අයවැයෙහි වියදම් ශීර්ෂය ජාතික ආර්ථිකයේ වියදම්වලින් සැදේ. මෙම වියදම් වන්නේ සමාජ හා සංස්කෘතික කටයුතු සඳහා, විද්‍යාව සංවර්ධනය සඳහා, පරිපාලන ව්‍යුහයන් හා රටේ ආරක්ෂාව පවත්වාගෙන යෑම සඳහා වැය වන වියදම්ය. රාජ්‍ය අයවැයේ අරමුදල්වලින් වැඩි කොටස ජාතික ආර්ථිකයේ සමාජීය හා සංස්කෘතික කටයුතු සඳහා හා විද්‍යාවේ සංවර්ධනය සඳහා යොදවයි. සමාජවාදී රටවල අයවැයෙහි විශේෂිත ලක්ෂණ වන්නේ සමාජයීය හා සංස්කෘතික කටයුතු සඳහා අයවැයෙහි වියදම්වලින් වැඩි කොටසක් වෙන්කිරීමයි. එවිට රටේ ජාතික ආදායමත්, ජනතාවගෙන් ලබා ගන්නා බදු මුදලත් ජනතා වුවමනාවන් වෙනුවෙන්ම වෙන් කෙරේ. ධනවාදී රටක මෙන් එය සුළු පිරිසකගේ සුඛ විහරණය සඳහා පමණක් නොයෙදවේ.



"ධනපති ක්‍රමය පරදවා සමාජවාදය ජයග්‍රහණය කළ බවත් සමාජවාදය තහවුරු වූ බවත් සහතික වශයෙන්ම පිළිගත හැක්කේ නිර්ධන පංති රාජ්‍ය බලය. තමන්ට විරුද්ධ සූරාකන්නන්ගේ සියලු ප්‍රතිරෝධනයන් සම්පූර්ණයෙන්ම මැඩපවත්වා ස්වකීය ප්‍රධානත්වය හා ස්ථාවරභාවය නිශ්චය ලෙසම ඇති කරගෙන, මුළු මහත් කර්මාන්තයම මහා පරිමාණ සාමූහික නිෂ්පාදන සහ නවීන තාක්ෂණික පදනමක් මත ප්‍රතිසංවිධානය කළ පසු පමණකි."

**ලෙනින්**
**(1920 ජුනි මාසයේ ලියන ලද ලිපියකිනි)**
**කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර සන්ධානය**
**377 පිටුව**



# සිහින සැබෑවන හෙට දවසක්

සෑම කෙනෙකුම තම තමන්ගේ ජීවිතය ගැන ළමා වියේ සිටම සිහින මවමින්, දකිමින් හිඳී. "මම ලොකු වුණාම මේ වගේ කෙනෙක් වෙනවා" යැයි කුඩා දරුවන්ගේ මුවින් නික්මෙන්නේ ඒ සිහිනයි. කුඩා දරුවන් වයසින් වැඩෙත්ම ඒ සිහිනයට තව තවත් සිහින එක් කර ගනී. ඒත් ඒ සිහින සැබෑ කරගැනීමට හැකි වන්නේ කීයෙන් කීදෙනාටද? සිහින සැබෑ කරගැනීමට තිබිය යුතු මූලික දේවල් අතරින් යමෙකු ජීවත් වන වටපිටාවටද හිමිවන්නේ ප්‍රධාන තැනකි.

අප ජීවත්වන්නේ කුමන වටපිටාවක් සහිත භූමියකද? ණය බරින්, බදු බරින් පීඩිත වූ රටකය; හැම දෙයකටම අධික මිලක් ගෙවීමට සිදුව ඇති රටකය. පවුල නැමැති කුඩාම ඒකකය ගත්විට ඒ පවුලේ ආහාර සඳහා, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සඳහා, අධ්‍යාපන කටයුතු සඳහා වන වියදම ඉතා විශාලය. බහුතරයක් පවුල්වල දෙමව්පියන් දෙදෙනාගෙන් බොහෝ විට ස්ථිර රැකියාවක් සඳහා නික්ම යන්නේ එක් අයෙක් පමණි. දෙමාපියන් දෙදෙනාම රැකියාවල් කරන පවුල් ඒකකවල පවා ආහාර, සෞඛ්‍යය, අධ්‍යාපන යන මූලික කටයුතු පවා ඉටු කරගැනීමට ඔවුන්ගේ මාසික වේතන ප්‍රමාණවත් නොමැති තරම්ය. ඒ නිසා ණයක් නොගත්, තමා සන්තක රන් ආභරණ උකස් නොකළ පවුලක් සොයා ගැනීමට නොහැකි තරම්ය. ඒ තරමටම ආර්ථික අර්බුදය ඉහළ ගොස්ය. ගහෙන් වැටුණු මිනිසාට ගොනා අනින්නා සේ මෑත කාලයේ රුපියල කඩා වැටීමද වේගවත් වී ඇත. එනිසා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල මේ වනවිට දැරිය නොහැකි තරමට ඉහළ යමින් තිබේ.



කෘෂිකාර්මික හා කාර්මික අංශයේ වර්ධනයක් නොමැති රටක, ණය මත හා බදු මත ආර්ථිකය ගෙන යාමට තැත් කරන රටක ජනයාට අත්ව ඇත්තේ කෙබඳු ජීවිතයක්ද? දිනෙන් දින ඉහළ යන ජීවන වියදම හමුවේ කාන්තා, පිරිමි, වැඩිහිටි, තරුණ, ළමා යන සියලු දෙනාම හැම පැත්තකින්ම පීඩාවට පත්වෙමින් ඇත. මානසික සෞඛ්‍යයට අත්‍යාවශ්‍ය වන විවේකය, විනෝද කටයුතු ඔවුන්ගේ ජීවිතවලින් ඈත් වී තිබෙනවා පමණක් නොව අත්‍යවශ්‍ය මූලික දේවල්වලට කළ වියදම් පවා කප්පාදු කිරීමට ඔවුන්ට සිදුව ඇත. දිනෙන් දින ජීවිත අසීරුතාවන්ට ලක්වෙමින් ඇත. කුඩා දරුවන්ගේද වැඩිහිටියන්ගේද සිහින බිඳ වැටෙමින් ඇත්තේ මෙවැනි තත්වයක් තුළය.

ජීවිතයේ සිහින එකිනෙක බිඳ වැටෙද්දී, අපේක්ෂාවන් කඩ වෙද්දී තිබෙන එකම විසඳුම ජීවිතයෙන් පලා යාම යැයි ඇතැම්හු සිතති. එම සිතිවිල්ල කෙතරම් බරපතළ වී ඇත්ද කියතොත් එය සමාජ ගැටලුවක් දක්වාම වර්ධනය වී ඇත්තේ 60, 70 දශකවල සිටය. ලෝකයේ නිර්ණායකවලට අනුව සැලකෙන්නේ ජනගහනයෙන් ලක්ෂයකට 15ක් සියදිවි නසා ගැනීම සමාජ ගැටලුවක් ලෙසය. 70 දශකයේ සියදිවි නසා ගැනීම ලක්ෂයකට 19කි. 2018 වසර වනවිට එය ලක්ෂයකට 35.3 දක්වා ඉහළ ගොස් ඇත. ලෝකයේ සියදිවි නසා ගැනීම්වලින් ඉහළින්ම සිටින රට බවටද අප රට පත්ව ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ආසියානු කලාපයේ සිදුවන මරණවලින් 60%ක් සියදිවි නසා ගැනීම්ය. දිවි නසා ගන්නා අයගෙන් වැඩි ප්‍රමාණය තරුණ වියේ සිටින වයස අවුරුදු 15 - 44ත් අය වීම බරපතළ කාරණයක් වේ. සමීප සබඳතා බිඳ වැටීම මෙන්ම විරැකියාව, දුගී බව, ණයගැති බව වැනි ජනතාව අතර පවතින දරිද්‍රතා මට්ටම ඉහළ යාම හේතුවෙන් සියදිවි නසා ගැනීම් වර්ධනය වී ඇති බව පෙනේ. වර්තමාන සංඛ්‍යාලේඛනවලට අනුව ලංකාවේ සියදිවි නසා ගැනීමට තැත් කිරීම්වලදී පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ගේ ප්‍රමාණය වැඩි බව වාර්තා වේ. ජීවිතය පවත්වා ගැනීමට නොහැකිව, ගත් ණය ගෙවා ගැනීමට නොහැකිව බොහෝ කාන්තාවන් තම දරුවන්ද සමඟ දිවි තොර කරගැනීමේ සිදුවීම් වසරකට කීයක් නම් වාර්තා වී ඇද්ද?

කාන්තාවන් වන අප කළ යුත්තේ ප්‍රශ්න හමුවේ තම දරුවන්ද සමගින් ජීවිතයෙන් පලා යාම හෝ නිහඬව සියලු දෙය විඳදරා ගැනීම හෝ නොව අප පෙළන සමාජය යහපත් ලෙස වෙනස් කරගැනීම වෙනුවෙන් අපට හැකි ආකාරයෙන් කටයුතු කිරීමය. අප මුහුණ දෙන සමාජ ගැටලුවලට ධනපති පාලකයන් විසඳුම් ලබා දේ යැයි සිතා තවදුරටත් අප මුලාවේ වැටිය යුතු නැත. ඊනියා නිදහසින් පසු වසර 70ක අත්දැකීම් ඒ සඳහා වුවමනාවටත් වඩා වැඩිය.

**අප වෙනුවෙන්, අපේ අනාගත පරපුර වෙනුවෙන් පෙරට ආ යුත්තේ අපමය. වර්තමානය වනවිට කාන්තාවන් යම් ප්‍රමාණයක් මෙය තේරුම් ගෙන කටයුතු කළද එය ප්‍රමාණවත් නොවේ. අපට වඩ වඩාත් අවැසි වනුයේ ඉරණම සියතට ගත් කාන්තා පරපුරකි.**

බහුතරයක් කාන්තාවන් මෙය නිවැරදිව වටහාගෙන තමන්ගේත් තම දරුවන්ගේත් අයිතීන් වෙනුවෙන් පෙරට එන්නේ නම්, නිවැරදි දේශපාලන බලවේගයක් සමඟ පෙළගැසෙන්නේ නම් සැමට සතුටින් ජීවත් විය හැකි සමාජයක්, අපේක්ෂා යථාර්ථයක් වන සමාජයක් නිර්මාණය කිරීම සිහිනයක් නොවනු ඇත.

## ලිප ගිනි මෙළවෙන තොක්...



අහා බලන්
මේ විසූක දස්සන..
දමා දිය සැළියට කකුළුවන්
මොලවති ගින්දර
කමින් කිරිබත්..

දන්සැල්ය දොර දොර
දනන් කා බී තුටුවෙන
සල්පිල්ය හොර රහසින
වැඩිම ලංසුවට විකිණෙන..

අහා මේ පුර
රෙ ක්තමතිය දැයි සැකයෙන
රනිස්සදා හඬ අතරින
ඉද හිටක වෙඩි හඬත් රැව්දෙන..

අහා මේ පුර
මංගෙ කොල්ලකරුවෝ
බියෙන් සලිතව පෝරකය ළඟ
පිනුම් ගසති...
ගිනි දළු බුර බුරා නැගෙන විටත්
සැළියෙහි නටන
කකුළුවන් දැක..



## රූ සටහන්





**2018 ලෝක ළමා දිනය වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ අයිතීන් උදෙසා කාන්තාවෝ විසින් ළමුන් වෙනුවෙන් සංවිධානය කළ "සතුටු සිනා නැණ වඩනා අපේ දිනය" වැඩසටහනේ අවස්ථාවන් කිහිපයක්...**





ඉතිහාසයේ කතාව... ශ

# ඉතිහාසය ආපසු ගමන් කරයිද?



සමාජය තුළ දේපළ මත පංතීන් බිහිවූ දා සිට ඉතිහාසය යනු පංති සටන්වල ඉතිහාසයක් විය. එය සත්‍යයකි. මෙම කාල වකවානුවේ ඉතිහාසයේ ගමන්මඟ තීරණය කරන ප්‍රධාන දයලෙක්තිකය වූයේ පංති සටනයි. සමාජ ක්‍රම එකක් වැටී තවෙකක් ලෙස බිහිවීම සිදුවූයේ පංති සටන්වල ප්‍රතිඵල ලෙසය. පංති සමාජය ඇරඹුණු දා සිට ඉතිහාසය තුළ සමාජයේ බොහෝ දේ තීරණය කරනු ලැබුවේ දේපළ සබඳතාවල ස්වභාවය හා පංතීන් අතර සටන විසිනි. ඒ අතර ඉතිහාසයේ ගමන්මඟ තුළ දැකිය හැකි තවත් ක්‍රියාවලියක්ද තිබේ.

**ගැටලු විසඳීමේ ඉතිහාසයක්**

"ඉතිහාසය විසින් ඉදිරිපත් කරනු ලබන්නේ, එයට විසඳිය හැකි ගැටලු පමණකි" යනුවෙන් වරක් මාක්ස් පැවසීය. එහෙත් ඒ සමග මාක්ස් එයටම මෙම අදහසද එක්කළේය. ඒ "ඉතිහාසය එම ගැටලු විසඳන්නේ නව ගැටලු මතු කිරීමෙනි" යනුවෙනි. ඒ අනුව ඉතිහාසයේ ගමන්මගේ තවත් ස්වභාවයක් අපට මුණගැසේ. ඒ ගැටලු නිර්මාණයවීම හා ගැටලු විසඳීමය. මුළු මානව ඉතිහාසයම තමන් ඉදිරිපිට නිර්මාණය වූ ගැටලුවලට විසඳුම් සෙවීමේ ඉතිහාසයක් බව ඉතා පැහැදිලිය. එහෙත් මානව ඉතිහාසය තුළ, මිනිසා ඉදිරිපිට මිනිස් සමාජය තුළ නිර්මාණය වන ගැටලු විසඳා අවසන් වන දිනයක් එළඹෙන්නේ නැත. ඒ එක් ගැටලුවක් විසඳන විට තවත් ගැටලුවක් මතුවන නිසාය. දැන් මේ අනුව සමාජයේ ඇති ගැටලුවලට විසඳුම් සෙවීම නිරර්ථක ක්‍රියාවක් වන්නේ යැයි එය අත්හැර දැමිය යුතු නැත.

මාක්ස් මෙලෙස පවසා ඇත්තේ, සමාජ සංවර්ධනයේ ස්වභාවයයි. තමන් ඉදිරිපිට නිර්මාණය වන ගැටලු සියල්ල විසඳා අවසන් වන දිනයක් ගැන සිතන්න. එදාට සිදුවන්නේ කුමක්ද? මිනිසාට කිරීමට කිසිවක් නැති හිස් තත්වයක් ඇති නොවේද? එදාට විද්‍යාවෙන් වැඩක් නොවනු ඇත. ඒ, ඉන් විසඳීමට ගැටලු නැති නිසාය. අධ්‍යාපනය අනවශ්‍ය වනු ඇත. ඒ දැනුම අවශ්‍ය නොවන නිසාය. මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකරන සියලු ආයතන, පර්යේෂණ ආයතන වසා දැමීමට සිදුවනු ඇත. එහෙත් එවැන්නක් කිසිවිට සිදුවන්නේ නැත. මන්ද හැම විටකම මිනිසා ඉදිරිපිට විසඳිය යුතු නව ගැටලු මතුවන නිසාය. ඉතිහාසයට ගමන් කළ හැක්කේ එසේ පමණි. නැත්නම් ඉතිහාසය නතරවනු ඇත. ගෝලීයකරණයේ උච්ඡතම අවස්ථාවේදී ඉතිහාසය ඉන් එහාට නොයන බවත් ඉතිහාසය නතරවන බවත් පැවසුවේ එක්සත් ජනපදයේ ෆුකුයාමා ය. එහෙත් එය එසේ වූයේ නැත. එබැවින් පංති පිළිබඳ ප්‍රශ්නය පසෙක තැබුවද සමස්ත ඉතිහාසයේ ගමන්මඟ ගැටලුවලට විසඳුම් සෙවීමේ ගමන්මගක් වේ. ඉතිහාසය 'ඉදිරියට ගමන් කරන බව' අප පවසන්නේ ඒ අනුවය. විද්‍යාව, උපකරණ, තාක්ෂණය, යන්ත්‍රසූත්‍ර, දර්ශනය යන මේ සියල්ල බිහිවූයේ ඉතිහාසය තුළ මිනිසුන් තමන් අභිමුව ඇති ගැටලු විසඳීමට ගත් උත්සාහය තුළය.

**ඉතිහාසයේ රෝදය**

ඉතිහාසය ආපසු ගමන් නොකරන බවත් 'ඉතිහාසයේ රෝදය' ආපසු කැරකැවිය නොහැකි බවත් මාක්ස්වාදීහු නිතර අවධාරණය කරති. එසේ කීමට හේතුවක්ද තිබේ. ධනවාදී චින්තනයට අනුව ඉතිහාසය යනු සිදුවීම්වල එකතුවක් සේම එකම දේ යළි යළි සිදුවන දෙයක් ලෙස සැලකේ. ඔවුනට ඇත්තේ ඉතිහාසය පිළිබඳ අවිද්‍යාත්මක මතයකි. එසේම පාරභෞතිකවාදී චින්තනයට අනුව ඉතිහාසයේ ගමන්මඟ චක්‍රීය එකකි. එය එකතැන කැරකැවේ. ඒ අනුවද ඉතිහාසයේ එකම දේ නැවත නැවත සිදුවේ. වරක් මෙවන් අදහසක් ජර්මානු දාර්ශනික හේගල්ද පවසා තිබුණි. 'ලුවී බොනපාට් ගේ බෲමර් 18 දා' නම් ලිපියේ මාක්ස් ඒ පිළිබඳව සඳහන් කර තිබුණේ මෙසේය. "**ලෝක ඉතිහාසයේ ඉතා වැදගත් සිද්ධීන් හා පෞරුෂත්වයන් දෙවරක් ඇතිවන බව කිව හැකි යයි හෙගල් වරක් පැවසීය. එහෙත් ඔහුට මෙලෙස එකතුකිරීමට අමතක විය; ඒවා ඇතිවන්නේ ප්‍රථම වරට ඛේදජනකයක් ලෙසත් දෙවැනි වර හාස්‍යජනකයක් ලෙසිනි**" ප්‍රංශයේ නැපෝලියන් පාලනයේ ස්වභාවයද සඳහන් කරමින් මාක්ස් හෙගල්ව තියුණු උපහාසයට ලක්කරන්නේ එසේය.

ඉතිහාසය තුළ එකම දේ එකම ලෙස යළි යළි සිදුවන්නේ නැත. ඒවා එලෙස පෙනුනද ඒවා සිදුවන්නේ නව තත්වයන් තුළ වෙනස්කම් සහිතවය. පොදුවේ ගත් කළ ඉතිහාසය ගමන් කරන්නේ ඉදිරියටය. එය සරල තත්වයේ සිට සංකීර්ණ තත්වයක් දක්වාද ම්ලේච්ඡත්වයේ සිට සභ්‍ය සමාජය දක්වාද නොදැනුමේ සිට දැනුම දක්වාද අවිද්‍යාවේ සිට විද්‍යාව දක්වාද වන ආකාරයෙන් ඉදිරියට ගමන් කරයි. ඉතිහාසයේ ගමන්මඟ ප්‍රගතිගාමීය. එය නතර කිරීමට හෝ ආපසු හැරවීමට කිසිවකුට නොහැක. ඉතිහාසයේ ගමන නැවැත්වීමට උත්සාහ කළ බොහෝ දෙනා සිටින්නේ ඉතිහාසයේ කසළ ගොඩේය. කෙතරම් වහලුන් මර්දනය කළද රෝමයේ පාලකයිනට වහල් ක්‍රමය සදාකාලිකව තබා ගැනීමට නොහැකි විය. එසේම ප්‍රංශයේ ලුවී රජුටවත්, රුසියාවේ සාර් නිකොලායිටවත් වැඩවසම් ක්‍රමය සදාකල් තබා ගැනීමට හැකි වූයේ නැත. සියලු බාධා මැද ඉතිහාසය ඉදිරියට වඩා යහපත් අනාගතයක් වෙත ගමන් කර ඇත. ගමන්කරමින් සිටී. සත්‍යය එයයි.

> තමන් ඉදිරිපිට නිර්මාණය වන ගැටලු සියල්ල විසඳා අවසන් වන දිනයක් ගැන සිතන්න. එදාට සිදුවන්නේ කුමක්ද? මිනිසාට කිරීමට කිසිවක් නැති හිස් තත්වයක් ඇති නොවේද? එදාට විද්‍යාවෙන් වැඩක් නොවනු ඇත. ඒ, ඉන් විසඳීමට ගැටලු නැති නිසාය. අධ්‍යාපනය අනවශ්‍ය වනු ඇත. ඒ දැනුම අවශ්‍ය නොවන නිසාය. මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකරන සියලු ආයතන, පර්යේෂණ ආයතන වසා දැමීමට සිදුවනු ඇත. එහෙත් එවැන්නක් කිසිවිට සිදුවන්නේ නැත. මන්ද හැම විටකම මිනිසා ඉදිරිපිට විසඳිය යුතු නව ගැටලු මතුවන නිසාය.

**සර්පිලාකාර වර්ධනයක්**

ඉතිහාසයේ ගමන්මඟ පිළිබඳ දාර්ශනික විග්‍රහයක් කළ මාක්ස් - එංගල්ස් ඉතිහාසයේ ගමන්මගේ සංවර්ධනය සිදුවන්නේ සරල රේඛාවක ආකාරයෙන් නොවන බවත් එය සර්පිලාකාර වර්ධනයක් බවත් තහවුරු කළේය. මාක්ස්වාදයට අනුව දයලෙක්තික නියාමනයන්ට අනුව අන් සෑම දෙයක මෙන්ම ඉතිහාසයේ ගමන්මඟ හා එහි වර්ධනය සිදුවන්නේ සර්පිලාකාරවය. ඉතිහාසය එක් තැනකින් ආරම්භ වී සරල රේඛාවක් සේ ඉදිරියට යන්නේ නැත. එය ගමන් කරන්නේ සර්පිලයක ආකාරයෙනි. එහි වර්ධනයන් සේම පසුබැම්ද තිබේ. ජයග්‍රහණ සේම පරාජයන්ද තිබේ. සර්පිලාකාර වර්ධනය මාක්ස්වාදයේ හඳුන්වන්නේ තමන් ආරම්භ කළ තැනට ආපසු පැමිණීමට මෙන් පෙනෙන එහෙත් කිසිදා ආපසු සිටි තැනටම නොපැමිණෙන වර්ධනයක් ලෙසටය. අපට ඉතිහාසයේ අඳුරු කාල පරිච්ඡේද හමුවන්නේ මේ නිසාය. ඉතිහාසය ආපසු ගමන්කරනු සේ පෙනෙන්නේ මේ නිසාය. එහෙත් ඉතිහාසය යළි හිටපු තැනට ආපසු ගමන් නොකරයි. එක් යුගයක්, එක් නිෂ්පාදන මාදිලියක් අභාවයට යවමින් නව මාදිලියකට, නව යුගයකට උපත දෙමින් හා පසුව ඒවාද අභාවයට යවා නවතම සමාජ රටාවකට උපත දෙමින් ඉතිහාසය අඛණ්ඩව ඉදිරියට ගමන් කරයි.

**නිෂ්පාදන බලවේග හා සබඳතා**

සමාජ සංවර්ධනයේදී පොදුවේ 'සමාජය' ගත් විට එහි වර්ධනය තීරණය කරන ප්‍රධාන සාධක නැතිනම් එහි ප්‍රධාන දයලෙක්තික සබඳතාවය වන්නේ මිනිස් සමාජය හා සොබාදහම අතර වන අනවරත අන්තර් සම්බන්ධය හා අන්තර් ක්‍රියාකාරිත්වය වේ. ඒ අනුව මිනිසා සොබාදහම තුළින් තම සමාජ පැවැත්මට අවශ්‍ය දේ සපයා ගන්නා අතර මිනිස් ක්‍රියාකාරකම් මගින් සොබාදහම වර්ධනය වේ. නැතිනම් එසේ විය යුතුවේ. එහෙත් සමාජය තුළ දේපළ මත පංති බිහිවූ පසු සමාජ සංවර්ධනයේ එම දයලෙක්තික සම්බන්ධය යට ගොස් ඒ වෙනුවට පංති සටන මතුවිය. පංති සමාජය තුළද සමාජ සංවර්ධනයේ හෙවත් ඉතිහාසයේ ගමන්මගේ දයලෙක්තික සබඳතාවය වන්නේ නිෂ්පාදන බලවේග හා නිෂ්පාදන සබඳතා අතර පවතින ගැටුමය.

සමාජය තුළ නිතරම නිශ්චිත නිෂ්පාදන මාදිලියක් පවතින අතර එම නිෂ්පාදන මාදිලිය තුළ ප්‍රධාන දයලෙක්තික සබඳතාවන් පවතී. ඒ නිෂ්පාදන බලවේග (ශ්‍රමය හා යන්ත්‍ර සූත්‍ර) හා නිෂ්පාදන සබඳතා (නිශ්චිත සමාජ ක්‍රමයක් තුළ නිපදවීම, බෙදාහැරීම හා පරිභෝජනය යන ක්‍රියාවලියේදී මිනිසුන් එකිනෙකා අතර ඇති ඇසට නොපෙනෙන සම්බන්ධතාවය) අතරය. එහිදී පවතින නිෂ්පාදන සබඳතා නිෂ්පාදන බලවේගයන්ට බාධාකාරී වනවිට බලවේග හා සබඳතා අතර ගැටුමක් හට ගනී. පන්ති සමාජයේදී 'පංති සටන' ලෙස අප දකින්නේ එයයි. එම ගැටුම අවසානයේ නිෂ්පාදන බලවේග විසින් කිසියම් අවස්ථාවක තමන්ගේ වර්ධනයට බාධා කරන, තමන්ට විලංගු බවට පත්ව ඇති නිෂ්පාදන සබඳතා පුපුරුවා හැර නව නිෂ්පාදන සබඳතාවන් ගොඩනගා ගනී. සමාජ විප්ලවයක් ලෙස අප සලකන්නේ එම අවස්ථාවය.

අපගේ මානව සමාජය ඉතිහාසය තුළ පෙරට යමින් තිබෙන්නේ එසේය. ඒ අනුව ආරම්භක මානව සමාජයේ සිට මෙම මූලික නියාමයන් ක්‍රියාත්මක වූ ආකාරයද සමග සමාජය යුගයෙන් යුගය විමසා බැලිය යුතුව තිබේ.



"ඔබ ගැන අන් අයට පැහැදිලි කිරීම් නොකරන්න. මන්ද ඔබේ මිතුරන්ට ඒවා අවශ්‍ය නොවන නිසාත් ඔබේ සතුරන් ඒවා විශ්වාස නොකරන නිසාත්ය."

**අබ්දුල් කලාම්**

# ධනවාදයේ අර්බුදය හා අලි මිනිස් ගැටුම


දළදා මාලිගාවේ රාජා. පනාමුරේ ඇත් රාජා, ගජබා වන්නම, ඔන්න බබෝ ඇතින්නියා වැනි නැළවිලි ගී විවිධ කාව්‍ය හා ගීත අලි ඇතුන්ට සම්බන්ධ සංස්කෘතික ගුණාංග සත්‍ය සිදුවීම් හා නිර්මාණයන්ය. වර්තමානයේ දළ පූට්ටුවා, ඇත් දළ, අලි මිනිස් ගැටුම අපට හුරු අලි සම්බන්ධ නිතර ඇසෙන වදන්ය. සංකෘතිකමය නිර්මාණයන් බොහොමයකින් පෙන්වන කරුණ වනුයේ අතීතයේ සිට ශ්‍රී ලාංකේය සංස්කෘතිය අලින් සමග සමීපව කටයුතු කර ඇති බවයි.

ශ්‍රී දළදා මාලිගාවේ රාජාගේ කතාන්දරය යම් ජාතිකත්ව සහජීවනයක් පෙන්නුම් කිරීමක් සැඟව ඇත. රාජා ඉපදී ඇත්තේ මඩකලපු දිස්ත්‍රික්කයේ එරාවුර් ප්‍රදේශයේ කැලෑවකය. උමාරු ලෙබ්බේ පනික්කාර ප්‍රමුඛ මුස්ලිම් ජාතිකත්ව කණ්ඩායමක් මෙම ඇත් පැටවා ඇල්ලා 1925 දී ටිකිරි බණ්ඩා මාපිටිය දිසාවේට විකුණා ඇත. ප්‍රථමයෙන් මෙම ඇත්පැටවාට පනික්කාර් යන නම තැබූ අතර, පනික්කාර් පසුව රාජා විය. කෙසේ වෙතත් උමාර් ලෙබ්බේ පනික්කාර් විසින් මෙම ඇත් පැටවා මනාව පුරුදු පුහුණු කර දළදා මාලිගාවට පූජා කරන ලදී. 1937 සිට 50 වතාවක් පෙරහැරේ ගමන්කර ඉන් 37 වතාවක් රන්දෝලි පෙරහරේ දළදා කරඬුව වැඩම කරවන ලදී. කිසි දිනෙක කලබලයක් සිදු නොකළ රාජා මංගල ඇතකු ලෙස ලොව ප්‍රචලිත විය. මෙම හේතුව නිසාවෙන්ම රාජා ජාතික වස්තුවක් ලෙස 1986 නම් කිරීමට පාලකයින්ට සිදුවිය.

රාජාගේ ශික්ෂණය පුරුදු පුහුණු කළ උමාර් ලෙබ්බේ පනික්කාර් රුඃ 1000 නෝට්ටුවේ රාජා ළඟින් සිටගෙන සිටින ඡායාරූපයේ දැකිය හැකිය. වර්තමානයේ දළදා කරඬුව වැඳ පුදා ගන්නා උපාසක උපාසිකාවෝ රාජාටද නමස්කාර කරති. නමුත් බොහෝ උපාසක උපාසිකාවන්ට උමාර් ලෙබ්බේලා පැවත එන මුස්ලිම් ජාතිකත්‍වය 'අරහං' කිරීමට ධනපති නායකයන්ට හැකියාවක් නිර්මාණය වී ඇත. මහනුවර, දිගන. අම්පාර, බේරුවල දර්ගා නගරවල පසුගිය කාලයේ සිදුවූ සිද්ධීන් එය කදිම නිදසුනකි. පෙර ඉතිහාසයේ ගජබා වන්නම, විවිධ වූ ජන කවි ශ්‍රී ලාංකේය සංස්කෘතිය අලංකාර කර ඇත. අලි ඇතුන් මුස්ලිම් ජාතිකත්‍වයට, ද්‍රවිඩ ජාතිකත්‍වයට මෙන්ම සිංහල ජාතිකත්‍වයටද පොදු සංස්කෘතික ලක්ෂණයකි.

වෙනත් මානයකින් විග්‍රහ කළවිට පනාමුරේ ඇත් රාජාට හිමිවනුයේ වෙනත් වූ සුවිශේෂී ස්ථානයකි. 1950 දී මඩුවන්වෙල දිසාවේට අයත් පනාමුරේ ඇත් ගාලට කොටු කරන ලද වන අලි 16ක් වෙනුවෙන් සටන් කළ, දැවැන්ත ශක්තියකින් හෙබි හස්තියෙකි. මොහුගේ විශේෂත්වය වූයේ තම වර්ගයා මෙල්ල කිරීමට පැමිණෙන හීලෑ අලින් මෙන්ම ඔවුන් මෙහෙයවා මිනිසුන් සමග සටන් කොට තම සගයින් බේරා ගැනීමට උත්සාහ කිරීමයි. අවසානයේ ඔහුව වෙඩිතබා ඝාතනය කරන ලදී. මේ සමගම එවක සිටි ආණ්ඩුකාරවරයා ඇත් ගාල් තහනම් කර අලින් ඝාතනය කිරීම තහනම් කරන නියෝගයක් නිකුත් කරන ලද්දේ මෙම අලියා සිදු කළ සටන දැකීමෙනි. පනාමුරේ ඇත් රාජාගේ සටන දිවි පුදා ලද ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි අතර, ලාභය වෙනුවෙන් ධනපති ක්‍රමය විසින් පවත්වාගෙන එන ලද ක්‍රමවේදයක් ආපසු හරවන්නට හැකිවීම අලියකු විසින් සිදුකරන ලද සටනක ප්‍රතිඵලයක් වීම ඉතිහාසගත වී ඇත. මෙම ස්වායත්ත සිදුවීම් ද්විත්වය වර්තමානයේද ලාංකේය ජනතාවගේ මතකයේ තැන්පත් වී ඇති ඇති අලි සම්බන්ධ සානුකම්පිත සිදුවීම්ය. එහෙත් වර්තමානයේ තත්වය වෙනස් වෙමින් තිබේ. අලින් සම්බන්ධයෙන් මිනිසුන් අතර වර්ධනය වෙමින් ඇත්තේ සතුරු ආකල්පයකි.

වර්තමානය වනවිට අලි මිනිස් ගැටුම උච්චතම අවස්ථාවකට පැමිණ ඇත. එය පසුගිය වසර 10 තුළ සිදුවූ අලි හා මිනිස් මරණ ප්‍රමාණය සැලකූ විට පසුගිය වසර 12 සැලකීමේදී අලි මිනිස් ගැටුම හේතුවෙන් අලි 03 ක් මිය යන විට මිනිසුන් එක් කෙනෙකු මිය යයි. එය ප්‍රස්ථාරයකින් නිරූපනය කළ විට ඉහත පරිදිය.





අලි සහ මිනිසුන් අතීතයේ ඉතා සහජීවනයෙන් ජීවත්වූ අතර විවිධ වූ නිෂ්පාදන ක්‍රියාවලීන් හා ඉදිකිරීම් සඳහා අලි ඇතුන් යොදා ගනු ලැබිණි. අතීතයේ එනම්, යටත්විජිත සමය වන විට ශ්‍රී ලංකාවේ අලි ගහනය 15,000-20,000 අතර සිටි බවට සාක්ෂි ඇත. සාමාන්‍යයෙන් අලියකු වසර 60-75 ජීවත්වන අතර බර කිලෝග්‍රෑම් 2000 -5500 දක්වා වේ. දිනකට ආහාර ලෙස කිලෝග්‍රෑම් 150-350 ආහාරයට ගන්නා අලියකු ජලය ගැලුම් 25 -50 දක්වා වූ ප්‍රමාණයක් පානය කරයි.

අලියකු ආහාර, ලිංගික, පාරිසරික ආරක්ෂාව සඳහා සංචරණය කරයි. (දළ වශයෙන් දිනකට කිලෝමීටර 25 පමණ දෛනික අවශ්‍යතා සඳහා සංචරණය කරයි) සාමාන්‍යයෙන් අලියකු දිනකට පැය 15-16 ක්‍රියාකාරීව සිටී. අලි වනාන්තර තුළ ඉතා සාමකාමීව සැහැල්ලුවෙන් කාලය ගතකරති. දැනට වසර 40,000 කට පමණ පෙර ජීවත් වූ මැමත්ගෙන් පරිණාමය වූ බව විශ්වාස කෙරෙන අලි ප්‍රධාන ලෙස අප්‍රිකා හා ආසියා මහාද්වීප තුළ ජීවත් වේ. අප්‍රිකානු අලි ඃඔදංදාදබඒ ʾරෙසඒබ්* ආසියාතික අලි (Elephant Maximus) ශරීර ලක්ෂණ අනුව වෙනස්ය. දැනට ශ්‍රී ලංකාව, ඉන්දියාව, නේපාලය, භූතානය, කාම්බෝජය, ඉන්දුනීසියාව, ලාඕසය, මැලේසියාව. මියන්මාරය, තායිලන්තය ආදී අටවල් 13ක ආසියා මහාද්වීප තුළ අලි දැකිය හැකිය. අනෙක් බොහෝ ආසියාතික රටවල අලි වඳවී ගොස් හමාරය. ආසියාතික අලි ගහනය 35,000-50,000 අතර වේ යැයි අනුමාන කෙරේ. මේ හේතුව නිසාම ජාත්‍යන්තර පාරිසරික සංරක්ෂණ සංගමය (International Union for Conservation for Nature- IUCN) විසින් අලින් වඳවී යන සත්වයකු ලෙස නම්කර සංරක්ෂණය කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. එහි ප්‍රතිඵලයක් ලෙස අලියකු ඝාතනය කළ විට ඒ සඳහා දැඩි නීති රාමුවක් ශ්‍රී ලංකාව තුළ අලින්ගෙන් පීඩා විඳින මිනිසුන්ට පමණක් ක්‍රියාත්මකය. අලි සංරක්ෂණය සඳහා රජය එක් අමාත්‍යාංශයකට (වනජීවී අමාත්‍යාංශය) වගකීම පවරා අනෙක් සියලු රාජ්‍ය ආයතනවලින් ස්වයත්ත කොට වගකීමෙන් නිදහස් වී ඇත.

අලින් වෙනත් සතුන්ට වඩා තරමක් දියුණු පැවැත්මක් පෙන්වයි. මෙහිදී අලි රංචුවක නායිකාව ලෙස වයසින් වැඩි ඇතින්නක් දැකිය හැකි අතර, ලිංගිකව මෝරන පිරිමි සතුන් රංචුවෙන් එළවා දැමෙයි. ලේ ඥාතිත්වයක් සහිත පැටවුන් බිහිවීම වැළැක්වීම මෙහි පරමාර්ථය යැයි හඳුනාගෙන ඇත. අලි පැටවකු ආරක්ෂා කිරීම රංචුවේ සාමුහික වගකීමක් ලෙස භාර ගැනෙන අතර, අලි පැටවකු බිහිවූ විට සියලු ඇතින්නියන්ට කිරි එරෙනවා යයි මතයක් ව්‍යවහාරයේ පවතී.

ශ්‍රී ලංකාවේ අලි ගහනයේ කඩා වැටීම සිදුවූයේ යටත්විජිතකරණය හා ධනපති ආර්ථික මොඩලය උත්රාරොපණය කිරීමත් සමගය. ධනවාදය තුළ සුළඟට, ජලයට, සතා සීපාවාට, ප්‍රභාසංස්ලේෂණයෙන් හටගනු ලබන ඵලය ආදී සියලු දෑ සඳහා මිලක් නියම කර ඇත. ධනවාදය තුළද අලින්ටද මිලක් නියම විය. කෙසේ වෙතත් බ්‍රිතාන්‍ය යටත්විජිතකරණයෙන් පසු උඩරට වතු වගාව හඳුන්වාදීමත් සමග සෞම්‍ය දේශගුණයේ තෙත් කලාපයට බරව නිදහසේ ජීවත්වූ අලි වගා පාලු කරන සත්වයකු ලෙස නම් කරන ලදී. තෘණ භූමිවල ගැවසීමට හා ආහාර ගැනීමට දැඩි රුචියක් දක්වන අලින්ගෙන් බහුල හෝර්ටන් තැන්න, පිටවල තැන්න ආදී ප්‍රදේශද, විනෝදයට අලින්ට වෙඩි තබන ම්ලේච්ඡ ක්‍රීඩාපිටි බවට පත්විය. අලි ඇල්ලීම, ගාල් කිරීම, විකිණීම ජයටම කෙරිණි. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබිණි. මේ හේතුවෙන් වතු වගාව ආරම්භ කළ කාල වකවානුව තුළ මධ්‍ය කඳුකරයේ පමණක් අලින් 6000-8000ක ප්‍රමාණයක් ඝාතනය වූ බව වර්තා වේ.

රජ සමයේ සිට ඇමතිවරුන් ආදීන් තම වලව්වල අලින් කිහිප දෙනෙකුම ඇති කිරීම තම කීර්තිය වඩන්නක් බව විශ්වාසයක් පැවතුණි. එය බ්‍රිතාන්‍ය සමයේ සිටි රදලයන්ට මෙන්ම මෑතක සිටි ජනාධිපතිවරුන්, ආරක්ෂක ලේකම්වරුන් සතුවද ආණ්ඩුවේ හිතවතුන් හා ප්‍රසිද්ධ ස්වාමීන් වහන්සේලා සන්තකයේද හොර අලි ඇතුන් සිටියහ. මේ හේතුවෙන් අලි රොෂාන්ලාත් අලි ඇතුන්ට හොර උප්පැන්නවල් නිර්මාණය කරන පශු වෛද්‍ය පියවරුන්ද බිහි විය. විහාරස්ථානයන්හි ගාම්භීරත්වය වැඩි කරන භාණ්ඩයක් බවට අලින් පත්විය. තවද ඇත්දළ හා ගජමුතු ධනය ලැබීමට වාසනාවක් පැදෙන්නක් ලෙස මිත්‍යා මතයක් මිනිස් සිත් සතතන් තුලට කිඳා බැස්සවීමට ධනපති ක්‍රමය සමත්ව ඇත.



මේ හේතුවෙන් සමස්ත අලි ගහනයෙන් 2% පමණ වන ඇතුන්ගේ ජීවිත අවධානමකට ලක්ව තිබේ. එය අලින්ට පමණක් නොව රයිනෝ අං, කොටි දත්, මැමත් දළ පොසිල සම්බන්ධයෙන්ද පැතිර ගොස් ඇති මිත්‍යාවකි.

යටත්විජිත සමයෙන් පසු ලැබුණු නාමික නිදහසින් පසුව පහත රට මහා දැවැන්ත වනය එලිපෙහෙළි කොට අස්වද්දන්නට විය. විවිධ අසංවිධිත සංවර්ධන ව්‍යාපෘති සිදු කෙරිණි. අධිරාජ්‍යවාදී සමාගම්වලට කිසිදු වග විභාගයකින් තොරව විවිධ වගාවන් සඳහා වන බිම් විකිණීම බදු දීම සිදුකරන ලදී. මෙවැනි අක්‍රමවත් පරිසර සතුරු සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵල හේතුවෙන් අලි මංකඩවල් අවහිර වී අලි ඇතුන් කුඩා වනබිම් කොටස්වලට සීමා විය. ඒවායේ ඔවුනට අවශ්‍ය සම්පත් සීමිතය. ඔවුනට අවශ්‍ය ආහාර, ජලය, ලවණ ඔවුන් ජීවත් වන වටපිටාවට වඩා පරිබාහිරව ඇති බව අලින්ට සන්නිවේදනය වේ. (අලින්ගේ ආහාර වල ඉව කිලෝමීටර කිහිපයක් ඈතට දැනේ). විශේෂයෙන් ආහාර හා පානීය ජල අවශ්‍යතා සඳහා ගම්වදින අලි වනයේ මෙන් නොව ගම්වල පවතින තරමක කලබලකාරී ස්වරූපය (විවිධ වූ චලනයන්) හේතුවෙන් ඔවුහු තර්ජනාත්මක පරිසරයක් ලෙස ගම හඳුනාගනී. මෙම හේතුවෙන් දැඩි විමසිල්ලෙන් සිටින අලි මිනිසුන්ට පහරදීම හේතුවෙන් දළ වශයෙන් 75-100ක පමණ මිනිස් ජීවිත ප්‍රමාණයක් වසරකට අහිමි වේ.

ධනවාදය තුළ තම වගාවේ ධාන්‍ය, එළවළු ආදී අස්වැන්න ගොවියාට පෙනෙනුයේ මුදල් ලෙසය. අස්වැන්න ධාන්‍යමය හෝ භෝගමය ලෙස නොව මුදල් ලෙස දෘෂ්ටි මායාවක් බවට පත් කර ඇති විට තම අස්වැන්නට හානි පමුණුවන සියලු දෑ කෙරෙහි ගොවීන් තුළ උපදවා ඇත්තේ වෛරයකි. වෙඩි තැබීම්, ගිනි විසිකිරීම්, විදුලි වයර, ඇණ ලෑලි, හක්ක පටාස්, වස දැමූ ආහාර, මර උගුල් ආදී නොයෙක් ක්‍රමවේදයන් භාවිත කොට අලින් ඝාතනය කර තම හේනේ. කුඹුරේ වැවෙන 'මුදල්' රැක ගැනීමට ගොවීහු උත්සාහ දරති.

ධනවාදය තුළ අක්‍රමවත් සංවර්ධනය, ඉඩම් පිළිබඳව විසඳුම් නොමැතිවීම හේතුවෙන් අලින්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් වනයක් ඔවුනට අහිමි කර ඇත. ධනවාදය විසින්

15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2018 ඔක්තෝබර් 10

# යුද ගැටුම්වල තුවාල නඩු අසා විසඳිය නොහැකියි

(හානි පූර්ණ කාර්යාලය පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා



මිනිසුන් තනි තනිව වැරදි කරනවා. ඒ වාගේම, මිනිස්සු සමූහයක් විධියට වැරදි කරනවා. ඒ වාගෙ'ම, මිනිස්සු අනෙක් අය කරන වැරදිවලට ගොදුරු වෙනවා. ඒ වාගේම, ආණ්ඩුවලින් අපරාධ කරනවා. ලෝකයේ ප්‍රසිද්ධම කාරණයක් තමයි වැඩිම අපරාධ කරන්නේ ආණ්ඩුවලින් කියන එක. ලෝකයේ වැඩිම අපරාධ කරන්නේ රාජ්‍යයන්. ඊට පස්සේ සමාගම්, ඊටත් පස්සේ පුද්ගලයන්. ඒ කියන්නේ, පෞද්ගලිකව -තනි තනි පුද්ගලයා- දායක වන අපරාධ තිබෙනවා. නමුත්, බොහෝ අවස්ථාවල සිද්ධ වෙන්නේ ආණ්ඩුවලින් කරන්නා වූ වැරදිවලට එරෙහිව යම් යම් සමාජ විරෝධී ක්‍රියා ඇති වීමයි. ජනතාව පෙළීමේ, ජනවර්ගයා කොන් කිරීමේ, ජන කණ්ඩායමක් හෝ වෘත්තීය සමිති හෝ ශිෂ්‍ය සංගම් හෝ කලාකරුවන් හෝ මාධ්‍යවේදීන් හෝ විරුද්ධ දේශපාලන පක්ෂ හෝ මර්දනය කිරීමේ ප්‍රතිඵලයක් විධියට, සමාජයෙන් ඒවාට පෙරළා ප්‍රතිචාර නැගෙනවා. ඒක නතර වෙන්නේ නැහැ.

අපේ රටේ විශාල වශයෙන් සමාජ අරගල සිද්ධ වෙලා තිබෙනවා. අපේ රට නිදා ගෙන ඉන්න ජනතාවක් සිටින රටක් නොවෙයි. අපේ රටේ ජනතාව සටන් කරනවා. ඒක හොඳ දෙයක්. ආණ්ඩුවලින් කරන ලද මහා දැවැන්ත මර්දන, අපරාධ නිසා ජනතාව ඒ තැන්වලට තල්ලු වෙලා තිබෙනවා. ඒ සටන් ඇතුළේ ඒ සංවිධානවලින් වූ වැරදි හා අඩුපාඩුකම් තිබෙනවා. මිනිස්සු හුදකලාව අපරාධකරුවන් වෙන්නේ නැහැ. කවුරුවත් උපදිනකොට මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස ඉපදෙන්නේ නැහැ. "මධුෂ්කද" කවුද කියන ප්‍රසිද්ධ පාතාල නායකයෙක් ගැන දැන් කියනවා. මම ඒ ගැන දන්නේ නැහැ. සමහර මන්ත්‍රීවරුන් නම් එයා දන්නා බව අපට පෙනෙනවා. නමුත් කවුරුවත් ඒ විධියට උපදින්නේ නැහැ. ඉපදුණාට පස්සේ තමයි මිනිසුන් සමාජයීය තත්ව අනුව ඒ ඒ තැන්වලට තල්ලු වෙන්නේ.

මේ කාර්යාලය දිහා අපි බලන්නේ ඒ ආකාරයෙන්. ඒ නිසා හානි සිදු වූ අයට වන්දි ලබා දීමට පිළිවෙළක් සහිත ක්‍රමවේදයක් හදන එක. හානි වුණු අයට උදව් කරන එක අපි පිළිගන්නවා. මේ කාර්යාලය ආරම්භ කිරීම ජනතා විමුක්ති පෙරමුණ දකින්නේ ඒ දෘෂ්ටි කෝණයෙන්.

1972දී පැවති ආණ්ඩුව මගින් මේ රටේ විශාලම හානි, ඝාතන සිදු වුණා. ප්‍රේමවතී මනම්පේරි සහෝදරිය ඇතුළු 10,000කට ආසන්න පිරිසක් ඝාතනය කළාය කියලා සාමාන්‍ය අදහසක් තිබෙනවා. ආණ්ඩුවලින් ගෙවල් ගිනි තැබුවා. එවැනි දේවල් විශාල ලෙස සිද්ධ වුණා. ඒ නිසා, අඩු ගානේ එතැන් සිට හෝ සාධාරණය ඉටු කළ යුතුයි. යුක්තිය පිසිඳලනවා නම් ඒ අයටත් ඉඩකඩක් තිබිය යුතුයි. ඒ ඉඩකඩ එක සීමාවක් සඳහා පමණක්, එක කාලයකට පමණක් සීමා විය යුතු නැහැ. අඩු ගානේ අපි දන්නා ඉතිහාසය සඳහාත් ඒ අවස්ථාව තිබෙන්න ඕනෑ.

වන්දි ලබා දීමේ ක්‍රියාවලිය ගැන කථා කරපු නිසා ඒ ගැන මම ඉතා කෙටියෙන් කියන්න කැමැතියි. මෙම ක්‍රියාවලියට විනිවිදභාවයක් අවශ්‍යයි. නමුත්, වන්දි ලබා ගන්න ගිය සමහර අවස්ථාවලදී අපි දන්නවා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන තරම් බරපතළ ආකාරයට ලිපි ලේඛන ඉදිරිපත් කරන්න තිබෙන බව. වන්දි ලබා ගන්න ගිය බොහෝ දෙනෙකු එවැනි විශාල දුෂ්කරතාවකට මුහුණ පාලා තිබෙනවා. එම නිසා, ඒ දුන්නු සොච්චම් වන්දිය ගන්නත් හුඟක් අම්මලා ඉදිරිපත් වුණේ නැහැ. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ ඉදිරිපත් කරන ලිපි ලේඛන සරල කරන්න කියලා.

හානිපූර්ණය සඳහා වන මෙම කාර්යාලය හරහා එල්ටීටීඊ සාමාජිකයන් වශයෙන් හිටපු අය පුනරුත්ථාපනය කරලා, ඔවුන්ට සමාජගත වීමට යම් ආකාරයකින් උදවු කළ යුතුද, නැද්ද කියන විවාදය සමාජය තුළ තිබෙනවා. ඒ ගැටුම්වල තනිකර වැරැද්ද ඒ එක් එක් එල්ටීටීඊ සාමාජිකයාගේද? ඔවුන්ටත් වගකීමක් නැහැ නොවෙයි. මම ඒකත් කියනවා. නමුත්, මෙය එල්ටීටීඊ සාමාජිකයන් විසින් තනි තනිව කරපු වැරැද්දක් නොවෙයි. මේක සමාජ ප්‍රශ්නයක්. ඒ නිසා උතුරේ ලක්ෂ ගණනක් ජනතාව තවදුරටත් රට බෙදන පැත්තට තල්ලු කරන්නේ නැතුව, ලංකාව තුළ තියා ගන්න ඕනෑ නම් ඔවුන්ටත් සමාන විධියට සලකන්න ඕනෑ.

යුද්ධය අවසන් වුණේ 2009 මැයි මාසයේ 19වැනිදා. ඊට සතියකට පසුව, අපේ පක්ෂයේ දේශපාලන මණ්ඩලය මගින් මැයි 27වැනිදා යම් යම් වැඩ පිළිවෙළක් යෝජනා කළා. යුද්ධයෙන් පීඩාවට පත් වූ ජනතාව, දෙමළ ජනතාව මුහුණ දී තිබුණු ගැටලු අඩු කරන්න ප්‍රායෝගික විසඳුමක් ඉදිරිපත් කළා. අපි එතැනදී ප්‍රධාන කරුණක් යෝජනා කළා. යුද්ධය සම්බන්ධ සියලු ප්‍රශ්න සම්බන්ධ කර ගත් "සත්‍ය ප්‍රතිසන්ධාන කොමිසමක්" පිහිටුවන්න කියලා යෝජනා කළා; ඕරමඑය ඤපපසිසදබ එකක් පිහිටුවන්න යෝජනා කළා.

තිස් අවුරුදු යුද්ධයේදී කරපු අපරාධ, මිනීමැරුම්, පහරදීම්, ගෙවල් ගිනිතැබීම්, දේපළ පැහැර ගැනීම්, ගත්තොත් ආණ්ඩුවෙන් තමයි එහි වැඩි ප්‍රමාණය කර තිබෙන්නේ. වැඩි ප්‍රමාණය ආරක්ෂක හමුදා සහ එල්ටීටීඊ සංවිධානය මගින් තමයි සිදු කළේ. හැබැයි, සාමාන්‍ය මිනිසුන් වශයෙන් මොනවත් වැරදි කරලා නැද්ද? සාමාන්‍ය මිනිස්සුත් වැරදි කරලා තිබෙනවා. එතකොට ඒ කරපු සියලු වැරදි සම්බන්යෙන් නඩු අහලා අපට විසඳන්න පුළුවන්ද? නඩු අහලා විසඳන්න බැහැ. ඒ නිසා තමයි ගුවාතමාලා, South Africa වාගේ ලෝකය පුරා මේ වාගේ තත්වයන් පැවැති රටවල් Truth Commission පත් කරලා තමන්ගෙන් වෙච්ච වැරැද්ද කියන්න අවස්ථාවක් දුන්නේ, නමුත් රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවත් ඒක කළේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ආණ්ඩුව ඒ දේ කළේත් නැහැ. ඒ නිසා දැන් ඉතුරු වෙච්ච ගැටලු තිබෙනවා. නඩු මගින් තමයි ඒවා විසඳන්න යන්නේ. මේ තුවාලය කවදාවත් නඩු අහලා විසඳන්න බැහැ.

> අපේ රටේ විශාල වශයෙන් සමාජ අරගල සිද්ධ වෙලා තිබෙනවා. අපේ රට නිදා ගෙන ඉන්න ජනතාවක් සිටින රටක් නොවෙයි. අපේ රටේ ජනතාව සටන් කරනවා. ඒක හොඳ දෙයක්. ආණ්ඩුවලින් කරන ලද මහා දැවැන්ත මර්දන, අපරාධ නිසා ජනතාව ඒ තැන්වලට තල්ලු වෙලා තිබෙනවා.

2018 ඔක්තෝබර් 11

# සෙස් අරමුදලෙන් කුඩා තේ නිෂ්පාදකයා ශක්තිමත් කළ යුතුයි

(ආනයන අපනයන (පාලන) පනත පිළිබඳ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා



අද අපේ රට තේ කර්මාන්තයේ සැලකිය යුතු අර්බුදයක ඉන්න බව අපි දන්නවා. විශේෂයෙන්ම මේ වනකොට ලෝක වෙළඳ පොළට විවිධ ප්‍රමාණයෙන් වෙනත් රටවල්වල තේ ආක්‍රමණ ඇවිල්ලා තිබෙනවා. කලින් තිබුණු "Ceylon Tea" කියන මට්ටම අද ඒ ප්‍රමාණයෙන්ම නැහැ. උදාහරණයක් හැටියට ගත්තොත්, 2017 අපේ අපනයන සංයුතිය ඇතුළත කෘෂි කාර්මික නිෂ්පාදන අපනයන ආදායම ඩොලර් මිලියන 2,767ක් තිබුණා. 2017දී තේ අපනයන ආදායම විධියට තිබෙන්නේ ඩොලර් මිලියන 1,529යි.

නමුත් අද වනවිට කෙන්යාව වාගේම වෙනත් අප්‍රිකානු රටවල්, වියට්නාමය හා චීනය පවා තේ වෙළෙඳ පොළේ තමන්ගේ කොටස අත්පත් කර ගැනීමට මැදිහත් වෙලා තිබෙනවා. අපේ සමහර තේ ෆැක්ටරි තාක්ෂණය පැත්තෙන් පහළ මට්ටමකයි තිබෙන්නේ. තේ දළු කඩන කෙනා වාගේම තේ ෆැක්ටරි හිමියාත් ආරක්ෂා වෙන්නට ඕනෑ. මොකද, තේ ෆැක්ටරි හිමියන් හරියාකාරව ආරක්ෂා වුණොත් විතරයි, තේ කර්මාන්තය දියුණු වෙන්නේ. නමුත් අපේ ණය නිසා, බැංකු ණය, විදුලි බිල වැඩිවීම හා විවිධ ගාස්තු ගෙවීම් නිසා අද තේ කර්මාන්තය පිරිහිලා තිබෙනවා. අද තේ කර්මාන්තයේ යෙදෙන අයට එය කරගෙන යන්න බැරි මට්ටමට පත් වෙලා තිබෙනවා. එසේ තිබියදී දැන් සෙස් අරමුදල පාවිච්චි කරලා ගෝලීය ප්‍රවර්ධන වැඩපිළිවෙළක් හදන්න කියලා යෝජනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා.

නමුත් ප්‍රශ්නය තිබෙන්නේ, ශ්‍රී ලංකාව සම්බන්ධව ප්‍රවර්ධන කටයුතු කරන අතරේ, අපි බලාපොරොත්තු නොවුණු ආකාරයට ශ්‍රී ලංකාවේ මොනවා හෝ අලකලංචියක් වුණොත්, අර ප්‍රවර්ධනයත් බිඳ වැටෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන් අපේ තේ පිළිබඳව අනෙක් රටවල ප්‍රවර්ධන කටයුතු කිරීමත් එක්ක, ලෝකයේ අනෙක් රටවල "Ceylon Tea" සඳහා අවශ්‍යතාවක් ඇති වෙනකොට ඒ අවශ්‍යතාව සපයන්න ලංකාවේ තේ තිබෙනවාද? එම අවශ්‍යතාව සපයන්න පහතරට තේ නිෂ්පාදකයින්ට පුළුවන්ද?

මේ තිබෙන මිලියන හයදහස එකවර වියදම් කරගෙන අපි මොනවා හෝ ප්‍රවර්ධන වැඩසටහන් කරයි තමයි. එතකොට ඒ වැඩසටහන්වලට යන අයටත් ඒකෙන් වාසියක් තිබේවි. ඒ පෞද්ගලික සමාගම් පවා ඒකෙන් මොනවා හෝ උපයා ගනියි. නමුත් ප්‍රශ්නය වෙන්නේ ඒකට ගැළපෙන්න අපි නිෂ්පාදනය වැඩි කරනවාද කියන එක ගැනයි. අපේ "Ceylon" කියන නාමය පාවිච්චි කරලා වෙනත් රටවල්වල අයට පුළුවන් අපේ තේ කලවම් කරන්න. අපේ තේ යම් ප්‍රමාණයක් කලවම් කළාට පසුව ඒ තුළින් "Ceylon" කියන නාමය පාවිච්චි කරගන්න ඒ ගොල්ලන්ට පුළුවන්. එහෙම අපේ තේ කලවම් කරලා හදා ගත්තාට පසුව, "Ceylon" කියන නාමය අපි ප්‍රවර්ධනය කරලා වෙන කාටහරි ආදායම හදා දෙනවා. එහෙම වෙන්න පුළුවන්කම තිබෙනවා.

ඒ නිසා පළමුවෙන්ම කළ යුතුව තිබෙන්නේ සෙස් අරමුදලින් යම් ප්‍රතිශතයක් හෝ පාවිච්චි කරලා කුඩා තේ නිෂ්පාදකයා ශක්තිමත් කරන එකයි; තේ ෆැක්ටරිකරුවන් ශක්තිමත් කරන එකයි; තේ නැවත වගාව ශක්තිමත් කරන එකයි. තේ කර්මාන්තයට යොදවා තිබෙන අක්කරයක ප්‍රමාණයේ ඉඩකඩින් වැඩි ඵලදායීතාවක් ගන්න පුළුවන් විධියට ප්‍රවර්ධනය කරන එකයි. ඒ සඳහා යම් වැඩපිළිවෙළක ඕනෑකම තිබෙනවා.

ඊළඟට, විශේෂයෙන්ම කථා වුණු අනෙක් කාරණාව තමයි අපේ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව. මේ පිළිබඳව මාධ්‍යවල ප්‍රසිද්ධ නොවුණාට, මේ දවස්වල වැඩිපුර සාකච්ඡාවට ලක් වෙන ආයතනයක්. හේතුව රුපියල කඩා වැටීම. ආණ්ඩුව කියන විධියට ඩොලරය ශක්තිමත් වෙලා තිබෙනවා. අපි එය දකින්නේ රුපියල කඩා වැටීම විධියටයි. රුපියල කඩා වැටීම නිසා ප්‍රධාන වශයෙන් සිදු වෙන්නේ අපේ ආනයන වියදම් වැඩි වෙන එකයි.

ඒකේදී අපි බලන්න ඕනෑ, අපේ සංයුතිය ඇතුළේ වැඩිම ආනයනය වියදමක් දරන්නේ මොනවාටද කියලා. සියයට 50ක් විතර ප්‍රමාණයක් වැය වන්නේ, අත්‍යවශ්‍ය භාණ්ඩවලට. 2017 අවුරුද්දේ අත්‍යවශ්‍ය භාණ්ඩ විධියට ආහාර සඳහා වැය වෙනවා, ඩොලර් මිලියන 1,841ක්. ඒකෙන් සහල් ගෙන්වන්න අපි වැය කරලා තිබෙනවා, ඩොලර් මිලියන 301ක්. සීනිවලට ඩොලර් මිලියන 256යි. කිරි නිෂ්පාදනවලට ඩොලර් මිලියන 316යි. ලූනුවලට ඩොලර් මිලියන 123යි. මම මේ ටික ගත්තේ උදාහරණයකට. ආනයන වියදමෙන් සියයට 16ක් අපි තෙල්වලට වියදම් කරනවා. මුදලක් හැටියට හිතුවොත් ගිය අවුරුද්දේ අපේ ආනයන වියදමෙන් ඩොලර් මිලියන 3,428ක් තෙල්වලට වියදම් කරලා තිබෙනවා.

අපි ඇඟලුම් පිටරට යැවීම සඳහා අන්තර් භාණ්ඩයක් හැටියට මෙරටට ගෙන්වන රෙදි ඇතුළු අමුද්‍රව්‍ය සඳහා ආනයන ප්‍රතිශතයෙන් 13ක් වියදම් කරනවා. අපි යම් අපනයන ආදායමක් ලබනවා තමයි. අපේ අපනයන ආදායම විධියට රෙදිපිළි සහ ඇඟලුම්වලින් ඩොලර් මිලියන 5,031ක් ලබනවා. හැබැයි අපනයන ආදායම ඩොලර් 5,031ක් කියලා අපි උස්සලා කිවුවාට වැඩක් නැහැ. ඇඟලුම් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ගෙන්වන්න ඩොලර් මිලියන 2,724ක් අපි වියදම් කරලා තිබෙනවා. ඔය අතර වෙනස තමයි අපට එකතු කළ අගය හැටියට ලැබෙන්නේ. හැබැයි, කෘෂි කර්මාන්තයේ අපි එකතු කළ අගය එයට වඩා වැඩියි.

අපි තේ, රබර්, කුරුඳු, ගම්මිරිස්, කෝපි හා මැණික් ඇතුළු අනෙකුත් ද්‍රව්‍යවල එකතු කළ වටිනාකම වැඩි කළොතින්, ඛනිජ සම්පත්වලට එකතු කළ වටිනාකම වැඩි කළොතින් අපේ එම ආදායම ඊට වඩා වැඩි වෙනවා. ඒක ඇත්තටම කෙටි කාලීන පැලැස්තරවලින් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. යම් දිගු කාලීන සැලැස්මක් ඇතුළේ කළ යුතු දෙයක්.

> අපේ අපනයන ආදායම විධියට රෙදිපිළි සහ ඇඟලුම්වලින් ඩොලර් මිලියන 5,031ක් ලබනවා. හැබැයි අපනයන ආදායම ඩොලර් 5,031ක් කියලා අපි උස්සලා කිවුවාට වැඩක් නැහැ. ඇඟලුම් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ගෙන්වන්න ඩොලර් මිලියන 2,724ක් අපි වියදම් කරලා තිබෙනවා. ඔය අතර වෙනස තමයි අපට එකතු කළ අගය හැටියට ලැබෙන්නේ. හැබැයි, කෘෂි කර්මාන්තයේ අපි එකතු කළ අගය එයට වඩා වැඩියි.

කවුළුව හැර තබමි

# මර නින්දෙන් සමාජය අවදි කළේ ඔවුන්ය

තවත් නොවැම්බරයක් උදා වී තිබේ. මෙය "යුක්තිගරුක දේශයක්, සාධාරණ සමාජයක්, නිවහල් මිනිසෙක්" වෙනුවෙන් මෙරට විප්ලවවාදීන් දස දහස් ගණනක් දිවි පිදූ මාසයයි. විප්ලවීය දේශපාලනය අතර නොනැසී පවතින මෙම හඬ ඉල්මහ විරුවන්ගේ අරමුණ කැටපත් කළ යාවජීව හඬම වන්නේය.

අරගලයෙන් පලාගිය වුන් පසුකාලයේ තම වැහැරුණු, පිරිහුණු ජීවිත සමග ඇතිකරගත් සබඳතාවයත්, අරගලය තුළ දිවිපිදූවන් පළ කළ සටන්කාමීත්වයත්, පිළිබඳ පරමාදර්ශයන් ලාංකේය සමාජයට නරක දෙයක් වෙනුවට හොඳ දෙයක් තෝරා ගැනීමට සුවිශේෂී අත්දැකීම් එකතු කළ මාසය වන්නේද නොවැම්බරයයි.

ජ.වි.පෙ. නිර්මාතෘ රෝහණ විජේවීර සොයුරා ඇතුළු දහස් ගණනක් වීරෝදාර සොයුරන් තම උත්තුංග අරමුණ වෙනුවෙන් දිවි පුදද්දී පාරාභවයට ගියවුන් සතුරා වෙත පලාගොස් දීන පාවා දෙන්නෝ බවට පත්වූහ.

අලුත් දේශපාලන සම්ප්‍රදායක් හඳුන්වාදෙමින් ආරම්භ කරනු ලැබූ "ජනතාව වෙනුවෙන් දේශපාලනය" යන්න මෙරට සමාජය තුළ රෝපිත කිරීමට කුරිරු ධනවාදයට එරෙහිව දෙවන ප්‍රහාරාත්මක ක්‍රියාන්විතය ඇරඹුවේ ඉල් මහ විරුවන්ය. මොහොතින් මොහොත කුණුවන, දූෂිතවන ලාංකේය දේශපාලනයට එරෙහිව උඩුගං බලා



යා යුතු බවත් යා හැකි බව හා ඊට තැලෙන පෑගෙන සියලු ජනයා සූදානම් විය යුතු බව ඉල් මහ විරුවන්ගේ පරිත්‍යාග තුළින් අවධාරණය කෙරිණි.

අඩ නින්දේ, මර නින්දේ ගොලුවන් බිහිරන් සේ සිටින ලාංකේය සමාජයට ඔවුන් දුන් පණිවුඩය අද එදාටත් වඩා වලංගුය.

# මගඩි නැටුම් සහ ජනතා සටන්






ඒකාබද්ධ විපක්ෂය යැයි කියාගන්නා නඩය ආණ්ඩුව පලවා හැරීමට යැයි කියමින් පසුගියදා ලේක්හවුස් වටරවුමට තම ප්‍රවේණි දාසයන් ටික කැඳෙව්වේය. නර නාටක රඟ දැක්වූයේ කාවඩි නැටුම් හා බ්‍රේක් ඩාන්ස්ද සමගිනි. අනාගත ඔටුනු පළන් කුමරා ලෙස අභිෂේක ලැබීමට පෙරුම් පුරන රාජපක්ෂ කොලුගැටයාද බීමතින් නටන පිරිස මැදට වී අපූරු නැටුමක් නටනවා රටම දුටුවේය. සියල්ල අවසන සමහරු වෙරි මතින් තැන තැන වැටී ගොරෙද්දේ අදිනු දැක ගත හැකි විය. සමහරු උද්ඝෝෂණය පසෙකලා පැදුරටත් නොකියා මාරු වී ගොස්ය. නායක කැළ තරු පහේ හෝටල්වල සැන්දෑ සාදයේය. මේ ඒ උද්ඝෝෂණයයි.

මේ අතර පසුගිය ඔක්තෝම්බර් 23 දින ජවිපෙ විසින්ද ආණ්ඩුවේ සකලවිධ ජන පීඩාවන්ට එරෙහිව කොළඹ නගරයට මහා ජන ගඟක් කැඳවා දැවැන්ත පෙළපාලියක් සහ උද්ඝෝෂණ රැලියක්ද පවත්වන ලදී. වෙනස හොඳින්ම රටට පෙණුනි. නියම උද්ඝෝෂණ හා සටන් කළ යුත්තේ කෙසේද යන්න නැවත වරක් ජ.වි.පෙ. විසින් ලාංකේය සමාජයට පෙන්වා දෙන ලදී. සටනක් තුළ තිබිය යුතු දේශපාලන විනය, ජවය හා සංවිධානාත්මක බව මේ යැයි ජ.වි.පෙ. මුළු රටටම නැවත වරක් සිය භාවිතයෙන්ම ප්‍රදර්ශනය කළේය. සටන අවසන පිරිස විසිර ගියේ එම ආදර්ශය මුළු රටටම දෙමිනි. හිස් බෝතල් හෝ සිගරැට් කොට සටනේ නටඹුන් ලෙස මහපාරේ දිස් නොවුණි.

ජනතා සටන් සහ ව්‍යාජ නාඩගම් යන්න තෝරා බේරා ගැනීමට එය හොඳම අවස්ථාවක් විය. එය බලාවත් රූපවාහිනියෙන් හා ඇන්දිල්ලෙන් රටේ ජනයාට මිදිය හැකිනම්...

# කිරිබත් සහ වර්චස්



තෝසේ කඩවල සාම්බාරු හොද්ද කියා එකක් ඇත. සමහර කඩවල මෙය හදන්නේ මාකට් එකෙන් එළියට දාන කුණු එළවළුවලිනි. දැන් එ.ජා.ප., ශ්‍රීල.නි.ප. නායකයෝද ඒ කුණු එළවළු වැනිය. වරින්වර එකම හැලියේ කලවංකර තම්බා රටේ ජනයාට ඒවා බුදීමට සලස්වති. දැන් මෛත්‍රී, මහින්ද සහ එජාපයේ සමහරුද එක් වී අලුත් භාරකාර සාම්බාරුවක් පරණ කුණුවෙච්ච එළවළුවලින්ම පරණ හැලියේම දමා හැඳි ගා ජනයාට බුදීමට සලස්වා තිබේ.

මේ පට්ටා හොරු රුළ රුපියල් කෝටි ගණන්වලට ඒ පැත්තෙන් මේ පැත්තට පනිමින් මේ කරන දේශපාලන කුපාඩි සූදුව රටේ ජනතාව තවදුරටත් ඉවසා වදාරා සිටීම ගැනය අපේ පුදුමය.

දේශපාලුවෝ රටේ ජනයාගේ හිස මත වර්චස්ම හෙළති. රටේ බහුතර ජනයාත් මේ වර්චස්වලට හුරු පුරුදු වී ඇත්දැයි වරෙක සිතෙන තරම්ය.

'එදා අරූ මාව මරන්න ඉන්නවා' කියා මෛත්‍රී රනිල්ගේ කරේ එල්ලුනේය. 'අද මූ මාව මරන්න ඉන්නවා' කියා මෛත්‍රී මහින්දගේ කරේ එල්ලුනේය. එහෙත් මුන් ඔක්කොම ජනතාව නොමරා මරන බව රටේ ජනයා කවදා පසක් කරගනීද?

ශ්‍රී ලංකාද්වීපයේ දේශපාලන සංස්කෘතිය කොතරම් කුණු වී ඇත්ද යන්න මේ දිනවල ඉතාම පැහැදිලිව රටට ප්‍රදර්ශනය වෙමින් තිබේ. එ.ජා.ප.යේ උදවිය හඬති; වැළපෙති; ශාප කරති. ශ්‍රීල.නි.ප.යේ උදවිය කිරිබත් කති; චූන් වෙති. මෛත්‍රීට මහින්දට ශාප කළ සමහර එ.ජා.ප. ප්‍රබලයෝ පසුවදාම මහින්ද-මෛත්‍රී දෙපූට්ටුවේ ඇමතිකම්වලින් පුද ලබා ඊයේ කියූ දේට හාත්පසින්ම විරුද්ධ දේ අද කියති.

ලාංකේය දේශපාලන බලපොරයේ අපුලේ උච්චතම අවස්ථාව මේ සටහන තබන දිනවල දිනවල කරළියට පැමිණ තිබේ.

# පොලිටිකල් පංතිය

"සිරියා මෙ සාරා නැගේවි හද මෝරා..." තනුවට කවදාවත් නැතුව පොලිටික්ක කෝරිඩෝව පැත්තෙන් උරුවම් සද්දයක් ඇහෙන්න වුණාම ළමයි හැමෝගෙම අවධානය යොමු වුණේ දොර දිහාවට. සද්දෙ වැඩි වෙවී ළඟටම ඇවිත් අන්තිමට දොරෙන් ඇතුල් වුණා. හැමෝම බලන් හිටිය වගේ දැනුනාම පොලිටික්කට ටිකක් විතර ලැජ්ජා හිතුණා.

"ඇයි ළමයිනේ... ගැලපෙන්න නෑ තමයි... ඒත් මට පොඩි ජොලියක් ගියා... ඒකයි." පොලිටිකක සමාව භජනය කරන බැල්මක් දැම්ම.

"සර් නම් හැපි එකේ වගේ... මොකද සර් වාසියක් වුණාද?" වසන්තිය මල්ල ලෙහලම බැලුව.

"හරි මට විතරද්ද සතුටු. දැන් ඔය ළමයින්ට සතුටු නැද්ද?" පොලිටික්ක ඇහුවෙ සතුටු නොවෙන එක වැරැද්දක් වගේ.

"මොකද්ද සර් සතුටු වෙන්න තියෙන්නෙ? අපිටත් කියන්නකො..." අනුරුද්දිය තොඩොලෙ.

"ඇයි සර් ඩොලර් එක බැහැලද?" කනිය පර්ස් එකට අත යැව්වෙ හරියට මේ දැන් ඩොලර් ගන්න වගේ.

"එකත් එකටම පඩි වැඩි වෙනව ඇති." මංජුව මාපට ඇඟිල්ලයි මැදඟිල්ලයි පැන්නුව.

"බඩු මිල බහිනවලුද?... බස් ගාස්තු අඩුවෙලාද?... කෝච්චි ගාස්තු අඩුලුද?" එක දිගට හඬවල් ඇහෙන්න ගත්ත.

"තවම නෑ ළමයිනේ. ඉවසන්නකො ඔය ඔක්කොම වෙයි... දැන් මහින්ද මහත්තයට ආයි අගමැතිකම ලැබුණානෙ. ඒකම මදෑ" පොලිටික්ක ගිලගෙන හිටපු බිත්තරේ වමෑරුව.

"අයියෝ...ඒකද? අපි හිතුව ඇත්තටම අපිට වාසියක් වෙන දෙයක් කියල..." මංජුව හුළං බැස්ස වගේ හුස්මක් පිටකළා. "ඕකෙන් මහින්ද මහත්තයටනම් වාසියක් ඇති. නඩු ටික බේරග න්න වගේ."

"මොකද නැත්තෙ ළමයිනේ... රට බලන් හිටපු දෙයක්නෙ මෛත්‍රී මහත්තය කළේ. ඉතින් සතුටු නොවී පුළුවන්ද?" පොලිටික්කගෙ කට කනේ කන සාක්කුවෙ.

"මහින්ද මහත්තය අවුරුදු දහයක් විතර රට කළානෙ සර්. බැරි හින්දනෙ මිනිස්සු යැව්වෙ. ජනෙල් පඩියෙ නැගලා බැණ බැණ හිටියෙ ඒකනෙ. දැන් ආයිත් ඇවිත් මොන මැජික් පෙන්නන්නද? ඩ්‍රයිවර් මාරු වුණාට කෝච්චි යන්නෙ එකම පීල්ලෙනෙ." සමන දිග කතාවක් කෙටියෙන් කිවුව.

"එහෙම නෙමයි සමන් අපි මේකට සතුටු වෙන්න ඕනෙ. දැක්ක නේද මිනිස්සු රතිඤ්ඤ ගැහුව. කිරිබත් කෑව." කිරිබත් රස්නෙට පොලිටික්කගෙ දිවත් පිච්චිලාද කොහෙද.

"ගොඩක් මිනිස්සුන්ට ඇත්තටම සතුටු වෙන්න ඕනෙ මොකක් කරලද කියල තේරුමක් නැහැ සර්. මං මේ සර්ට කියනව නෙමෙයි, ඒ මිනිස්සු සතුටු වෙන්න ඕනෙ දේවල් ජීවිතේට දැකල නැහැ. සතුට ඒ මිනිස්සුන්ගෙ ජීවිතවලින් හුඟක් දුරයි. එයාලා දන්නෙ එක එක නායකයො මාරුවෙන් මාරුවට ගෙනල්ල සතුටු වෙන්න. ඒ නායකයො හිනා වෙනකොට හිනා වෙන්න. අත්පුඩි ගහන්න. තමනුත් සතුටු වෙන්න. ආයිත් බැණ බැණ වෙන නායකයෙක් බලේට ගේන්න..." සමන ඩෙස් එක උඩ ඉඳගෙන හරි බැරි ගැහුණ.

"නෑ සමන් මේ වෙලාවෙ රනිල් යමින් හිටපු ගමන නවත්තපු එකට..." සමන බ්‍රේක් වෙච්ච වෙලාවෙ පොලිටික්ක ඔබන්න හැදුව.

"රනිල් යන ගමන කියල එකක් නෑ සර්. මොන ගමන ගියත් ඔය ඔක්කොම යන්නෙ එකම පාරෙම තමයි. රටට සුගතියක් නෑ. මිනිස්සුන්ට සෙතක් නෑ... හැබැයි ඇත්තට සතුටු වෙන කට්ටියක් ඉන්නව. දැක්කනෙ දිවුරුම් දෙද්දි වට කරගෙන හිටපු අය. උසාවි යන්න තියෙන අය. හිරේ යන්න නියමිත අය. අන්න එයාලා බොක්කෙන්ම සතුටුයි. ඒ සතුටන්ම නාමලුත් එෆ්සීඅයිඩී ගිහින් එන්නෙ ෂෝටක් ගහගෙන. අන්න ඇත්තට සතුටු වෙන අය. දැන් තාජුඩීන්ව හීනෙන් පේන එකක් නෑ, සනීපෙට නින්ද යයි කියල එයාලා සතුටු වෙනව... ඒවා ඇත්තටම. සාමාන්‍ය මිනිස්සු වගේ නොදන්නාකමට නෙමෙයි." සමන මදි නොකියන්න සතුට බෙදද්දි පොලිටික්කගෙ කනේ තිබුණු කට නිකටට එනව.

මේ අල්ල පනල්ලෙ ළමයි අතින් අතට කොළයක් පාස් වෙනව. දකින එවුන් බඩ අල්ලගෙන දෙකට නැමෙනව. අන්තිමට සමනගෙ අතට ආවහම සමන හැමෝටම ඇහෙන්න කියෙව්ව.

"රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛ 2018/10/26

සැ.යු. සියලු පුරවැසියන් අලුත් අගමැතිවරයාගේ පත්වීම සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම සතුටු විය යුතුය.

අනවසරයෙන් සතුටු නොවන්නන්ට ත්‍රස්තවාදය වැළැක්වීමේ නව පනත යටතේ දැඩි දඬුවම් පමුණුවනු ලැබේ!"

## ජනතාවාදී පාලනයක්...

03 පිටුවෙන්



මතුවූ ප්‍රතික්‍රියාවක්. දේශපාලනයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතින් හා ඉඩ අහෝසි කළාම ප්‍රතික්‍රියාව මතුවෙන්නේත් ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයන්ගෙන් නොවෙයි. ඒකෙ ප්‍රධාන වගකීම බාරගත යුත්තේ පාලක පංතියයි. චෝදනා කළ යුත්තේ ඔවුන්ටයි.

***නියමුවා:- මේ සිදුවුන තත්වය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කළොත්?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** අපේ පක්ෂය 1983 වනවිට ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රසිද්ධ දේශපාලන ප්‍රවාහයේ හොඳින් ක්‍රියාත්මක වෙමින් තිබුණ පක්ෂයක්. අපි ඡන්දවලට ඉදිරිපත් වුණා. ප්‍රසිද්ධියේ මැයි රැලි, රැස්වීම්, දේශන තිබ්බා. ජනාධිපතිවරණයට තරඟ වැදුණා. අපිට එරෙහිව කිසිම චෝදනාවක් තිබුණේ නැහැ. අපි ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය තුළ අපේ පංතිය දැනුවත් කරමින් ක්‍රියාශීලීව වැඩකරමින් එවකට පැවති ජයවර්ධනගේ ධනේශ්වර පාලනයට අභියෝගයක් වන මට්ටමට ආවා. තමන්ගේ බලය පිළිබඳ අර්බුදයක් ආවම, අභියෝගයක් ආවම හැමදාම ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පවා මුලින්ම කඩන්නෙ පාලක පංතිය. දැන් මෛත්‍රීපාල කරමින් ඉන්නවා වගේ. එදා ජේ.ආර්. 1983 ඔවුන් විසින්ම නිර්මාණය කරපු කළු ජූලිය උපයෝගී කරගෙන අපේ පක්ෂය අසාධාරණ විදිහට තහනම් කළා. එදා ජයවර්ධන පාලනයේ එම ප්‍රජාතන්ත්‍ර විරෝධී, වැරදි දේශපාලන ක්‍රියාව අපට ඇඟිල්ල දිගුකරන හුඟදෙනෙක් අමතක කරනවා.

ඒ වගේම ඔවුන් අපේ පක්ෂ තහනම දිගටම පවත්වාගෙන ගියා. රෝහණ සහෝදරයා මරන්න කොන්ත්‍රාත් දුන්නා. තහනම ඉවත්කරවා ගැනීමට පෝස්ටර් ගහපු අපේ සාමාජිකයෝ පොලිසියට අරන් ගිහින් ගහලා මැරුවා. අපි ඒ තත්වය තුළදීත් ඒවට ප්‍රතිචාර දැක්වූවේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස. අප ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගියේ නැහැ. සමහරු ඒ ගැන කථාකරන්නේ නැහැ. එක්කෝ ඒව දන්නෙ නැහැ. ඒ අතර ලංකාව ඉන්දියාවට පාවාදීමට සූදානම් වුණා. මේ තත්වය තුළ තමයි ජ.වි.පෙ. සන්නද්ධ වෙන්නෙ. 1987 දී ජයවර්ධන ජනාධිපතිවරය ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරලා ලංකාව ඉන්දියාවට පාවා දුන්නා. ඉන්දියන් හමුදාව ලංකාවට ගෙනාවා. ඊට එරෙහිව රට පුරාම විරෝධතා මතුවුණා. හමුදාව තුළ පවා විරෝධතා මතු වුණා. ඒ සාමකාමී විරෝධතාවලට ආණ්ඩුව වෙඩි තියල මිනිස්සු මැරුවා. ඒ තත්වය තුළ තමයි සන්නද්ධ ක්‍රියාකාරකම් ඉදිරියට ආවේ. ඉන්පසු ආණ්ඩුව විවිධ මිනීමරු කල්ලි හදාගෙන රට තුළ භීෂණයක් නිර්මාණය කළා. තම විරුද්ධවාදීන් මරා දැම්මා. ආණ්ඩුවේ ඇමතිවරු වධකාගාර පවත්වාගෙන ගියා. ඒ වටපිටාව තුළ ජ.වි.පෙ.ත් තම අයිතීන් වෙනුවෙන් සටන් කළා. විශාල පිරිසක් දිවිපිදුවා. ඒ සටන තුළ අපේ පැත්තෙනුත් අඩුපාඩුකම් සිදුවුණා. යුද්ධයක් කියන්නේ තේ පැන් සාදයක් නෙවෙයි නෙ. එහිදී සමහර සිදුවීම් පාලනය කළ නොහැකි වෙනවා. එනිසා මේ අරගලයේ හේතුව නොදැන ඵලයට දොස්කීම එක්කො දේශපාලන මුග්ධකමක් නැතිනම් දේශපාලන කුහකකමක්!

***නියමුවා:- මේ අරගලයේදී දිවි පිදූ අය දිවි පිදුවේ කුමක් සඳහාද? ඔවුන් විරුවන් වෙන්නෙ ඇයි?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේ අරගලයේදී සටන් කළ, දිවි පිදූ, සිරගත වූ කිසිවෙක් තමන්ට පෞද්ගලික ලාභ අපේක්ෂාවකින් කටයුතු කළ අය නොවෙයි. ඔවුන් සියලු දෙනාටම පොදු අරමුණක් තිබුණා. ඒකක් රට බේරාගැනීම, ඉන්දියානු ආක්‍රමණය පැරදවීම, අනික වඩා යහපත් සමාජයක්, සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීම. ජනතාවට හොඳ හෙට දවසක් නිර්මාණය කිරීමට හා මව්බිමේ නිදහස වෙනුවෙන් සටන් කිරීම හා දිවි පිදීම වීරත්වයක් තමයි. මේ අවුරුද්දෙ 1818 ඌව වෙල්ලස්ස කැරැල්ලට අවුරුදු 200ක් වෙනවා. අපේ රටේ හිටපු සුදු පාලකයන්ට අනුව 1818 කැරැල්ලට සම්බන්ධ අය 'ත්‍රස්තවාදීන්', 'රාජද්‍රෝහීන්'. ඒත් අපේ රටේ ජනතාවට අනුව ඔවුන් වීරයින්. දේශප්‍රේමීන්. 88-89 ත් එහෙම තමයි. 88-89 ජනතාව මරා දාපු, රට පාවා දීපු, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරපු පාලකයින් හා ඔවුන්ගේ අනුගාමිකයින් තමයි අපට තවමත් දොස් කියන්නෙ. ඒත් මේ රටේ සැබෑ ජනතාවගේ, දේශප්‍රේමී හා ප්‍රජාතන්ත්‍රවාදී ජනතාවගේ හෘද සාක්ෂිය ඉදිරියේ අපේ සගයන් රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් සටන් කළ වීරයන්. ඒ වීරයන් අතර පරමාදර්ශයක් ලෙස ඉහළින්ම රෝහණ සහෝදරයා, උපතිස්ස ගමනායක සහෝදරයා ඇතුළු දිවි පිදූ නායකයන් ඉන්නවා.

***නියමුවා:- 29 වන ඉල්මහ විරු සමරුව පවත්වන මේ මොහොතේ රටේ දේශපාලන අනාගතය හා ජනතා විමුක්ති පෙරමුණේ කාර්යභාරය කුමක් වේවිද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේ බංකොලත් ධනපති ක්‍රමය යටතේ මේ බංකොලොත් ධනේශ්වර නායකයන්ට මේ රට හදන්න හෝ මේ වැටී තිබෙන අගාධයෙන් ගොඩ ගන්න බැහැ. ඔවුන් දැන් ඉතිහාසයට අනුව කල් ඉකුත්වූ අය. ඔවුන්ට පුළුවන් බලය වෙනුවෙන් කුමන්ත්‍රණය කිරීමයි, බලය සඳහා ජනතාව රැවටීමයි, මහජන ධනය කොල්ලකෑමයි පමණයි. ඒක දැන් තහවුරු වෙලා තියෙනවා. එදා ඉල්මහ විරුවන් අවධාරණයෙන් පැවසූවාක් මෙන්, රෝහණ විජේවීර සහෝදරයා අපට ඉගැන්වූවක් මෙන් දැන් මේ රටට අලුත් දේශපාලන ගමනක් අවශ්‍යයි. නව සමාජයක් නිර්මාණය කිරීම අවශ්‍යයි. මේ දේශපාලන අර්බුද හා කුමන්ත්‍රණ විසින් කියාපාන සත්‍යය එයයි.

පාලකයන් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය හා ධනේශ්වර දේශපාලන සදාචාරය පවා පැත්තක දාල බලය වෙනුවෙන් නිරුවතින් පොර කනවා. එහි ප්‍රේක්ෂකයන් හෝ නිරීක්ෂකයින් වීම අපේ කාර්ය නොවෙයි. මේ දුෂ්ට රැළ, හොර නඩ දෙක එක් කඳවුරක් සේ සලකා ඔවුන් පැරදවීම සඳහා ජනතාවගේ දේශපාලන කඳවුර නිර්මාණය කරමින් ඊට සක්‍රීය නායකත්වය ලබාදීම තමයි අපේ වගකීම. ඒ හරහා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සමාජ සාධාරණත්වය ජාතික සමගිය ආර්ථික සංවර්ධනය සහිත නව සමාජයක්, සමාජවාදී සමාජයක් ගොඩනැගිය යුතුයි. මේ ඒ සඳහා හොඳම අවස්ථාව බව පේනවා. ඉල්මහ විරුවන්ගේ අරමුණ දිනිය හැක්කේද ඒ මගින් පමණයි. ඒ නිසා අප හැම දෙනාම ඒ වෙනුවෙන් කැප විය යුතුයි.

## පුපුරා ගිය...

05 පිටුවෙන්




ලෙස මැදිහත්ව දේශපාලනයෙ තම පංගුව අත්පත් කර ගන්නේ නම් අර්බුදයට ගිය බලලෝභී කුමන්ත්‍රණකාරී ප්‍රජාතන්ත්‍රවිරෝධී පාලක කල්ලිවලට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදයේ සමාජ සාධාරණත්වයේ ජාතික සමගියේ, දේශපාලන සදාචාරයේ කඳවුර නිර්මාණය කරගැනීමට දැන් ඉතා හොඳ ඉඩක් හා වටපිටාවක් තිබේ.

සැබැවින්ම ලංකාවේ ධනවාදයේ කෙරුම් දැන් අවසන්ය. ධනපති කණ්ඩායම්වල කෙරුම්ද දැන් අවසන් වෙමින් පවතී. මේ දේශපාලන ගොහොරුවේ ලැග සිටීමට පොදු ජනයා හිත හදාගත යුතු නැත. මේ ගොහොරුවෙන් මිදිය යුතුය. මේ කුමන්ත්‍රණකාරී කල්ලි පසුපස දේශපාලන අන්ධභාවයෙන් යුතුව දුවන, චාරයක් නැති ලුම්පන් වර්ගයේ සිටින පිරිසක් හැර අන් සියල්ලෝ මේ ජරාජීර්ණ දේශපාලනය පිළිකුල් කරති; ප්‍රතික්ෂේප කරති. ඒ නිසා ඔවුන් වෙනුවෙන් දේශපාලන බලයක්, දේශපාලන ගමනක් අවශ්‍යය. එම දේශපාලන බලය ගොඩනැගීමේ නායකත්වය මේ මොහොතේ බාරගත හැක්කේත් බාරගත යුත්තේත් ජනතා විමුක්ති පෙරමුණය. මෛත්‍රී හා රනිල් දිගින් දිගටම පාවාදුන් 2015 ජනවාරි 08 ජනවරම තුළ සිටි ලක්ෂ 62ක් වූ ජනයාට ආමන්ත්‍රණය කිරීමත් ඔවුන් පෙළගැස්වීමත් කළ යුතු අතර එය කළ හැක්කේද දැන් ජනතා විමුක්ති පෙරමුණට පමණි. යහපාලනය ගැන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන, සාධාරණ සමාජයක් ගැන, ජාතික සමගිය ගැන කථා කළ බලවේග ඒ ගැන කථාකළේ සත්‍ය ලෙසම නම් දැන් ඔවුන්ටද තෝරාග ැනීමට ඇත්තේද ජ.වි.පෙ. පමණි.

එබැවින් වර්තමාන අර්බුදය විසින් ජනතාවට පාඩම් උගන්වා ඇති අතර ජනතාව ඉන් පාඩම් ඉගෙන ගන්නේ නම් ජනතාවගේ ජයග්‍රහණය සඳහා මාවත පහසු කරදී ඇත. එම මගේ ගමන් කිරීමේ වැඩිම හැකියාව ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රගතිශීලී බලවේගයන්ට වන අතර එම බලවේගවල ක්‍රියාකාරිත්වයේ ප්‍රමාණය මත අනාගත ජයග්‍රහණය තීරණය වනු ඇත.

## ධනවාදයේ අර්බුදය...

12 පිටුවෙන්



අලින්ට වනයෙන් එළියට පැමිණීමට ආරාධනා කොට ඇත. එය ධනවාදය  උත්තරාරෝපණය කල දින සිට යටත්විජිතවාදීන්ටත්, මාරුවෙන් මාරුවට ආණ්ඩු කළ ආණ්ඩුවලටත් මෙම අලි - මිනිස් ගැටුම සඳහා විසඳුම් නොමැත. ජාතිකත්වයන් අතරද ආගම් අතරද වෛරය පතුරන සමාජයක් තුළ අලින් හා මිනිසුන් අතර සංහිඳියාවක් අපේක්ෂා කිරීම උගහටය. සියඹලංගමුව, ගල්ගමුව, හක්වටුනාව, කෑගල්ල, පල්ලෙකැලේ ආදී ඇත් ගහනය වැඩි ප්‍රදේශවල ඇතුන්ගේ හා මිනිසුන්ගේ ජීවිත රඳා පවත්නේ වාසනාව පිළිබඳ විශ්වාස මතය.

අලි මිනිස් ගැටුම අවම  කිරීම සඳහා දියුණු පරිසර ප්‍රතිපත්තියක් ධනවාදයට නොමැත. මෙවැනි වටපිටාවක අලි මිනිස් ගැටුමට විසඳුම් ලෙස අලින් වෙසෙන වන රොදවල් වටා විදුලි වැටවල් නිර්මාණය කිරීම එකම විසඳුමක් ලෙස දැකීමට අවවර්ධිත ධනවාදී ආණ්ඩු ක්‍රියාත්මක වෙමින් පවති. අලි ඇතුන් රංචු සීමිත භූමි ප්‍රමාණයකට සීමා වීම තුළ ලේ ඥාතීත්වයක් සහිත පැටවුන් බිහිවීම, එකම වර්ගයේ ජාන මිශ්‍රවීම තුළ ඇතිවන දුබලතා හේතුවෙන් අලින් ශ්‍රී ලංකාවෙන් තුරන්වී යාම වළක්වාගත නොහැක. එසේ වඳවීම අලි මිනිස් ගැටුමට ධනවාදය විසින් ලබාදෙන විසඳුමට වඩා බරපතළය. ඒ සඳහා ඔවුනට පැලැස්තර විසඳුමකට හැර තිරසාර විසඳුමකට අවශ්‍ය ප්‍රතිපක්තයක් හෝ වැඩපිළිවෙළක් නොමැත.

ධනවාදයේ නිර්මාණයක් වූ අලි මිනිස් ගැටුම හා අනෙකුත් පාරිසරික ගැටලු අවම කර සියලු මානවයන්ට, සියලු ජීවීන්ට ද සහයෝගයෙන් එක්ව ජීවත්විය හැකි පාරිසරික සතුරු සංවර්ධනයක් වෙනුවට මිතුරු සංවර්ධනයක් ස්ථාපිත කිරීම සඳහා වැඩපිළිවෙලක දැඩි අවශ්‍යතාවයක් රට තුළ නිර්මාණය වී ඇත. සියලු පරිසර සංවේදී, සැබෑ තිරසාර සංවර්ධනයක් අපේක්ෂා කරන සියලු ජාතිකත්වයන්ගේ අවංක මිනිසුන්ට මේ පැමිණ ඇත්තේ ඒ සඳහා අවස්ථාවය.

16 පිටුවෙන්...

## අවුරුදු 70ක...



බලවේගවලට තවදුරටත් තනි තනි අරගල වෙනුවට සාමූහික අරගලයක් වෙනුවෙන් ගොඩනැගෙන තනි මධ්‍යස්ථානයක් නිර්මාණය විය යුතුයි.

මෙය ජනතා විමුක්ති පෙරමුණට පමණක් පැවරී ඇති කාර්යයක් නෙමෙයි. අපි එහෙම හිතන්නේ නැහැ. අපි එහි ඉදිරිගාමී කාර්යය ඉටු කරනවා. අපි හැමෝම ඒ වෙනුවෙන් කැපවෙමින් සිටිනවා. නමුත් හිතන මතන හැම පුරවැසියෙකුම මෙම කාර්යභාරයේ කොටස්කරුවෙකු විය යුතුයි. අප අතර විවිධාකාරයේ වෙනස්කම් තියෙන්න පුළුවන්. ඒ සියලු වෙනස්කම් මධ්‍යයේ වුවත් එකතු වෙන්න අද අපට බලකර තිබෙනවා. ඒ වෙනුවෙන් පුළුල්තම මහජන ව්‍යාපාරය ගොඩනැගිය යුතුයි. මේ වේදිකාවේ කුමන ක්ෂේත්‍රයද අඩු? ඔවුන් මේ ආණ්ඩුවලට ස්ත්‍රෝත්‍ර ගායනා කිරීම සඳහා වේදිකාවලට ගොඩවෙන අය නෙමෙයි. මේ සිටින්නේ මේ රටට නව මාවතක් දිනා දිය හැකි බලවේගයයි. මෙය මේ රටේ අනාගතයට හිමිකම් කියන වේදිකාවයි. එය තව තවත් පුළුල් කළ යුතුයි.

ප්‍රජාතන්ත්‍රවාදයෙන්, සදාචාරයෙන්, කැපකිරීමෙන්, රට ගොඩනැගීම සඳහා වන වුවමනාවෙන් අපි සිටින්නේ ඔවුන්ට වඩා ගවු ගණන් උඩින්. මේ කඳවුර තමයි රටේ අනාගතය තීරණය කරන කඳවුර. රටේ අනාගතය භාරදිය යුත්තේ මේ කඳවුරයි. මේ සිදුවන විගඩම ගැන ලැජ්ජා වන එ.ජා.ප.යේ ශ්‍රීල.නි.ප.යේ අයටත් අපි කියන්නේ ඔවුන්ගේ හෘද සාක්ෂිය සඳහා වේදිකාව අප නිර්මාණය කරන බවයි. ඔවුන්ට අපි ආරාධනා කරනවා. ලංකාවේ පැරණි වමේ ව්‍යාපාරයටත්, සිවිල් සංවිධානවලටත්, මාධ්‍ය සංවිධානවලට අප මේ වේදිකාව සඳහා ආරාධනා කරනවා. රනිල්, මහින්ද, මෛත්‍රී අසාර්ථක, කුමන්ත්‍රණකාරී, නිර්ලජ්ජිත පාලකයින්ගෙ න් මේ රට බේරා ගත යුතුයි. ඒ වෙනුවෙන් නිර්මාණය වන ජනතා මධ්‍යස්ථානයට රටට ජනතාවට ආදරය සියලු දෙනාට ආරාධනා කරනවා."

## රටට ජනතාවට ආදරය...

නිදහසින් පසු අපේ පුරවැසි වගකීම හරියට කළා නම් මේ ඉරණම අත්වෙන්නේ නැහැ. මම හිතනවා මෙතන සිටින පුරවැසියන් සාධාරණය වෙනුවෙන් කටයුතු කරවි කයලා.

අද කිරිබත් කාලා රට ගොඩනඟලා කියලා අපට සතුටු විය නොහැකියි. වහාම පාර්ලිමේන්තුව කැඳවන්න. ඊළඟ ඡන්දෙදි රටට ජනතාවට ආදරය කරන පුළුල් බලවේගයකට අපි එක් විය යුතුයි."

## සැබෑ ජනතාවාදී...

ජනවරම පාවා දුන්නෙත් මොහු නායකයෙක්ද? අපි මෛත්‍රී, රනිල්, මහින්ද මහත්තුරුන්ගෙන් නීතිය යුක්තිය, සාධාරණය බලාපොරොත්තු වෙන්නේ නෑ. කාගෙවත් ඔටුනු ගලවා තව කෙනෙක්ට පළඳවන්න අපිට අවශ්‍ය නැහැ.  සැබෑ ජනතාවාදී පාලනයක් රටට අවශ්‍යයි. ඒ වෙනුවෙන් පෙළග ැහෙන්න කියා අපි ඉල්ලා සිටිනවා."

## අපේ අනාගතයේ...

තවදුරටත් මේ පක්ෂ දෙක ගැන මිනිස්සුන්ට විශ්වාසයක් නැහැ. අපි අනාගතයේ පිටපත ලියන්න පටන් ගමු. මේක බේදාන්තයකින් නවත්තන්න බැහැ. අපි තීරණය කළ යුතුයි. මේ තක්කඩි එක්ක ඉන්නවාද? ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ගොඩනඟන්න එක් වෙනවාද කියලා."

## ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත්...

මහතා කැත වැඩක් කළේ කියලා. ඔව් මේ අශිෂ්ට වැඩේ කළේ මේ විධායක බලයේ ශක්තියෙන් 1983 කළු ජූලිය ඇති කළෙත් විධායක බලය පාවිච්චි කරලා. ජ.වි.පෙ. සමාජිකත්වය නැති අපිත් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ජ.වි.පෙ. වේදිකාවට ගොඩවුණා. මා මැදිහත් සියලු විද්වතුන්ට මේ වේදිකාවට ගොවන ලෙස ආරාධනා කරනවා. සමාජයක් ලෙස විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නට පෙළග ැසිය යුතුයි."

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## සැප්තැම්බර් 23
## බදු බරට, බඩු මිලට එරෙහිව කොටුව දුම්රිය පල අසලදී














# අවුරුදු 70ක 'රූකඩ සංදර්ශනය' අවසන් කරන්න අපි සූදානම්

## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා



ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම ගැන මහ ඉහළින් කතා කරන මෛත්‍රී, රනිල්, මහින්ද හෝ මින් මතුවටත් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කිසිවක් නොකරන බවත් සියලු අත්දැකීම් හමුවේ එම තුන් කට්ටුවම එකට තබා පරාජය කිරීම ජනතාවගේ වගකීම බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා රනිල්, මහින්ද, මෛත්‍රී අසාර්ථක, කුමන්ත්‍රණකාරී, නිර්ලජ්ජිත පාලකයින්ගෙන් මේ රට බේරා ගත යුතු බවත් අවුරුදු 70ක රූකඩ දේශපාලන සංදර්ශන අවසන් කිරීම සඳහා නායකත්වය දීමට ජනතා විමුක්ති පෙරමුණ සූදානම් බවත් කියා සිටියේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ 'ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ජන බලයක් ගොඩනගමු' තේමාවෙන් පසුගිය 02වැනිදා නුගේගොඩදී පැවති ජනතා රැලිය අමතමිනි. වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මෙම ව්‍යසනකාරී තත්වය ජනතාව විසින් ඉවසා සිටිය යුතු නැහැ. අපි නිවැරදි ලෙස ජනතාව අවදිකරන්න සූදානම්නම් මෙය වෙනස් කොට අපේ රට නව දිශාවකට ගෙනයාමේ සටන ජයග්‍රාහී කළ හැකියි. කම්කරු, ගොවි, ධීවර, ශිෂ්‍ය 15වැනි පිටුවට

## රටට ජනතාවට ආදරය කරන පුළුල් බලවේගයකට අපි එක් විය යුතුයි

### තිහාරි ඉබ්‍රහිම් මස්ජිදයේ ප්‍රධාන අනුශාසක මුජිබර් මුනිෆර් මවුලවිතුමා



"අපි අද මෙතන සිටින්නේ කාටවත් දිනවන්න නොවෙයි. අසරණ දුප්පත් ජනතාව ජයග්‍රහණය කරා ගෙනයන්න. ගිය සිකුරාදා වූ සිදුවීම සමග මට සිතුණා නැවත විදේශගත වෙන්න තරම් කළකිරීමක්. අපි නිදහසින් පසු අර කුණු අඹ වගේ එකක් කුණු වුණාම තවත් කුණු එකෙක් පත් කරනවා. සියලු දේ විනාශ කරලා රට අරාජික කරන්න දෙන්න බැහැ. හිටපු පාලකයන්ට හෝ වත්මන් පාලකයන්ට මේ රට ගොනගන්න අල්ප මාත්‍රයක්වත් හැකියාවක් නැහැ. ප්‍රසිද්ධ කියමනක් තියෙනවා අමන පාලකයන් ඉන්න තුරු හොඳ පාලනයක් බිහි කරන්න බැහැ කියලා. අපි 15වැනි පිටුවට

## අද රනිල්, මෛත්‍රී, මහින්ද තුන්දෙනාම ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී හමාරයි

### නීතීඥ හර්ෂණ නානායක්කාර මහතා



"මේ හොරුන්ට ව්‍යවස්ථා වැඩක් නැහැ. අපි සමහරු ව්‍යාවස්ථාවේ කොමාවේ, තිතේ එල්ලිලා දඟලනවා. අද යහපාලනය කියන වචනයටවත් මිනිස්සු කැමති නෑ. ඒක අසභ්‍ය වචනයක් වගේ වෙලා. රනිල්ලා ගෙදර යා යුතුයි. එහෙත් යැවිය යුත්තේ නීත්‍යානුකූලවයි. ඇයි දැන් පාර්ලිමේන්තුව වහලා. පාර්ලිමේන්තුව අරින්න. ඇරලා 113 බලය පෙන්වන්න. මොකද පිටිපස්සෙ දොරෙන් එන්නෙ හොරු. 2015දී අපි මේ හොරු රැළ එළෙව්වා. මෛත්‍රී මහත්තයට අමතක වුණාට අපිට මතකයි. අද වන විට රනිල්, මෛත්‍රී, මහින්ද තුන්දෙනාම ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී හමාරයි."

## සැබෑ ජනතාවාදී පාලනයක් රටට අවශ්‍යයි

### අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ සභාපතිනි ආචාරිණී සරෝජා පෝල්රාජ් මහත්මිය



"අපි අද පැමිණ සිටින්නේ හොරු වෙනුවට හොරු පත්කිරීමට කළ ඒ ක්‍රියාමාර්ගයට විරෝධය දක්වන්නයි. හොරු වෙනුවට සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී පුළුල් පාලනයක් බිහි කිරීම වෙනුවෙනුයි සතුන් ගත්තත් නායකයා සාමූහික නියෝජනයක් කරන කෙනෙක්. 62 ලක්ෂයකගේ 15වැනි පිටුවට

## අපේ අනාගතයේ පිටපත ලියන්න අපිම පටන් ගමු

### ප්‍රවීණ රංගන ශිල්පී ජගත් මනුවර්ණ මහතා



"කුම්භියෝ ටෙලි නාට්‍යයේ වගේ මේ පසුගිය සිද්ධියේ ජෙහාන් කවුද කියලා හොයාගන්නවා. 2015දී හැටදෙලක්ෂයක ජනවරමක් ලබා දුන්නේ දූෂිත පාලයකට එරෙහිවයි. නමුත් යුගයේ දැවැන්තම පාවා දීම පසුගියදා සිදුවුණා. හැටදෙලක්ෂයක ජන වරම අමු අමුවේ පාවා දුන්නා. ඉතින් 15වැනි පිටුවට

## ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීමේ එකම විභවය ලෙස මා දකින්නේ ජ.වි.පෙ.යි

### ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය දිලීප විතාරණ මහතා



"මේ සිද්ධිය අහම්බෙන් සිදුවූ හුදකලා සිද්ධියක් නොවෙයි. අවුරුදු 70ක් තිස්සේ රටේ ආණ්ඩු කළ දූෂිත ක්‍රමයේ එක් කූටප්‍රාප්තියක්. දැන් එක් ආකාරයකට ක්‍රියාකාරී දේශපාලනයට ජනතාව අදාළ නැහැ වගේ පෙනෙනවා. මේ පනින පුද්ගලයෝ නෙමෙ ප්‍රශ්නෙ. මේ පනින අය භාර ගන්න අයයි ප්‍රශ්නය. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීමේ එකම විභවය ලෙස මා දකින්නේ ජවිපෙ පමණයි."

## ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ජ.වි.පෙ. වේදිකාවට ගොඩවුණා

### කැළණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජිත් රෝහණ මහතා



"මේ පක්ෂ සියල්ල 20 වැනි සංශෝධනයට සහාය දුන්නා නම් අපිට මේ තනි පුද්ගලයෙකු යටතේ පවතින බලය අහෝසි කරගන්න පහසු වෙනවා. හැමෝම කියනවා මෛත්‍රීපාල සිරිසේන 15වැනි පිටුවට


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.